# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ දී

**එස්සීඑෆ්ආර් ඉල්ලුම්පත් අංක. 209/2007**

වාසුදේව නානායක්කාර
නීතිඥ
**49 1/1,** විනයාලංකාර මාවත
**කොළඹ 10**

**පෙත්සම්කරු**

**එදිරිව**

1. කේ. එන්. චොක්සි, පා.ම., ජනාධිපති නීතිඥ,
23/3, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත
කොළඹ 7.

සහ තවත් 30 ක්

**වගඋත්තරකරුවන්**

**ඉදිරියේදී** : **සරත් එන්. සිල්වා, අගවිනිසුරු**
**ආර්. ඒ. එන්. ජී. අමරතුංග, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු**
**ඩී. ජේ. ද බාලපටබැඳි, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු**

**පෙනී සිටින නීතිඥ** : පෙත්සම්කරු වෙනුවෙන් එම්. ඒ. සුමන්තිරන් සමඟ විරාන් කොරයා
1 වන වගඋත්තරකරු වෙනුවෙන් ජනාධිපති නීතිඥ නිහාල් ප්‍රනාන්දු සමඟ රොනල්ඩ් පෙරේරා සහ වී. කේ. චොක්සි
3 වන වගඋත්තරකරු වෙනුවෙන් ජනාධිපති නීතිඥ එල්. සී. සෙනෙවිරත්න සමඟ ඒ. පි. නයිල්ස්
10 වන වගඋත්තරකරු වෙනුවෙන් විරාජ් ප්‍රේමසිංහ

14 වන වගඋත්තරකරු වෙනුවෙන් අරවින්ද රොද්‍රිගු සමඟ හර්ෂණ ජයවර්ධන

18 සිට 21 දක්වා වන වගඋත්තරකරුවන් වෙනුවෙන් ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා සමඟ හර්ෂ අමරසේකර

8 වන, 15 වන සිට 19 වන, 26 සහ 31 වන වගඋත්තරකරුවන් වෙනුවෙන් නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් ජනාධිපති නීතිඥ වයි. ජේ. ඩබ්. විජයතිලක සමඟ විරාජ් දයාරත්න

22 වන වගඋත්තරකරු - නිහාල් අමරසේකර පෞද්ගලිකවම

<u>විවාද කළ දින</u> : 2008.3.14, 2008.3.27

<u>ලිඛිත ඉදිරිපත් කිරීම්</u> : 2008.5.12 සහ 2008.5.26

<u>තීරණය කළ දිනය</u> : 2008.07.21

<u>සරත් එන්. සිල්වා අගවිනිසුරු</u>

පෙත්සම්කරු වන වාසුදේව නානායක්කාර, ජාතික දේශපාලඥයකු සහ සමාජ සේවකයකුගේ භූමිකාව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික වී ඇති නීතියේ සමාන ආරක්ෂාව උල්ලංඝනය වී ඇති බව කියාපාමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව අනුව මහජන යහපත වෙනුවෙන් මෙම අයදුම්පත ගොනු කර ඇත. පෙත්සම්කරු විසින්, අපවාදයට ලක් කර කියාපා ඇති විධායක ක්‍රියාව, මූලික වශයෙන් අදාළ කාලයේදී රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ හිටපු සභාපති 8 වන වගඋත්තරකාර පී. බී. ජයසුන්දර (පූර්ව සහ වර්තමාන මහාභාණ්ඩාගාර ලේකම්) සහ අග්‍රාමාත්‍ය වූ 3 වන වගඋත්තරකාර රනිල් වික්‍රමසිංහ ඇතුළුව එවකට අමාත්‍ය මණ්ඩලයේ ක්‍රියාවකි. එවකට ජනාධිපතිනිය 4 වන වගඋත්තරකාර වශයෙන් කැඳවනු ලැබ ඇත. ලාභ ලබන, ණය බරින් තොරවූ, බදු ගෙවන සමාගමක් වූ, සම්පූර්ණයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත්ව තිබූ සමාගමක් වන ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් හි (LMSL) කොටස්, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් ලිමිටඩ් (JKH – 18 වන වගඋත්තරකරුට) විකිණීමේ ක්‍රියාව, අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව, විනිවිදභාවයක් නොමැතිව, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට පක්ෂපාතීව, ජයසුන්දර විසින් සිදු කර ඇති බව කියන ලදී. තවද ඔහු විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් හි ඇගයීමක්, රජයේ තක්සේරුකරුගෙන් ලබා ගෙන නොමැති බවත්, ඔහුගේ අභිමතය පරිදි පෞද්ගලික බැංකුවකින් ඇගයීමක් ලබා ගෙන ඇති බවත් කියන ලදී. විකුණුම් වර්ෂයද ඇතුලත්ව, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි වර්ෂ 4 ක ලාභය වූ රුපියල් බිලියන 2.45 සමඟ සසඳන විට, දල වශයෙන් රුපියල් බිලියන 1.2 ක් වූ විකුණුම් මිල අල්ප බවට පත්වන බවත් කියවේ. ඊට අමතරව, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් රජයට දල වශයෙන් රු. මිලියන 1.2 ක් ගෙවීම මත ලබා දුන්නේ යයි පවසමින්, එවැනි මුදලක් ගෙවා නොතිබියදී, ඉහත විකිණීම සිදු කිරීමෙන් වර්ෂ 2 ½ කට පමණ පසුව එවකට ජනාධිපතිනිය කොළඹ වරාය තුළ පිහිටි අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක ඉඩමක නීතිමය නොවන රාජ්‍ය ප්‍රදානයක් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත ලබා දී ඇතැයිද කියවේ. තවදුරටත් කියන ලද පරිදි, සමපාර්ශවීය ක්‍රියාවකදී ජෝන් කීල්ස්

හෝල්ඩිංග්ස් (JKH) විසින් ඔවුන්ගේ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ආයෝජනය සඳහා බදු වලින් නිදහස් තත්වයක්ද ආයෝජන මණ්ඩලයෙන් ලබා ගෙන ඇත. තවද අදාළ බලපවත්වන රෙගුලාසි මගින් ඇතුලත්වී ඇති ගිවිසුම ආවරණය නොකරන බැවින්, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) විසින් එම රෙගුලාසිය සංශෝධනය කරවා ගෙන, ආයෝජන මණ්ඩලය විසින් නව ගිවිසුමකට ඇතුලත් වී ඇති බවත්ය. එනයින් කියාපා ඇති පරිදි, අපවාදයට ලක් කර ඇති පෞද්ගලීකරණය එක් පැත්තකට බරවී, බදු ගෙවන රාජ්‍ය ව්‍යවසායයක් අදාළ ව්‍යාපාරයේ ඒකාධිකාරයකට හිමිකම් පෑ, බදු වලින් නිදහස් පෞද්ගලික ව්‍යවසායයකට පෙරලමින්, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණයේදී ආපසු ගමන් කිරීමක් සිදු කර ඇති බවය.

පෙත්සම්කරු තවදුරටත් 2004 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව (පී 24) කෙරෙහි විශ්වාසය තබමින් ප්‍රකාශ කර සිටින්නේ, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය එම අංශයේ වැඩිදුර ප්‍රතිසංස්කරණ අවශ්‍යාව තිබියදී ඵලය ලෙස බලාපොරොත්තු වූ අවම මිල සහ තරඟකාරීත්වය ලබා නොතිබූ බවය. 2005 මැයි මස කොළඹ ඉහළ ‘ඉන්ධන සැපයුම් මිල‘ පිළිබඳව පැමිණිලි කරමින් ‘පෝෂක මෙහෙයවන්නන්‘ විසින් පල කරන ලද දැන්වීමකද එම අදහස පල කොට තිබුණි. (පී2)

පසු කලකදී පර්ක් සභාපතිගේ අනුප්‍රාප්තිකයා වූ 22 වන වගඋත්තරකරු වන නිහාල් අමරසේකර විසින්ද පෙත්සම්කරුට ක්‍රියාකාරී ලෙස සහයෝගය ලබා දී තිබුණි. අමරසේකරගේ සොයා බැලීම නොතිබෙන්නට, මෙම නඩුවෙහි ඉදිරිපත් කර ඇති ලේඛන මිටි ගණන් ඉදිරිපත් නොවනු ඇත. මෙම අධිකරණය විසින් සිද්ධීන්හි අනුපිළිවෙල, අදාළ ලේඛන සහ ඒවායින් සිදු කල හැකි අනුමානයන් මත පමණක් යොමුවන බැවින්, අපවාදයට ලක් කල ගනුදෙනුව පිළිබඳ ඔහු විසින් සිදු කර ඇති විෂම ප්‍රකාශයන් මම මෙහි සඳහන් නොකරමි.

පෙත්සම්කරුට 32 වන, 33 වන සහ 34 වන වගඋත්තරකරුවන් වශයෙන් පසුව එකතු කරන ලද මැදිහත් පෙත්සම්කරුවන් 3 දෙනෙකුගේ සහාය ලැබී ඇත. 32 වන වගඋත්තරකරු වන සීමාසහිත ශ්‍රී ලංකා නැව් සංස්ථා සමාගම (SLSCC) ඇමරිකා එක්සත් ජනපදයේ කෙමොයිල් කෝපරේෂන් සමඟ සහයෝගීත්වයෙන් යුතුව ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් සඳහා ලංසු ඉදිරිපත් කර ඇත. ඔවුන් ප්‍රකාශ කරන ලද පරිදි, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි මුල් ලංසුව ඇමරිකා එක්සත් ජනපදයේ චෙව්රොන් කෝපරේෂන්ට අයත් ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM) සමඟ සහයෝගීත්වයෙන් යුතුව සිදු කර ඇත. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හට කෙටි ලැයිස්තුගත කිරීමට අවශ්‍ය පර්යන්තය වූ ලකුණු 70 ට ඉහළින් ලබා ගත හැකි වූයේ ඉන්ධන සැපයීමේ වෙළඳපොල මූලිකයෙක් වූ ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM) ගේ විශ්වාසනීයත්වය මත රැඳීමෙන් පමණි. මූලික පර්යන්තය පසු කිරීමෙන් පසුව ඉදිරියට ලංසු තැබීමේදී, ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM) සහ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) සහයෝගීතාවයෙන් කටයුතු නොකරන බව තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත දන්වන ලද අතර, එසේ තිබියදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සාවද්‍ය ලෙස ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි අනන්‍ය ලංසුවක් වශයෙන් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි ලංසුව පිළිබඳව අඛණ්ඩව එහි මූල්‍ය හැකියාවන් සහ ව්‍යාපාරික ක්‍රමෝපායයන් මත කටයුතු කර ඇති බව කියන ලදී. ‘ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM)‘ හි ඉවත්වීම හා සමඟම කමිටුව විසින් ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM) විශ්වාසනීයත්වය මත ආරෝපණය කරන ලද ලකුණු කපා දමා ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) කෙටි ලැයිස්තුවෙන් ඉවත් කල යුතුව තිබුණි.

පෙත්සම්කරු සහ 22 වන, 32 වන, 33 වන සහ 34 වන වගඋත්තරකරුවන් තවදුරටත් කියන ලද්දේ, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි ලංසුව පිළිගත් පසුව පොදු භාවිතා කිරීමේ පහසුකම් ගිවිසුමේ (CUF) කෙටුම්පත ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි නියමය මත ජයසුන්දර විසින් සංශෝධනය කර, රජය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් සියලුම ඉන්ධන සැපයුම් වලට පොදු භාවිතා කිරීමේ පහසුකම් භාවිතා කර සැපයීම් සිදු කරන බවට සහතික වන බවට ප්‍රතිපාදන ඇතුලත් නව වගන්තියක් 8.2 වශයෙන් ඇතුලත් කරන ලද බවය. මෙම වගන්තියේ ප්‍රයෝග කොටස වන්නේ,

පෞද්ගලීකරණය කරන ලද ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි දේපල වලට ඇතුලත් ගබඩා ටැංකි වලට පොදු භාවිතා කිරීමේ පහසුකම සම්බන්ධ කර ඇති හෙයින්, එකතු කරන ලද වගන්තිය මගින් විකල්ප ඉන්ධන සැපයුමක් සාර්ථක ලෙස වලක්වා, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හට දැනට හිමිව තිබෙන ඒකාධිකාරයක් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත ලබා දී ඇති බවය. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් මිලදී ගැනීම සඳහා වූ ඔවුන්ගේ ලංසුව ප්‍රතික්ෂේප කල පසුව, 32 වන වගඋත්තරකරු විසින් 2002 අංක 33 දරණ පෙට්‍රෝලියම් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තිය යටතේ ඉන්ධන සැපයීම ඇතුළුව පෙට්‍රෝලියම් බෙදා හැරීම සඳහා බලපත්‍රයක් ලබා ගන්නා ලදී. එම බලපත්‍රය මත වගඋත්තරකරුවන් නැව් සහ ප්‍රධාන ඉන්ධන සැපයුම් භාවිතා කරමින් වෙරළෙන් ඔබ්බෙහි පෙට්‍රෝලියම් සැපයීමේ මෙහෙයුම් ආරම්භ කරන ලදී. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට අයත් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) එකී 8.2 වගන්තියේ විධිවිධාන අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙම මෙහෙයුම් කිරීම වැළැක්වීමට කටයුතු කරන ලදී. නඩු කීම වාර ගණනාවක් සිදු වූ අතර, අවසානයේ අභියාචනා අධිකරණය 2002 අංක 33 පනතේ ප්‍රතිපාදන අනුව අසංගත බවට සළකා, එම 8.2 වගන්තිය කපා හරින ලදී.

එනයින් පෙනී යන්නේ පෙත්සම්කරු සහ ඉහත සඳහන් වගඋත්තරකරුවන් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි වාසියට ඒකාබද්ධ කර ලංසුව පිළිගැනීම ඇතුළු ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය කිරීමේ සෑම පියවරක්ම විසංවාදයට ලක් කර ඇති බවයි. ප්‍රධාන චෝදනාව වූයේ පර්ක් හි සභාපති පී. බී. ජයසුන්දර සහ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි අධ්‍යක්ෂ එස්. රත්නායක (20 වන වගඋත්තරකාර) විසින් ඉතා සමීප ලෙස ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට සාවද්‍ය ප්‍රතිලාභ ලබා දීමට ක්‍රියාකර ඇති බවයි. සංක්ෂිප්ත වශයෙන්, පෙත්සම්කරු සහ 22 වන, 32 වන, 33 වන සහ 34 වන වගඋත්තරකරුවන් විසින් එම කරුණු පිළිබඳවම විභාග කල පාර්ලිමේන්තු රාජ්‍ය ව්‍යවසායක කමිටුව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල පහත දැක්වෙන නිගමනයන් සම්මත කරමින් උප යොදවා ඇත.

> "මෙම ගනුදෙනුව, වැරදි ගණනාවක් සහිතව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියක් නොමැතිව ක්‍රියාත්මක වී ඇති ප්‍රශ්නකාරී පටලැවිල්ලක් විදහා දක්වමින්, අශෝභන ලෙස රජයට අලාභ සහ සන්තාපකාරී වන පරිදි සිදු කර ඇති අතර, එබැවින් එය මුල පටන්ම නීතිය අනුව ශුන්‍ය සහ බල රහිත වේ."
>
> (2007.1.12 දිනැති හැන්සාඩ් වාර්තාව - පිටු අංක 35 බලන්න.)

මා විසින් පාර්ලිමේන්තුවට වාර්තා කර ඇති පරිදි, කමිටුවේ නිගමනයන් උපුටා දැක්වූවද, මා ඍජුවම ප්‍රකාශ කල යුතුව ඇත්තේ අධිකරණය ඉදිරියේ විභාග වන විමර්ශනයන්ගේ දෘෂ්ටිකෝණය එයට වඩා වෙනස් වන බවය. අප බල පවත්නා නීතිය පිළිබඳව අවධානය යොමු කර, අභියෝගයට ලක් කර ඇති විධායක ක්‍රියාව සමපාර්ශවීය අරමුණක් වෙනුවෙන් සහ නීතියේ අරමුණ ශුන්‍ය කර අභ්‍යාස කිරීමක් දැයි යන්න සහ එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව යටතේ වූ පෙත්සම්කරුට සහ මහජනතාවට නීතිය යටතේ පවත්නා සමාන ආරක්ෂාව අහිමි වී ඇත්දැයි සොයා ගත යුතුය. එම දෘෂ්ටිකෝණයෙන් මූලික යොමු ගත වීම 1996 අංක 1 දරණ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම පනත කෙරෙහි වන අතර, ඒ අනුව මෙම අභියෝගයට ලක් කර ඇති විධායක ක්‍රියාව ගනු ලැබ ඇත්තේ එවකට එහි සභාපති ජයසුන්දර විසිනි.

## අ. 1996 අංක 1 දරණ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

වඩාත් හොඳින් පර්ක් (PERC) යන කෙටි යෙදුමෙන් හඳුන්වනු ලබන මෙම පනත, රජයට අයත් ඉන් පාලනය වූ මධ්‍යගතව දිවෙන ආර්ථිකයක සිට පෞද්ගලික හිමිකම් දරණ වෙළඳපොල මගින් දිවෙන ආර්ථිකයක් දක්වා වූ රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති ප්‍රගමනයේ දියබස්නාවක් සළකුණු කරයි. මෙම ක්‍රියාවලි ප්‍රේක්ෂාවලියේ එක් කෙළවරක ලක්ෂණය නිරූපණය වී ඇත්තේ, විශේෂිත වශයෙන් 1956 වර්ෂයට පසු කාලය තුල පෘථුල ජාතිය සතු කිරීමේ වැඩසටහන සහ විශාල ප්‍රමාණයේ රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්හි රාජ්‍ය අයිතිය සහ / හෝ පාලනය පැවරුමෙන් ඉවත් කිරීම පිළිබඳවය. මෙම ක්‍රියාවලියෙන් එක් කෙළවරක ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීම සහ ස්ථාවර මිලක් ලබා දීම සඳහා වූ අතර, අනෙක් කෙළවරේ වෙළඳපොල උද්‍යෝගීභාවය සහ තරඟකාරීත්වය පදනම් කර මහජනතාවට හොඳම නිපැයුම අවම මිලකට ලබා දීමට බලාපොරොත්තු වීම විය. මෙම ක්‍රියාවලියේ දෙකෙළවරින්ම අදහස් කළේ මහජනතාවට ප්‍රතිලාභ සැළසීමය. එසේ හෙයින් මෙම නීතිය නිසිසේ ක්‍රියාවේ යෙදවීම මගින් ඇතිවන මහජන යහපත සහ එම මහජන යහපත සුරැකීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 (1) ව්‍යවස්ථාව අනුව, මෙම අධිකරණයේ අධිකරණ බලය අයැදීම සඳහා වූ පෙත්සම්කරුගේ නීත්‍යානුකූල තත්වය විසංවාදයට ලක් කරමින් වගඋත්තරකරුවන් නගා ඇති විරෝධතා අවසංකල්පනය වී ඇති බැවින් සහ දූරදක්ෂී නොවන බැවින්, මම එම විරෝධතා ප්‍රතික්ෂේප කරමි.

අලාභ ලබමින් තිබූ ව්‍යවසායයන් පිළිබඳව මුලදී තත් කාර්ය පදනමක් මත කරන ලද රාජ්‍ය අයිතිය පැවරුමෙන් ඉවත් කිරීම සඳහා වූ ක්‍රියාවලිය, 1995.3.1 දින ජනාධිපතිනිය විසින් පිහිටුවන ලද විශේෂ කාර්ය සාධන බලකාය විසින් අර්ථානුරූපී ලෙස විස්තර කරමින් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන ලෙස නම් කර විධිමත් කරන ලදී. වඩාත් අවශ්‍ය වූ නෛතික පැතිකඩක් ලබා දීම සඳහා මෙම ප්‍රතිසංස්කරණ වැඩසටහන තව දුරටත් වැඩි දියුණු කරන ලද්දේ, පාර්ලිමේන්තුව විසින් ඉහත සඳහන් කර ඇති 1996 අංක 1 දරණ පනත පනවමින් 'පර්ක්' කොමිසම ස්ථාපිත කිරීමෙනි. එමගින්, විධායක අභිමතය මත රැඳී පැවතුන රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය, නීතියෙන් හසුරුවනු ලබන ක්‍රියාවලියක් වී තදින් නීතිමය වශයෙන් කටයුතු කල යුතු වූ විෂයක් බවට පත් විය. පනතේ 4 වන වගන්තිය යටතේ තරමක් ඍජුව සහ සාධාරණව දක්වා ඇති 'පර්ක්' හි කාර්යයන් සහ අරමුණු පහත පරිදි වේ.

> *"කොමිසමේ කාර්යභාරය වනුයේ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීමේදී පහත දැක්වෙන අරමුණු ඉටු කර ගැනීම සඳහා රජයට උපදෙස් දීම සහ සහාය දැක්වීමය."*
>
> *(අ) රටෙහි ආර්ථික සංවර්ධනය පෝෂණය කරවීම සහ සංවර්ධනය වේගවත් කරවීම;*
>
> *(ආ) ආර්ථිකයෙහි කාර්යක්ෂමතාවය සහ තරඟකාරීත්වය වර්ධනය කිරීම;*
>
> *(ඇ) නව තාක්ෂණය සහ විශේෂඥතාවයන් අත්පත් කර ගැනීම මගින් තරඟකාරී පදනමක් මත ජාත්‍යන්තර වෙළඳපොලට ප්‍රවේශ වීම සහිතව නිෂ්පාදනය සහ සේවා ඉහළ දැමීම;*
>
> *(ඈ) ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය කිරීම, පුළුල් පදනමක් ඇති කිරීම සහ දීර්ඝ කාලීන පෞද්ගලික ඉතිරි කිරීම් ඒක රාශි කිරීම;*
>
> *(ඉ) පෞද්ගලික අංශය අභිප්‍රේරණය කිරීම;*
>
> *(ඊ) සමාජ න්‍යාය පත්‍රයට වඩාත් හොඳින් යොමුවීමේ හැකියාව ලබා දීම සඳහා රජයේ ආදායම් වර්ධනය කිරීම; (අවධාරණය කර ඇත.)*

මෙම ප්‍රතිපාදන වලින් ප්‍රත්‍යක්ෂ වන්නේ 'පර්ක්' හි භූමිකාව සීමාසහිත වන බවත්, රජයේ හිමිකාරිත්වය පැවරුමෙන් ඉවත් කිරීම ඇතුළුව බලාපොරොත්තු වන රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීමේදී රජයට උපදෙස් දීම සහ සහාය වීම සඳහා එයට නීතිය මගින් සීමා කිරීම් සිදු කර ඇති බවත්ය. පාලනය කරනු

ලබන විධිවිධාන අනුව උපදෙස් දීම සහ සහාය වීම 4 වන වගන්තිය මගින් ප්‍රකාශ කර ඇති බැවින්, එයින් අත්‍යාවශයෙන්ම ඉන්පසුව වැටහී යන්නේ පැවරුමෙන් ඉවත් කිරීම ඇතුළුව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීම 'පර්ක්' හි උපදෙස් සහ සහාය නොමැතිව රජයට කල නොහැකි බවය.

එම වගන්තියේ සටහන් කර ගත යුතු තවත් ලක්ෂණයක් නම්, 'පර්ක්' හි සියලුම අරමුණු මූලික වශයෙන් මහජනතාවට යහපතක් ඇති කරලීම අදහස් කර ඇති බවය. 5.1 වගන්තියෙන් 'පර්ක්' වෙත පැවරී ඇති පහත දැක්වෙන විශේෂිත රාජකාරියෙන් තවදුරටත් මෙම ක්‍රියාවලියේ මහජන මූල්‍ය වැඩි දියුණු වේ.

> "රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීමේදී ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳව මහජන කැපවීම සංවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන්, එම රජයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳව මහජනයා තුළ දැනුවත්භාවය ඇති කිරීම සඳහා රජයට සහාය වීම."

පැවරුමෙන් ඉවත් කිරීම ඇතුළුව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීම කිසිම විටෙක අඳුරු සහ ලිස්සා යන සුළු තත්වයකට පහත වැටිය නොහැකිය. නීතිය මගින් විධි නියෝග කර ඇත්තේ, එහි නීත්‍යානුකූලභාවය සහ අයිතිය සහතික වීම සඳහා මහජන උනන්දුවක ආවරණයක් සහිත විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් විය යුතු බවය. මහජන උනන්දුවට අදාළ වූ නඩුවක්ය යන්න සහ පෙත්සම්කරුගේ නීත්‍යානුකූල තත්වයට අදාළව ගෙන ඇති විරෝධතාවය මම ප්‍රතික්ෂේප කරන්නේ මෙම පදනම මතය. මෙම විරෝධතාවය ආර්ථික ක්‍රියාමාලාවක පුළුල් තිරයක් මත අපවාදයට ලක්ව ඇති ගනුදෙනුවේ වැදගත් බව නොසලකා හැර ඇතිවා පමණක් නොව, ඉහත දක්වා ඇති නීතියේ වැදගත් ලක්ෂණයන්ද නොසලකා හැර ඇත.

මම දැන් අපවාදයට ලක්ව ඇති පොදුවේ ඉන්ධන සැපයීම යනුවෙන් හඳුන්වනු ලබන ගනුදෙනුවට අදාළ ප්‍රතිසංස්කරණය පිළිබඳව විභාග කිරීමට යොමු වෙමි.

## ආ. <u>ඉන්ධන සැපයීමේ සීමා ලිහිල් කිරීම</u>

නැංගුරම් දැමූ හෝ වෙරළෙන් ඔබ්බෙහි වරායේ නවතා ඇති නැව් වලට සමුද්‍ර පෙට්‍රෝලියම් ඉන්ධන සැපයීමේ සේවාව පොදුවේ ඉන්ධන සැපයීම යනුවෙනු හඳුන්වනු ලබන නැව් ගමනාගමනයට අදාළ මෙහෙයුමකි. සිංගප්පූරුව වැනි මධ්‍යගතව පිහිටි වරායයන්, ඔවුන්ගේ ඉන්ධන සැපයීමේ ධාරිතාවය වැඩි කර, අති විශාල පරිමාණයේ විදේශ විනිමය ආදායම් ජනනය කර ගෙන ඇත. කොළඹ වරාය ප්‍රධාන පෙළේ පෙර අපර දිග නෞකා මාර්ග වලට සමීපව ඇති එහි අද්විතීය සහ වාසි සහගත භූගෝලීය පිහිටීමක තිබියදී, මෙහි ඇති අති විශාල වාසියෙන් ඵල ලබා ගැනීමට අපොහොසත්ව ඇත. එය වැළැක්වීමට හේතු වූ ප්‍රධාන කරුණක් වශයෙන් දක්වා ඇත්තේ, 1961 අංක 28 දරණ පනතින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉන්ධන සැපයුම් කිරීම ඇතුළුව සම්පූර්ණයෙන් ඛනිජ තෙල් වෙළඳාම් සහ කර්මාන්ත අංශයේ ලබා දී ඇති ඒකාධිකාරයයි. මෙය ඉහත දක්වා ඇති පරිදි 1956 ට පසු කාල වකවානුවේදී ජාතිය සතු කිරීමේ ක්‍රියාවලියේ එක් අංගයක් විය. ඉන්ධන සැපයුම් සිදු කරන ලද්දේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සම්පූර්ණයෙන්ම අයත්ව තිබූ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් මගින් එයට අයත්ව තිබූ ගබඩා කිරීමේ ටැංකි 12 කින් සහ ඩොල්ෆින් නැංගුරම්පොල සහ දකුණු ජැටිය එකිනෙකට සම්බන්ධ කල නල ජාලයක් භාවිතා කරමිනි. මෙම සැපයුම් ජාලය පසුව පොදු භාවිතාකරන්නන්ගේ පහසුකම (CUF) යනුවෙන් හඳුන්වනු ලැබූ අතර, එය කොළඹ වරාය පරිශ්‍රය තුළ පිහිටා ඇත.

ඉන්ධන සැපයුම් කිරීමේ සීමා ලිහිල් කිරීම සඳහා වූ සම්පූර්ණ ක්‍රියා පිළිවෙල නාවික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් 2000.5.24 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඇතුලත් වේ. එමගින් කොළඹ ඉන්ධන සැපයුම් කිරීමේ ඉතා ඉහළ මිල සහ සීමාසහිත සැපයුම පිළිබඳව දක්වමින්, පෞද්ගලික

අංශය විසින් ආයෝජනය කරමින් ඉන්ධන සැපයුම් සේවා සැපයීම සඳහා උනන්දු කරවන ලෙසට නිර්දේශ කර ඇත. මෙම අමාත්‍ය මණ්ඩල සංදේශයේ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් විකිණීම පිළිබඳව කිසිදු සඳහනක් සිදු කර නොමැත.

අමාත්‍ය මණ්ඩලය විසින් මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය 2000.6.22 දින වෙනත් අමාත්‍යවරුන් කිහිප දෙනෙකු විසින් සිදු කරන ලද නිරීක්ෂණ සමඟ සළකා බලා, ඒ මත මෙම කරුණ සම්බන්ධයෙන් වාර්තා කිරීම සඳහා නිලධාරි කමිටුවකට යොමු කිරීමට තීරණය කරන ලදී. මෙම නිලධාරි කමිටුව මුදල්, වාරි මාර්ග සහ බල ශක්ති අමාත්‍යාංශ සහ පර්ක් හි ලේකම්වරුන්ගෙන් සමන්විත විය. 2000.8.1 දිනැති මෙම කමිටු වාර්තාව එම දිනයම දරණ නාවික කටයුතු සම්බන්ධ අමාත්‍යවරයාගේ අමාත්‍ය මණ්ඩල සංදේශයක් සමඟ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

කමිටු නිලධාරීන්ගේ නිර්දේශයන් පහත සඳහන් පරිදි වේ.

*"(අ) ඉන්ධන සැපයුම් අංශය ලිහිල් කර, සීමාසහිත පාර්ශවයන් කිහිපයකට කොළඹ වරාය හැර ශ්‍රී ලංකාවේ වරායන් සහ ශ්‍රී ලාංකීය දේශීය සමුද්‍ර තීරයේ ඉන්ධන සැපයුම් සේවා මෙහෙය වීම සඳහාත්;*

*(ආ) ඉහත 3 වන වගන්තියේ දක්වා ඇති පරිදි, විවෘත ටෙන්ඩර් ක්‍රියාවලියක් මගින් දේශීය සම කොටස් සහභාගිත්වය සහිතව අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍ය හැකියාව සහ ඉන්ධන සැපයීමේ පලපුරුද්ද සහිත ආයෝජකයින්ගෙන් සමුද්‍ර ඉන්ධන ආනයනය කිරීම සහ අලෙවි කිරීම සඳහා ඉල්ලුම් පත් කැඳවීමට පවතින හැකියාව පිළිබඳ පර්ක් විසින් සොයා බැලීම;*

*(ඇ) ශ්‍රී ලංකා රජය විසින් තෝරා ගනු ලබන මෙහෙයවන්නන්ගෙන් ශ්‍රී ලංකා දේශීය සමුද්‍ර තීරයේ ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු කිරීම වෙනුවෙන් බලපත්‍ර ගාස්තුවක් අය කිරීම;*

*(ඈ) 1971 අංක 52 දරණ වෙළඳ නාවික කටයුතු පනත අනුව, නාවික කටයුතු අංශයට ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍ර තීරය ඇතුලත ඉන්ධන සැපයුම් ක්‍රියාකාරකම් නියාමනය කිරීමට සහ නිරීක්ෂණය කිරීමට බලය පැවරීම;*

*(ඉ) ඒ අනුව 'පර්ක්' විසින් ආරම්භක පියවර සිදු කිරීම සහ අනුගමනය කල යුතු ක්‍රියා පිළිවෙල පිළිබඳව අමාත්‍ය මණ්ඩලයට නිර්දේශයන් සිදු කිරීම."*

මෙහිදී සටහන් කර ගත යුතුව ඇත්තේ, කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ ඇත්තේ වරාය ඇතුලත ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ඒකාධිකාරය ආරක්ෂා කර ගැනීම සඳහා පරීක්ෂාකාරී අවතීර්ණ වීමක් සඳහාත්, කොළඹ වරායෙන් පිටත ඉන්ධන සැපයීම සඳහා බලපත්‍ර 3 ක් නිකුත් කිරීමෙන් එම අංශය ලිහිල් කිරීමටත්ය. මෙම ක්‍රියාවලිය පිළිබඳව 'පර්ක්' විසින් නිර්දේශයන් කල යුතුව තිබුණි. 'පර්ක්' හි අධ්‍යක්ෂ ඇතුලත් කමිටුව විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් විකිණීම නිර්දේශ නොකල බව කැපී පෙනෙන සිද්ධියකි.

නාවික කටයුතු අමාත්‍යවරයා 2002.8.1 දිනැති තම අමාත්‍ය මණ්ඩල සංදේශයේ නිරීක්ෂණයන් දෙකකට යටත්ව නිලධාරි කමිටුවේ නිර්දේශයන් වලට එකඟ විය. එනම්:

"මෙම පසුබිම හමුවේ කමිටු වාර්තාව සම්බන්ධ පහත දැක්වෙන නිරීක්ෂණයන් අමාත්‍ය මණ්ඩලයේ සැලකිල්ල සඳහා මම ඉදිරිපත් කරමි.

1. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත ලබා දී ඇති ඒකාධිකාරය එක් වර්ෂයකට සීමා කල යුතු අතර, එම කාලය තුලදී ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය කිරීම සම්පූර්ණ කල යුතුය.

2. ශ්‍රී ලංකාවේ ඉන්ධන සැපයීමේ අංශයේ වෙළදාමට ඇතුළු වන නවකයින්හට කොළඹ වරාය ආසන්නතම ප්‍රදේශය ඇතුලත්ව ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍ර තීරය ඇතුලත ඉන්ධන සැපයීම් විකිණීමට අවස්ථාව සළසා දිය යුතුය.

මා දක්වා ඇති නිරීක්ෂණයන්ට යටත්ව, කමිටු නිලධාරීන්ගේ නිර්දේශයන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පතමි. "

අමාත්‍ය මණ්ඩලය විසින් 2000.8.1 දින එම කරුණ සළකා බලා අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් යෝජනා වලට අනුමැතිය ලබා දුන් අතර, නාවික කටයුතු අමාත්‍යවරයාට ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට උපදෙස් ලබා දෙමින් නියම කරන ලදී.

එනයින් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉන්ධන සැපයුම් අංශය ප්‍රතිසංස්කරණය කිරීම පියවර කිහිපයකින් සමන්විත සැලසුමකි. ආරම්භක පියවර ලෙස 'පර්ක්' විසින් කොළඹ වරායෙන් පිටත ඉන්ධන සැපයීම සිදු කිරීම සඳහා අර්පනය කිරීමට සහ සැපයුම්කරුවන් 3 දෙනෙකුට බලපත්‍ර ප්‍රදානය කිරීම සිදුවේ. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය කිරීම සම්පූර්ණ කල යුතු වන වර්ෂ එකක කාලය ඇතුලත කොළඹ වරාය තුළ ඉන්ධන සැපයීමේ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ඒකාධිකාරය නොකඩවා පවත්වා ගැනීම සිදු කෙරේ. මෙම තරඟකාරී ක්‍රියාවලියෙන් ජාත්‍යන්තර ආරක්ෂක සහ පාරිසරික ප්‍රමිති වලට අනුකූලව එම අංශයට අවශ්‍ය වූ විශේෂඥතාවය ලැබේ යයි අපේක්ෂා කරන ලද අතර, අවසානයේදී ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය කිරීම සම්පූර්ණ වූ පසුව සම්පූර්ණ අංශයම ලිහිල් බවට පත් වනු ඇත. ශ්‍රී ලංකා රජයට එයින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව නිලධාරි කමිටු නිර්දේශයන් 3(ඩී) ඡේදයේ දක්වා ඇති අතර, එහි පහත සඳහන් පරිදි කියවේ.

"මෙමගින් ශ්‍රී ලංකා රජයට ලැබෙන ප්‍රතිලාභ වශයෙන් අපේක්ෂා කරන්නේ දේශීය සමාගම් වලින් ඉහළ ආදායම් බදු අයකර ගැනීම මගින් බදු ආදායම වර්ධනය කර ගැනීමටත්, සහ රැකියා අවස්ථාවන් ජනනය කිරීමටත්ය. එයට අමතරව ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍ර තීරය භාවිතා කිරීම වෙනුවෙන් බලපත්‍ර ගාස්තුවක් අය කරනු ඇත."

ඇ. <u>උද්දේසිත ලෙස නිලධාරී කමිටුවේ නිර්දේශයන් මත සහ අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති පරිදි අමාත්‍යවරයාගේ නිරීක්ෂණයන් පදනම් කර ගනිමින් ජයසුන්දර විසින් සභාපතිත්වය දැරූ 'පර්ක්' විසින් සිදු කරනු ලැබූ ක්‍රියාවන්</u>

පෙත්සම්කරු විසින් තම නඩුවෙහි ඉදිරියෙන්ම තබා ඇත්තේ 'පර්ක්' විසින් කරනු ලබන ඕනෑම ක්‍රියාවක් ඉහත දැක්වෙන පරිදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව කමිටුවේ නිර්දේශ සහ අමාත්‍යවරයාගේ නිරීක්ෂණ වල සාරනිර්දේශය ඇතුලත පමණ කල යුතුව තිබුණු බවය. ජයසුන්දර විසින් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 8 වන ඡේදයේ මෙම ලේඛන වල සහ අමාත්‍ය මණ්ඩල තීරණයේ අන්තර්ගතය පිළිගනු ලැබ

ඇත. එබැවින් ඔහු විසින් 'පර්ක්' හි කාර්යය ලෙස පහත දැක්වෙන අනු පිළිවෙල අනුව ක්‍රියාවලි 3 පිළිබඳව අමාත්‍ය මණ්ඩලයට නිර්දේශයන් කිරීම පිළිබඳව සම්පූර්ණ වශයෙන් හොඳින් දැන සිටියේ යයි අප විසින් උපකල්පනය කල යුතු වේ.

(i) ආරම්භක පියවර ලෙස, කොළඹ වරාය හැර දේශීය සමුද්‍ර තීරය ඇතුලත ඉන්ධන සැපයීම සඳහා බලපත්‍ර 3 ක් නිකුත් කිරීමට විවෘත ටෙන්ඩරයක් මගින් ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලිය

(ii) පෞද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලිය සහ ඉහත (i) න් අපේක්ෂිත පරිදි, අඩ වශයෙන් සීමා ලිහිල් කල ආධිපත්‍යය මෙහෙයවා ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) ට ලබා දී ඇති ඒකාධිකාරය වර්ෂ එකක කාලය ඇතුලත ඉවත් කිරීම

(iii) ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය කිරීමෙන් පසුව ඉහත (ii) න් බලාපොරොත්තුව ඇති පරිදි ඉන්ධන සැපයීමේ සේවාවල සම්පූර්ණ වශයෙන් සීමා ලිහිල් කල ආධිපත්‍යය මෙහෙයවීම

නිසැකවම, වැඩි දියුණු වූ ඉන්ධන සැපයුම් සේවා ආධිපත්‍යයක් ලබා දී, නාවුක අංශයේ වර්ධනයක් ඇතිවීමට සහ ඉහළ විදේශ විනිමය ඉපයීමක් සහ වැඩි බදු ආදායම් ඵලයක් ලබා ගැනීමට තුඩු දිය හැකි ඉහත දක්වා ඇති, නුවණින් සැළකිය යුතු වූ කරුණු පිළිබඳව 'පර්ක්' විසින් අමාත්‍ය මණ්ඩලයට කිසිදු නිර්දේශයක් සිදු කර නොමැත.

ඉහත සඳහන් කර ඇති අමාත්‍ය මණ්ඩල තීරණයේ වෙනස්වීමක්ද සිදුව නොමැත. ඒ වෙනුවට, එකී අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව කටයුතු කරන බව අඟවමින්, 'පර්ක්' විසින් එය මගින්ම සොයා ගත් මාර්ගයක් අනුව වන ක්‍රියා පිළිවෙතක් අනුගමනය කර ඇති අතර, මම එය දැන් විමර්ශනයට ලක් කරමි.

2001.10.28 දින 'පර්ක්' විසින් පෞද්ගලික අංශයේ මෙහෙයුම්කරුවන්හට වරායද ඇතුළුව දේශීය සමුද්‍ර තීරයෙහි ශ්‍රී ලංකාවේ සමුද්‍ර ඉන්ධන වෙළඳපොලට සහභාගී වීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙසට ආරාධනා කරමින්, දැන්වීමක් පල කරන ලදී. නිකුත් කරනු ලබන බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳව සීමාවක් නොතිබූ බව මෙම දැන්වීමෙහිද සඳහන් කර තිබුණි. මෙම දැන්වීම අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනි බැවින්, ඒ පිළිබඳව මම මෙහි කෙටි සටහනක් තැබිය යුතුය. මූලික වශයෙන් බලපත්‍ර තුනක් පමණක් නිකුත් කල යුතු බවත්, සහ පළමුවන වර්ෂයේ සේවා සැපයිය හැක්කේ කොළඹ වරායෙන් පිටතදී පමණක් බවත් නිලධාරි කමිටුව නිර්දේශ කර තිබුණි.

වඩාත් සැළකිය යුතු ලෙස, බලපත්‍ර නිකුත් කිරීම සඳහා පෙත්සම්කරු විසින් පෙත්සමේ 6 වන ඡේදයෙහි අයැද ඇති නව නීතිමය ආධිපත්‍යයක් අවශ්‍ය බව 2002 හි අංක 33 දරණ ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතේ ඇතුලත්ව ඇත. මෙම සම්ප්‍රකාශය ජයසුන්දර විසින් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 5 වන ඡේදය මගින් පිළිගනු ලැබ ඇත. 2002 හි අංක 33 දරණ පනත පාර්ලිමේන්තුවේදී සම්මත කරනු ලැබ කථානායක විසින් 2002.12.17 වන දිනදී සහතික කරනු ලැබ ඇත. එබැවින් යෝජනා ගෙන්වීම සඳහා නීතියට වර්ෂයකට පෙර සිට දැන්වීම් කිරීම නිශ්ඵලභාවය නිරූපණය කරන්නක් විය. 'පර්ක්' විසින් ඒවා විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයට යොමු කිරීම හැර, ඉහත සඳහන් දැන්වීමට ආනුශාංගික වශයෙන් ලද යෝජනා පිළිබඳව එයට අනුව ක්‍රියා කර නොමැති බව පෙනී යයි. කොළඹ වරායෙන් පිටතදී ඉන්ධන සැපයුම් සේවා සැපයීමේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ආරම්භයේදී බලපත්‍ර තුනක් නිකුත් කල යුතුය යන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අවශ්‍ය වූ ක්‍රියාවලියට ජයසුන්දර විසින් අවශ්‍ය පරිදි නිර්දේශයක් සිදු කර නොමැත.

ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් 90% ක් මිලදී ගැනීම සඳහා උනන්දුව දැක්වීමේ ප්‍රකාශ කැඳවමින් 'පර්ක්' විසින් 2002.2.8 දින තවත් දැන්වීමක් පල කරන ලදී. උනන්දුව දැක්වීමේ ප්‍රකාශ 2002.2.21 දින හෝ ඊට පෙර ඉදිරිපත් කල යුතුව තිබුණි. එම දැන්වීම පල කරන ලද්දේ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් බව දැන්වීමේ සඳහන් කර තිබුණි. ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍ය මණ්ඩලය එවැනි උනන්දුව දැක්වීමේ ප්‍රකාශ කැඳවීමට 'පර්ක්' වෙත අනුමැතිය ලබා දී නොතිබුණු බව සටහන් කර ගත යුතුය. නිලධාරී කමිටුවේ ('පර්ක්' හි අධ්‍යක්ෂ ඇතුළු) යෝජනාව වූයේ ඉන්ධන සැපයුම් සේවා සැපයීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් 'පර්ක්' විසින් නිර්දේශයන් කල යුතු බවය. අමාත්‍යවරයාගේ නිරීක්ෂණය වූයේ නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා විධිවිධාන අනුව අඩ වශයෙන් සීමා ලිහිල් කල ඉන්ධන සැපයුම් සේවා සැපයීමේ මෙහෙයුම් ක්‍රියාවට නැංවීමෙන් වර්ෂ 1 ක් ඇතුලත ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය සම්පූර්ණ කල යුතු බවය. කලින් කොටසෙහි වචනයක් පාසා මවිසින් උපුටා දක්වන ලද අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ගැන 'පර්ක්' හි පාර්ශවයෙන් ගෙන ඇති කිසිම ක්‍රියාවක සඳහනක් නොමැති වීම සැළකිය යුතු කරුණකි. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලිය, පෞද්ගලික මෙහෙයුම්කරුවන්ට කොළඹ වරායෙන් පිටත ඉන්ධන සැපයීම සඳහා බලපත්‍ර දීමේ යෝජනා ක්‍රමය සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීමෙන් පසුව විය යුතුය යන සාධාරණ හේතුව මත මෙම අත්හැරීම සිදු කර ඇත. මිල අඩු කිරීම සහ වැඩි දියුණු කල සේවාවන් සමඟ තරඟකාරිත්වය සඳහා මග සැළසීමට අවශ්‍ය වූ සාර්ථක ලෙස මෙහෙයවන බලපත්‍ර යෝජනා ක්‍රමයක් ලබා දීම අමාත්‍ය මණ්ඩලය අනුමත කල අරමුණව තිබියදී, පිළිගෙන ඇති පරිදි ඒකාධිකාරයක් ඇතිව සිටි ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය කරනු ලබන අවස්ථාවක් වනු ඇතැයි නිලධාරි කමිටුව හෝ අමාත්‍යවරයා විසින් කිසිම විටෙක බලාපොරොත්තු වූවා විය නොහැකිය. සීමා ලිහිල් කිරීම සඳහා වූ ක්‍රියාවලිය දියාරු කිරීම සඳහා, ප්‍රකටව පෙනෙන පුළුල් තලයක් සහිතව දැන්වීම් පල කිරීම, අවශ්‍ය වූ නෛතික යාන්ත්‍රණය කප්පාදු කර එම අවස්ථාවේදී ක්‍රියාවට නැංවිය නොහැකි ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය කඩිනම් කරවීම සඳහා යොමු වූ 'පර්ක්' විසින් යොදා ගෙන ඇති වැඩපිළිවෙල මෙම දෘෂ්ටිකෝණයෙන් බැලිය යුතු වන්නේ අඩ අඳුරේය. අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනි මෙම ක්‍රියාව ඉන්ධන සැපයුම් සේවා ලබා දීමේ ඒකාධිකාරය සත්‍ය වශයෙන් තවදුරටත් අඛණ්ඩව පවත්වා ගෙන යන ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් මිලදී ගැනීම සිදු කල හැකි මිලදී ගන්නාට පක්ෂපාත තත්වයක් පෙන්වීය. මෙම උපකල්පනය තවදුරටත් සනාථ වන්නේ, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් මිලදී ගැනීම අර්පනය කිරීමෙන් පසුව, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) වෙත වාසිදායක අයුරින් ජයසුන්දර විසින් එකඟ වන ලද පොදු භාවිතාකරන්නන්ගේ පහසුකම (CUF) ගිවිසුමෙහි කෙටුම්පත සංශෝධනය කිරීම හේතුවෙන් (මෙය පසු අවස්ථාවක "අපගමනය" යන මැයෙන් සළකා බැලෙනු ඇත.) ඉන්ධන සැපයීමේදී ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් ලබා ගත් නමුත්, ඉන්පසු ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි පාලනය යටතේදී තරඟකාරීත්වය කපා හල බැවිනි.

පෙත්සම්කරු සහ අමරසේකර විසින් ඉදිරිපත් කිරීම් ගණනාවක සඳහන් කර ඇති පරිදි, ජයසුන්දර ඔහු විසින්ම "සම්පාදන පරිපාටියේ සඵලතාවය වැඩි දියුණු කිරීම ...." යනුවෙන් නිකුත් කර ඇති 1999.11.29 දිනැති අංක එෆ්අයිඑන් 358(4) රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනි ලෙස ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් විකිණීම සඳහා නිර්දේශයන් කිරීමේ කාර්යය සඳහා ඔහු විසින් අමාත්‍ය මණ්ඩලය අනුමත කල ටෙන්ඩර් මණ්ඩලයක් පිහිටුවීම පැහැර හැරීම නිසා ජයසුන්දර විසින්ම එම චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝනය කර ඇති බවය. තවදුරටත් ඉදිරිපත් කර ඇත්තේ ටෙන්ඩර් ලියවිලි එනම් උනන්දුව දැක්වීමේ ප්‍රකාශ (EOI) සහ යෝජනා සඳහා ඉල්ලීම් (RFP), අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කල ටෙන්ඩර් මණ්ඩලයක් සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් අනුමත කල යුතුව තිබුණු බවය. මෙම අවස්ථාවේදී, තාක්ෂණික ඇගයීම් කමිටුවක් පමණක් පත් කර තිබූ අතර, දින අනුපිළිවෙල අනුව උනන්දුව දැක්වීමේ ප්‍රකාශය සහ යෝජනා සඳහා ඉල්ලීම තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීමටත් පෙර නිකුත් කර තිබූ බව ස්ථාපිත විය.

සම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය, සාධාරණභාවය සහ අවංකත්වය සහතික වීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කල ටෙන්ඩර් මණ්ඩලයක් සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීම අවශ්‍යතාවයකි. එම මාර්ගෝපදේශයන් සහ චක්‍රලේඛ වෙළුම් ගණනාව මගින් රැක ගත යුතු යයි අපේක්ෂිත ගිවිසුම් ප්‍රකාර ක්‍රියාවලියකදී, මිලදී ගැනීම සහ විකිණීම අංගයන් දෙකක් වේ. ජයසුන්දර විසින් අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කල ටෙන්ඩර් මණ්ඩලයක් පත් කිරීම පැහැර හැරීම පිළිබඳව පහසුවෙන් කරුණු ඉදිරිපත් කිරීමට අදහස් කර ඇත්තේ, රජයේ කොටස් විකිණීමේදී එවැනි මණ්ඩලයක් පත් කිරීමේ ප්‍රායෝගික තත්වයක් නොතිබුණ බව පදනම් කිරීමෙනි. එය එසේ නම්, ඔහුගේ එම ප්‍රායෝගික තත්වය ඔහුගේම චක්‍රලේඛයට පටහැනිය. එය එසේ සිදුව තිබියදී, අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කල ටෙන්ඩර් මණ්ඩලයක් පත් කිරීම, 32 වන වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇති විනිවිදභාවය නොමැතිකම සහ අසතුටුදායක ලෙස සැළකීම වැනි කටුක දුක් ගැනිවිලි වලට සහන සැළසීමේ යාන්ත්‍රණයක් වනු ඇත. තවද, එමගින් ලංසු ඇගයීමේ ක්‍රියාවලිය අමාත්‍ය මණ්ඩලයේ දැනගැනීමට සැළැස්වූ බවට තහවුරු කෙරෙන අතර, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) සමඟ 'ගනුදෙනුව ග්‍රහණය කර ගැනීමට' ජයසුන්දරට ඉඩ ලබා නොදී, අමාත්‍ය මණ්ඩලය මගින් විකිණීම කල යුතු ආකාරය පිළිබඳව තීරණයක් ගැනීමට හැකි වනු ඇත.

තවදුරටත්, ටෙන්ඩර් ලියවිලි තාක්ෂණික ඇගයීම් කමිටුවක් සහ අමාත්‍ය මණ්ඩලය අනුමත කල ටෙන්ඩර් මණ්ඩලයක් විසින් සකස් කරනු ලැබුවේ නම්, යෝජනා සඳහා ඉල්ලීම් (REP) හි 4.4.1 ඡේදයේ ඇතුලත්ව තිබෙන තදබල ලෙස වැරදි සහගත වූ සාවද්‍ය ප්‍රකාශ මගහැරිය හැකිව තිබුණි. ප්‍රශ්න කිරීමට බඳුන්ව ඇති ඉඩම පිළිබඳව සළකා බැලීමේදී, මෙම ඡේදයේ සඳහන්ව ඇත්තේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දැනට එම ඉඩමේ සින්නක්කර අයිතිය දරන බවත්, එය ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත පැවරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති බවත්ය. මෙම ප්‍රකාශය සම්පූර්ණයෙන්ම සාවද්‍ය වේ. ප්‍රශ්න කිරීමට බඳුන්ව ඇති ඉඩම සම්බන්ධව 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරය පනතේ 2(3) වගන්තිය යටතේ අමාත්‍යවරයා කර ඇති නියෝගය අනුව, සත්‍ය වශයෙන්ම කොළඹ වරායට අයත් ප්‍රමාණයෙන් අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක් වූ ඉඩමක් බව පෙත්සම්කරු විසින් සනාථ කර ඇත. පසු අදියරකදී ඉඩම පිළිබඳ අංගයන් වැඩිමනත් ලෙස සළකා බලනු ලැබේ.

ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් විකිණීමේදී, ජයසුන්දර සහ 'පර්ක්' විසින් ගන්නා ලද පියවරයන් ඉහත සඳහන් හේතු දැක්වීම මත කිසිම ආකාරයකින් අමාත්‍ය මණ්ඩල තීරණයෙන් නියෝග කරන ලද්දක් නොවන බවත්, එය බලාත්මක කර ඇති ක්‍රියාවලියට ප්‍රත්‍යක්ෂ ලෙසම පටහැනි වූ ක්‍රියාවක් බවත් මම නිගමනය කරමි. අනුගමනය කර ඇති ක්‍රියා පරිපාටිය ජයසුන්දර ඔහු විසින්ම නිකුත් කර ඇති චක්‍රලේඛයටද පටහැනිය.

ජයසුන්දර විසින් ඔහු ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 10(ඩී) ඡේදයේ පහත පරිදි විස්තර කිරීමට උත්සාහ දරා ඇත.

> "1996 අංක 1 දරණ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 5(ටී) වගන්තියේ ප්‍රතිපාදන සළසා ඇති පරිදි, පර්ක් රජයේ නියෝජිතයකු වශයෙන් කටයුතු කර ඇති අතර, එයට ඉන්ධන සැපයුම් වෙළඳ කටයුතු සීමා ලිහිල් කිරීමේ කාර්යයේදී අර්ථාන්විත පරිපාටි අනුගමනය කිරීමට බලය පැවරී තිබුණි. "

ඔහු විසින් විශ්වාසය තබා ඇති පර්ක් පනතේ 5(ටී) වගන්තියේ මෙසේ සඳහන් වේ.

> "**<u>එසේ අනුමත කරනු ලැබ ඇත්නම්,</u>** යම් කරුණක් හෝ ගනුදෙනුවක් සඳහා ශ්‍රී ලංකාවේදී සහ විදේශයන්හි රජයේ නියෝජිතයකු වශයෙන් කටයුතු කිරීමටය. (අවධාරණය කොට ඇත.)"

ඔහු මෙයින් “ඉන්ධන සැපයීමේ වෙළඳාමේ සීමා ලිහිල් කිරීම සඳහා“ අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විකිණීම සඳහා පියවර ගත් බව ව්‍යංගයෙන් අඟවනවා විය හැකිය. ඉහතින් සටහන් කර ගෙන ඇති පරිදි, පෞද්ගලික අංශයට බලපත්‍ර නිකුත් කිරීම මගින් ඉන්ධන සැපයීමේ වෙළඳාමේ සීමා ලිහිල් කිරීම සඳහා පර්ක් විසින් යෝජනා ඉදිරිපත් කල යුතු බවට, අමාත්‍ය මණ්ඩලය විසින් නිගමනය කරන ලද බව නිවැරදිය. ඉහත විශ්ලේෂණයෙන් හෙලි වන පරිදි, ජයසුන්දර විසින් මෙම ‘සීමා ලිහිල් කිරීමේ‘ ක්‍රියාවලිය ශීත ගබඩාවක තබා (අක්‍රීයව පසෙක තබා) ඒකාධිකාරයට අත නොතබා, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලියේදී ශීඝ්‍රගාමී වේගයෙන් විරුද්ධ අතට ගමන් කර ඇත. එම කාර්යයේදී, ඔහු තමන් විශ්වාසය තබා ඇති 5(ටී) වගන්තියට පටහැනිව, ඔහුට අනුමැතිය දී ඇති ආකාරයට කටයුතු කිරීම පැහැර හැරීම මගින් අමාත්‍ය මණ්ඩල තීරණයට අත්‍යන්ත වශයෙන් විරුද්ධ වූ ක්‍රියාවලියක යෙදී ඇත.

## ඈ. <u>ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් ඇගයීම</u>

ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් ඇගයීම ප්‍රධාන තක්සේරුකරු විසින් 1993.7.2 දින සිදු කර ඇත. ජයසුන්දර විසින් 2002.2.6 දින ඇගයීමේ යාවත් කාලීන කල අනුවාදයක් ඉල්ලා ප්‍රධාන තක්සේරුකරුට ලිපියක් යැවීය. ප්‍රධාන තක්සේරුකරු විසින් 2002.5.7 දිනැති ලිපිය මගින් පිළිතුරු ලබා දෙමින්, වත්කම් ඇගයීම සම්පූර්ණ කිරීමට ආසන්න බවත්, එය සතියක් ඇතුලත නිම කල හැකි බවත්, ඔහුගේ නිලධාරීන්ට මෙම කාර්යය සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමත කල පරිදි දිරිදීමනා ගෙවීමකට හිමිකම් ඇති බැවින්, එය ගෙවන තෙක් ව්‍යාපාරික ඇගයීම ආරම්භ කල නොහැකි වී ඇති බවත් පවසා ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති පරිදි එම ගෙවීම සනාථ කරන මෙන් ඔහු ජයසුන්දරගෙන් ඉල්ලා සිට ඇත. සැළකිය යුතු ලෙසට, ජයසුන්දර එම ලිපියට පිළිතුරු සැපයුවේ නැත. ඒ වෙනුවට, ඔහු ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ව්‍යාපාරික ඇගයීමක් 2002.5.28 දිනට පෙර සිදු කරන ලෙසට 2002.5.15 දිනැති ලිපිය මගින් ඩීඑෆ්සීසී බැංකුවෙන් ඉල්ලා සිටින ලදී. ජයසුන්දර විසින් මේ සඳහා ජීඑස්ටී සහ එන්එස්එල් සමඟින් රුපියල් 750,000/- ක මුදලක් කිසිදු මැසිවිල්ලකින් තොරව ඩීඑෆ්සීසී බැංකුවට ගෙවන ලදී. එවිටම පැන නගින ප්‍රශ්නය වනුයේ, එක් රජයේ නිලධාරියකුට දිරිදීමනාවක් ගෙවීමට පැකිලෙන රජයේ නිලධාරියෙකු විසින් පෞද්ගලික බැංකුවකට ත්‍යාගශීලී වන්නේ කෙසේද? යන්නයි. ප්‍රධාන තක්සේරුකරු සමඟ එම කරුණ සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු නොකිරීම පිළිබඳව ජයසුන්දර විසින් ඉදිරිපත් කර ඇති එකම හේතුව වූයේ, “කෙටි කාලයක් ඇතුලත ප්‍රධාන තක්සේරුකරු විසින් ව්‍යාපාරික ඇගයීමක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කිරීම සිදු කල හැකි කරුණක් නොවූ බවය.“ (ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 12 කේ ඡේදය අනුව) ඩීඑෆ්සීසී බැංකුව පවා පර්ක් විසින් ඇගයුම් ලබා දීම සඳහා කඩිනම් කරවනු ලැබ ඇත. ඉමහත් ප්‍රශ්නයක් පැන නගින්නේ, ජයසුන්දර විසින් කාගේ කාර්යයක් අවසන් කල යුතු කාල සීමාවක් අනුව කටයුතු කර ඇතිද? යන්න පිළිබඳවය. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් විකිණීම සඳහා නිර්දේශ සකස් කිරීමට හෝ අමාත්‍ය මණ්ඩලය විසින් පර්ක් වෙත බලතල ලබා දී නොතිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් ක්‍රියා කිරීමට බලය ලබා දී ඇති එකම කරුණ වූයේ, ඉහත දක්වා ඇති පරිදි පර්ක් විසින් සඵල ලෙස ශීත කාමරයේ (අක්‍රීයව) තබා තිබූ කොළඹ වරායෙන් පිට ඉන්ධන සැපයුම් සේවා සැපයීමේ සීමා ලිහිල් කිරීම සඳහා වූ අනුමත කරන ලද ක්‍රියාවයි. එබැවින් ඔහුගේ හදිසි ක්‍රියාව පර්ක් පනත අනුව විධායක බලය නීත්‍යානුකූලව අභ්‍යාස කිරීමට සත්තකින්ම එය පදනම් නොවූ අතර, එය අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනි වූවකි.

ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් විකිණීම සඳහා විශේෂ ඉල්ලීමක් නොමැතිව ජයසුන්දරට අමාත්‍ය මණ්ඩලයට නිර්දේශයක් කිරීමට අවශ්‍ය වූයේ වුවද, නිසි ක්‍රියාමාර්ගය වූයේ පූර්වයෙන් ඉල්ලා ඇති ප්‍රධාන තක්සේරුකරුගේ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි වත්කම් පිළිබඳව ඇගයීමක් ලබා ගැනීම වූ අතර, සතියක් ඇතුලත එය සූදානම් විය හැකිව තිබුණි. ඔහු මෙම

ඇගයීම ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ප්‍රධාන තක්සේරුකරුට හිමිකම ඇති දිරිදීමනා ගෙවීම සඳහා වගකීම භාර ගැනීමෙන් වැලකී මහ හැරියේය. සාර්ථක ලෙස එම ක්‍රියාවලිය අත්හිටුවා, ඔහු තමන් විසින්ම පෞද්ගලික බැංකුවක් තෝරා ගෙන අපේක්ෂිත සම්පූර්ණ මුදලම ගෙවා දැමීය. මෙය රාජ්‍ය අංශයේ සම්පාදනය පිළිබඳ මූලික පිළිගත් මතයන්ට සම්පූර්ණයෙන් පටහැනිය. ඔහු බලාපොරොත්තු වූ ව්‍යාපාරික ඇගයීම ඔහු විසින් තනිවම නිර්මාණය කර ගත්තකි. ඩීඑෆ්සීසී විසින් ලබා දුන් ව්‍යාපාරික ඇගයීම පදනම් කර ගෙන, ජයසුන්දර විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් 90 % ක් සඳහා ලංසු තැබීමේ අවම මිල තදබල විවේචනයට ලක් වීම පදනම් වී ඇත්තේ, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි පෞද්ගලීකරණය සඳහා වර්ෂ 4 ක මූල්‍ය කාර්ය සාධනය පදනම් කර ගෙනය. 2005/2006 වාර්ෂික වාර්තාවට අනුව ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ලාභ මෙහි පහත දැක්වෙන සංඛ්‍යාවන් විය.

| | |
|---|---|
| 2002/2003 - | 508,735,000 |
| 2003/2004 - | 267,802,000 |
| 2004/2005 - | 575,035,000 |
| 2005/2006 - | 1,106,992,000 |
| | 2,458,564,000 |

එනයින්, පෙත්සම්කරු සහ අමරසේකර පෙන්වා දෙන්නේ, වර්ෂ 4 ක කාලයක් තුල කොටස් මිලදී ගැනීම සඳහා වැය කල මුදලට දෙගුණයකට වැඩි ප්‍රමාණයක් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ව්‍යාපාර ලාභ උපයා ඇති බවය. එය පමණක්ම ඇගයීම සිදු කිරීම තදබල ලෙස දෝෂ සහගත බවට වූ පෙත්සම්කරුගේ සහ අමරසේකරගේ විවේචන පිළිබඳ විශ්වාසනීයත්වයක් ලබා දෙයි.

ඩීඑෆ්සීසී විසින් භාවිතා කර තිබූ ක්‍රමය වන්නේ වර්ෂ 15 ක අනාගත කාලයක් සඳහා ප්‍රක්ෂිප්ත වට්ටම් කල මුදල් ප්‍රවාහයයි. අමරසේකර ඔහුගේ ඉදිරිපත් කිරීම් වල විදහා දැක්වූයේ, මෙය ව්‍යාපාර ක්‍රියාකාරකම් වල ස්වභාවය සහ විශේෂයෙන් නිශ්චල දේපල ඉහළ ප්‍රමාණයන් (කොලඹ වරාය තුල අක්කර 8 කට වැඩි) සැළකිල්ලට ගත් විට එම ඇගයීමේ පදනම වැරදි සහගත ගණනය කිරීමක් බවය. නිශ්චල දේපල කිසිම විටෙක, මෙහි එය සිදු කර ඇති ආකාරයෙන් අගය කල නොහැකිය. නිශ්චල දේපල වල ඇගයීම ලැබිය යුතුව තිබුණේ ප්‍රධාන තක්සේරුකරුගෙන් වන අතර, ජයසුන්දර විසින් පරීක්ෂාකාරී ලෙස එය ලබා ගැනීම මඟහැර ඇත. සැළකිය යුතු අංගයක් වන්නේ, මෙම නඩු තීන්දුවේ කලින් ඡේදයක දීර්ඝ ලෙස විස්තර කර ඇති සීමා ලිහිල් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය නිසා ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හට නොකඩවා ඉන්ධන සැපයුම් අංශයේ ඒකාධිකාරය භුක්ති විඳීමට හැකි වීමය. ජයසුන්දර විසින් සත්‍ය වශයෙන්ම ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි අර්පනය පිළි ගැනීමෙන් පසු, පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් ගිවිසුමට 8.2 වගන්තිය එකතු කිරීම මගින්, ඒකාධිකාරය අඛණ්ඩව පැවතීමට මග පාදා දුන්නේය.

පෙත්සම්කරු විසින් පෙත්සමෙහි 22 වන ඡේදයේ ඉහත සඳහන් කරුණු දෙකම හුවා දක්වන, රාජ්‍ය ව්‍යවසාය කමිටු වාර්තාවේ (කෝප්) 12 වන ඡේදය උපුටා දක්වා ඇත. පෙත්සමෙහි උපුටා දක්වා ඇති එකී ඡේදය පහත පරිදි වේ.

> "ආනුෂංගික වශයෙන්, ඉහත ඒකාධිකාර නියාමිතිය පිළිබඳව අභියෝග කල විට ඩීඑෆ්සීසී බැංකුව රු. 1,200,000,000/- ක් වූ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ඔවුන්ගේ 'ව්‍යාපාරික ඇගයීම' ප්‍රතික්ෂේප කර, ඔවුන්ගෙන් ඉල්ලා සිටියේ 'ශුද්ධ වත්කම් ඇගයීමක්' නම් ඔවුන්ට අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක් වූ ඉඩම ඇගයීම සඳහා වෘත්තීය නිශ්චල දේපල

ඇගයුම්කරුවකුගේ සේවය ලබා ගත හැකිව තිබූ බව සනාථ කරමින් 'ඒකාධිකාරයක' පදනම මත ඔවුන්ගේ 'ව්‍යාපාරික ඇගයීම' රු. 2,400,000,000/- ක් බව ලිඛිතව සනාථ කරන ලදී. "

අධිකරණයේ දිවුරුම ප්‍රකාශයක් ගොනු කල 'සීඑෆ්සීසී' හි නියෝජිත විසින් පෙත්සමේ 22 වන ඡේදයේ සඳහන් සම්ප්‍රකාශවලට නිශ්චිත පිළිතුරක් ලබා දීමෙන් වැලකී සිටියේය. එම අවස්ථාගත තත්වය යටතේ, ඇගයීම සාධාරණීකරණය කිරීම අපේක්ෂා කරමින් 'සීඑෆ්සීසී' වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ ලිඛිත ඉදිරිපත් කිරීම් සැළකිල්ලට ගැනීම අවශ්‍ය නොවේ. ඇගයීම ලබා ගැනීම සඳහා වූ මූලිකව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණු ජයසුන්දරගේ ක්‍රියා කලාපය පිළිගත් පරිපාටිවලට පටහැනිව, ඔහුගේම අරමුණ ඉටු කර ගැනීම සඳහා විසඳිය නොහැකි හදිසියකින් යුතුව, අමාත්‍ය මණ්ඩලයට පර්ක් පනත යටතේ නීත්‍යානුකූල බලය ආභාස කිරීමෙන් හොඳින් සළකා බලන ලද උපදෙස් සහ නිර්දේශ ලබා දීමෙන් ඉතා දුරස්ථ විය.

## ඉ. තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඇගයීම සහ ලංසු තබන්නන්ගේ අවසන් තේරීම් සිදු කිරීම

තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කරන ලද්දේ සම්පූර්ණයෙන්ම ජයසුන්දරගේ නිර්දේශ කිරීම මත, එවකට මහාභාණ්ඩාගාරයේ ලේකම් සී. රත්වත්ත විසිනි. මෙම සමස්ථ ක්‍රියාවලියේ කැපී පෙනෙන අංගයක් වූයේ, ජයසුන්දර විසින් ඉදිරිපත් කරන ලද සෑම ලේඛනයක්ම ප්‍රමාදයකින් සහ ප්‍රශ්න කිරීමකින් තොරව රත්වත්ත විසින් අනුමත කර අත්සන් කර තිබීමයි.

ඉදිරිපත් කර තිබූ උනන්දුව දැක්වීමේ ප්‍රකාශ 17 ක් සමාලෝචනය කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව 2002 මාර්තු 8 සහ 27 වන දිනයන්හි රැස් විය. ස්ථර දෙකක ලකුණු දීමේ ක්‍රමයක් මේ සඳහා භාවිතා කරන ලද අතර, ලංසු තබන්නන්ගේ ශුද්ධ වත්කම් පදනම් කර ඔවුන්ගේ මූල්‍ය හැකියාවන් සඳහා ලකුණු 60 ක් ආරෝපණය කර, ඉන්ධන සැපයුම් පලපුරුද්ද සහ එම අංශයේ අනෙකුත් විශ්වාසනීයත්වයන් සඳහා ලකුණු 40 ක් ආරෝපණය කරන ලදී. ඒ අනුව, ලකුණු 70 කට ඉහළ ලකුණු හිමිකර ගත් ලංසු තබන්නන්, යෝජනා ඉදිරිපත් කිරීම සඳහා කෙටි ලැයිස්තුගත කරන ලදී.

ඇමරිකා එක්සත් ජනපදයේ ෂෙව්රොන් කෝපරේෂන්ට අයත් ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM) සමඟ සහයෝගීත්වයෙන් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) විසින් උනන්දුව දැක්වීමේ ප්‍රකාශය ඉදිරිපත් කර ඇත. ප්‍රතික්ෂේප කල ලංසුවක් ඉදිරිපත් කල පාර්ශවයක් වූ 32 වන වගඋත්තරකරු විසින් ලංසුවක් ඉදිරිපත් කර ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ කෙමොයිල් කෝපරේෂන් සමඟ සහයෝගීත්වයෙනි. මෙම උනන්දුව දැක්වීමේ ප්‍රකාශ දෙකම තවත් හතර දෙනෙකු සමඟ කෙටි ලැයිස්තු ගත කරන ලදී. 32 වන එකතු කල වගඋත්තරකරු ගේ නඩුව වී ඇත්තේ, මූල්‍ය හැකියාව සඳහා ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හට සමස්ථ ලකුණු 60 ම ලබා ගැනීමේ හැකියාව තිබුණ නමුදු, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හට ඉන්ධන සැපයීමේ පලපුරුද්ද නොතිබුණ බැවින් ඉන්ධන සැපයුම් අංශයේ වෙළඳපොළ ප්‍රධානියා සමඟ සහයෝගීත්වය නොතිබුණා නම්, නිසැකයෙන්ම එයට ලකුණු 70 සීමාව පසු කිරීමට නොහැකි වනු ඇති බවය. කෙටි ලැයිස්තු ගත කර ඇති ලංසු තබන්නන්ගේ යෝජනා සමාලෝචනය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව 2002.6.6 දින රැස් වී ඇත. එදින රැස්වූ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වාර්තා කර ඇත්තේ, 'ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM)' විසින් 'ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH)' සමඟ ලංසු නොතබන නමුත්, තාක්ෂණික උපදේශන ගිවිසුමකට ඇතුලත් වන බවය. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීම වී ඇත්තේ, එම අවස්ථාවේදී ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ලකුණු 70 සීමාවෙන් නිසැකයෙන්ම පහළ වැටෙන හෙයින්, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ව කෙටි ලැයිස්තුවෙන් ඉවත් කර තිබිය යුතු බවය. 32 වන එකතු කල වගඋත්තරකරු චෝදනා කරන්නේ වෙනස්කම් සහිත සැළකිල්ලක් තිබූ බවත්, ඉදිරිපත් කල අනුදේශ ඇතුලත ඒකාධිකාරයක් ලබා දීමට නොහැකිව තිබියදී, සහ වර්ෂ 8 ක ඒකාධිකාරයක් ඉල්ලා සිටි කෙමනෝල් කෝපරේෂන් සහයෝගීතාවයේ ඉල්ලුම්කරු වූ

ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි ලංසුව ප්‍රතික්ෂේප කල යුතුව තිබියදී, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තවදුරටත් ලංසුව ඇගයීම සිදු කල බවය. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ ඇමුණුම 1 හි වන උනන්දුව දැක්වීමේ ප්‍රකාශ සාරාංශය 32 වන එකතු කල වගඋත්තරකරුගේ ඉදිරිපත් කිරීම් උසුලා තබයි. ‘ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH)‘ හි උනන්දුව දැක්වීමේ ප්‍රකාශය සාරාංශ ගත කර ඇත්තේ මුල් සහයෝගිතාකරු වශයෙන් වූ ‘ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM)‘ සමඟ වේ. 10 වන අංගයේ පහත පරිදි සඳහන් වෙයි.

> “නම : ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM) / ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ලිමිටඩ්
>
> තොරතුරු සැපයීම : ආකෘතිය ඒ - ඔව්
>
> ආකෘතිය බී - ඔව්
>
> ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් : ඉන්ධන තෙල් සහ සමුද්‍ර ලිහිසි තෙල් අලෙවි කිරීම
>
> පිරිපහදුවට අවතීර්ණ වීම: ඔව්
>
> ටැංකි සපයන සමාගමක්ද: ඔව්“
>
> ඉන්ධන සැපයුම් මෙහෙයුම් කටයුතු කෙරෙන ස්ථානය : ඇමරිකාව, යුරෝපය, එක්සත් අරාබි එමීර්, සිංගප්පූරුව, තායිලන්තය ඇතුළු ආසියාව

අමුණා ඇති ලකුණු පත්‍රිකාව අනුව, ඉහත දක්වා ඇති ඇගයීමේ හුවා දක්වා ඇති ඉන්ධන සැපයුම් අංශයේ ‘ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM)‘ හි තද විශ්වාසනීයත්වය මත ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM) / ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ලිමිටඩ් සබඳතාවය උපරිම ලකුණු 100 ලබා ගෙන ඇත. පිළිගෙන ඇති පරිදි, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හට තනිවම එම විශ්වාසනීයත්වය සඳහා හිමිකම් කිව නොහැකිය.

අමාත්‍ය මණ්ඩලය පත් කල ටෙන්ඩර් මණ්ඩලයක් පත් කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් පෙත්සම්කරු සහ අමරසේකර විසින් සිදු කර ඇති විවේචනයන්ට වඩාත් ශක්තිය එකතු වන්නේ, තාක්ෂණික ඇගයීම් කමිටුවේ වැඩ පිළිබඳව පරීක්ෂා කිරීමට ජයසුන්දර හැර වෙනත් කිසිවකු නොසිටි බැවිනි. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ පහත දැක්වෙන ඡේදය මගින් තාක්ෂණික ඇගයීම් කමිටුව සමස්ථ වශයෙන් ජයසුන්දරගේ මග පෙන්වීම යටතේ වූ බව පෙන්නුම් කරයි.

> “2002 මැයි 28 වන දිනට ලැබිය යුතු යෝජනා කැඳවීමේ ඉල්ලීම් අනුව ලැබී ඇති යෝජනා සමාලෝචනය කර, කොළඹ කොටස් වෙළඳපොල හුවමාරුවේ මූලා ලංසු ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දෙනු ලබන පාර්ශවයන් කෙටි ලැයිස්තු ගත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව 2002 ජූනි 6 වන දින රැස්විය.“

කොළඹ කොටස් වෙළඳපොල හුවමාරුවේ මූලා ලංසු ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දෙනු ලැබූ පාර්ශවයන් කෙටි ලැයිස්තුගත කිරීම සමස්ථ ක්‍රියාවලිය සැලසුම් කර අනුගමනය කරන ලද්දේ, පැහැදිලි ලෙස ජයසුන්දර විසින් බව, ඔහුගේම පසුව වූ සිද්ධීන් වලින් අනාවරණය වන අතර, එම අවස්ථාවේදී කොටස් විකිණීම පිළිබඳ කරුණ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් නොකෙරුණු අතර, පිළි ගෙන ඇති පරිදි එම පියවරේදී අමාත්‍ය මණ්ඩලය අනුමත කල ටෙන්ඩර් මණ්ඩලය නොපැවතුණි.

මූලික සීමාවන්ගෙන් නිදහස් වීම සඳහා ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) විසින් 'ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM)' හි විශ්වාසනීයත්වය පිළිබඳ කරුණු පමණක් භාවිතා කල බවට සහ 'ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM)' සමඟ සහයෝගීතාවය නියම වශයෙන් අදහස් නොකල බවටත් වූ 32 වන එකතු කල වගඋත්තරකරුගේ විවේචනයන්, සම්පූර්ණයෙන්ම වෙනත් පෙදෙසකින් ලැබී ඇති ලේඛනයකින් ශක්තිමත් වෙයි. පෙත්සම්කරු විසින් නඩුවෙහි පසු අවස්ථාවකදී, රත්නායක විසින් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) වෙනුවෙන් ආයෝජන සහන සඳහා ඉදිරිපත් කල ඉල්ලුම් පත් පිළිබඳ පී 36 සහ පී 37 දරණ ලේඛන ආයෝජන මණ්ඩලයෙන් ලබා ගෙන ඇත.

ඉහත සඳහන් උනන්දුව දැක්වීමේ ප්‍රකාශ සමාලෝචනය කල තාක්ෂණික ඇගයීම් කමිටුවේ රැස්වීමට දින 7 කට කලින් 2002.3.20 දිනැතිව ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය අනුව 'නව ආයෝජනයක්' සඳහා රත්නායක විසින් බදු සහන ඉල්ලුම් පතක් ඉදිරිපත් කර ඇත. ඉල්ලුම්පත්‍ර ආකෘති පත්‍රයේ 1(අ) තීරුවේ 'සහයෝගතාකරුවන්ගේ විස්තර' යටතේ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) නම පමණක් සඳහන්ව එහි ලිපිනය 130, ග්ලැනී වීදිය, කොළඹ 2 වශයෙන් සඳහන් කර ඇත. සැළකිය යුතු ලෙස, වෙනත් සහයෝගීතාකරුවකු හෝ විදේශ ආයෝජකයකු පිළිබඳ එහි සඳහනක් නොමැත. තවදුරටත් සැළකිය යුතු පරිදි යෝජිත ආයෝජනයෙහි ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි විස්තර සියල්ලක්ම එහි නම සඳහන් නොකරමින් ඇතුලත් කර ඇත. ආයෝජනය කරනු ලබන ස්ථානයේ ලිපිනය වශයෙන් දක්වා තිබුනේ අංක 69, වොල්ස් පටුමග, කොළඹ 15 යන්න වන අතර, එය ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ලිපිනය වේ. ආයෝජනයට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය වශයෙන් දක්වා ඇත්තේ නඩුවෙහි සැළකිය යුතු ලෙස දක්වා ඇති කොළඹ වරාය ඇතුලත පිහිටි නියත වශයෙන් අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක ඉඩම් ප්‍රමාණය වේ. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් භාවිතා කල වසර 40 ක් පරණ ටැංකි 12 ක්ද ඇතුලත්ය. රත්නායක විසින් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ඉල්ලුම්පත සත්‍ය වසන් කරමින් ඉදිරිපත් කර ඇති අතර, එහි කිසිදු ස්ථානයක, එයින් අදහස් කර ඇත්තේ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) අත්පත් කර ගැනීමට බව සඳහන් කර නොමැත. එහි ව්‍යාජ ලෙස, ආයෝජන සහන ලබා ගැනීමට සුදුසුකම් ලැබීම සඳහා ඉදිරිපත් වූ නව ආයෝජනයක් යයි සඳහන් කර ඇත. ආයෝජන මණ්ඩලයේ දෘෂ්ඨියෙන් වඩාත් සැළකිය යුතු 'ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM)' සහයෝගිතාවය අත්හැර තිබීම පිළිබඳව පැහැදිලිව ස්ථාපිත කරනුයේ 32 වන එකතු කල වගඋත්තරකරු විසින් කියාපා ඇති එම වේලාවේදීම ඉදිරිපත් කල උනන්දුව දැක්වීමේ ප්‍රකාශයේ 'ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM)' ඇතුලත් කිරීම ලකුණු 70 සීමාවෙන් ඔබ්බට පැන ගැනීම සඳහා යොදා ගත් වංචා සහගත උපක්‍රමයක් පමණක් බවය.

සැළකිල්ලට ගත යුතු තවත් අංගයක් වන්නේ, 'ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM)' සහයෝගිතාවය පිළිබඳව අවනියෝජනයක් සිදු කර උනන්දුව දැක්වීමේ ප්‍රකාශය කෙටි ලැයිස්තුගත කිරීමට පෙර පවා අක්කර 8 ක ඉඩමද ඇතුළු සියලුම බාධක වලින් පැන ගනිමින් 'ගනුදෙනුව කඩා ගත හැකිවීම' ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි රත්නායක විසින් නියත වශයෙන් දැන සිටීමේ පදනම පිළිබඳවය. එය සර්ව ශුභවාදී අනුමානයක්ද? නැතහොත් පෙත්සම්කරු සහ අමරසේකර විසින් කියන ලද පරිදි සම්පූර්ණ ගනුදෙනුව ජයසුන්දර සහ රත්නායක අතර සැලසුම් කර තිබූ නිසාද? පසුව වූ සිද්ධීන්ගෙන් වඩාත් අනුමාන කල හැකි වන්නේ පසුව කියන ලද්ද යයි තතු හෙලි කරනු ඇත.

ආයෝජන මණ්ඩල ඉල්ලුම්පත පිළිබඳ සිදුවීම් පෙළ නොකඩවා කර ගෙන යාමේදී, 2002.7.11 දිනැති ලිපිය මගින් ආයෝජන මණ්ඩලය දැනුම් දී ඇත්තේ ආයෝජන සහන සඳහා වූ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි ඉල්ලුම්පත අනුමත කර ඇති බවත්, වර්ෂ 3 ක කාලයක් සඳහා ආදායම් බදු අයකිරීමක් නොවන බවත්ය. ඉන්පසුව 4 වන සහ 5 වන වර්ෂ සඳහා ආදායම් බදු 10 % ක් වන බවත්, ඊට පසුව එය 15 % ක් වන බවත් සඳහන්ය. අමරසේකර විසින් පෙන්වා දී ඇති පරිදි මෙම ක්‍රියාවලියේ උපහාසාත්මක කියමන වන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් වූ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) බදු ගෙවූ ව්‍යාවසායයක් වීමය. 2000/2001 වර්ෂයේදී එය රුපියල් මිලියන 318 ක් ලාභ

උපයන ලද අතර, රුපියල් මිලියන 163 ක් ආදායම් බදු වශයෙන් ගෙවා ඇත. අපවාදයට ලක් කල මෙම අභ්‍යාසය මගින්, ලාභ ලබන, බදු ගෙවන රාජ්‍ය ව්‍යවසායයක් බදු වලින් නිදහස් පෞද්ගලික ව්‍යවසායයක් බවට පත් කර ඇති බවට වූ අමරසේකරගේ විවේචනය ඉතා හොඳින් තහවුරු වී ඇත. එහෙත් අනුමත කල අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව, සීමා ලිහිල් කිරීමේ ක්‍රියාවලියේ අරමුණ වූයේ ඉන්ධන සැපයීමේ කටයුතුවල ධාරිතාවය වර්ධනය කර, එමගින් රජයට ආදායම් වැඩි කර දීමය.

**බදු සහන ප්‍රදානය කල ආයෝජන මණ්ඩලයේ ලිපියේ දිනය 2002.7.11 ව තිබියදී, ඊට පසු දිනම එනම් 2002.7.12 දින ජයසුන්දර විසින් හදිසියේ යවන ලද ලිපියකින් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි ලංසුව පිළිගත් බවත් සහ 'ගනුදෙනුව අවසන් කිරීමට යෝජනා කර ඇත' යන්නත් දැන්වීම සුවිශේෂීතාවයකි. රත්නායක විසින් 2002.7.12 ක් වූ එදිනම පිළිතුරු ලබා දෙමින් ප්‍රකාශ කර සිටියේ, ඔවුන් ගනුදෙනුව අවසන් කිරීමට කැමැත්තෙන් සිටින බවය. සත්‍ය වශයෙන්ම එමගින් කොළඹ වරාය ඇතුලත අක්කර 8 ක ඉඩමක් සහිත රජයේ වත්කමක් විකිණීමේ ගනුදෙනුව අවසන් කිරීම සඳහා විශ්මයාන්විත වේගයක් තිබී ඇත. මේ සියලු කාරණා සිදු කර ඇත්තේ, යෝජිත විකිණීමේ ක්‍රියාවලිය අමාත්‍ය මණ්ඩලය විසින් සළකා බලා හෝ නොතිබියදීය. අමාත්‍ය මණ්ඩලය විසින් එම ක්‍රියාවලිය සළකා බලන ලද්දේ මසකය පසුව 2002.8.14 දිනදීය.**

ආයෝජන මණ්ඩල අනුමැතියට අදාළ සිද්ධීන් පිළිබඳ වෘත්තාන්තය සමාප්ත කිරීමේදී, 2002.7.11 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇතත්, සත්‍ය වශයෙන්ම එමගින් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) වෙත බදු සහන ලබා දිය නොහැකි වන්නේ, එවැනි සහන ලබා දිය හැකි වන්නේ පවත්නා ව්‍යාපාරයක් අත්පත් කර ගන්නා නව ආයෝජනයකට පමණක් නිසා බව සඳහන් කල යුතුය. අදාළ රෙගුලාසිය, ඉන්පසුව 2002.10.1 දිනැති අංක 1256/22 දරණ ගැසට් පත්‍රය මගින්, පවත්නා ව්‍යවසායයක වත්කම් අත්පත් කරගෙන පිහිටුවන ලද ආයෝජනයක් ඇතුලත් වනසේ සංශෝධනය කරන ලදී. මෙම සංශෝධනය ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් "එම කාර්යයට ගැලපෙන සේ සැකසෙන්නක්" විය. රත්නායක විසින් රෙගුලාසිය සංශෝධනය කිරීමේ පදනම මත, ඒ වනවිටත් ඇතුලත් වී ඇති ගිවිසුමට සංශෝධනයක් කරන ලෙසට ඉල්ලා ආයෝජන මණ්ඩලය වෙත වහාම යවන ලද 2002.10.4 දිනැති ලිපිය මගින් එම අනුමානය සම්පූර්ණයෙන් තහවුරු කරනු ලබයි. ආයෝජනය සඳහා ඉහත සඳහන් බදු සහන ලබා දීම සහතික වීමට රත්නායක විසින් යෝජනා කරන ලද ගිවිසුමේ සංශෝධන, ආයෝජන මණ්ඩලය විසින් ඇතුලත් කරන ලදී. මෙම ක්‍රියාවලිය පිළිබඳව අවම වශයෙන් කියන්නේ නම් නීතියේ ආධිපත්‍යය සහ නීතියේ සමාන ආරක්ෂාව විහිළුවක් බවට පත් කරයි. පවත්නා නීතිය යටතේ හිමිකමක් නොමැති පාර්ශවයකට ප්‍රතිලාභ සැළසීම සඳහා, අනන්‍ය කාර්යයක් සඳහා ගැලපෙන පරිදි නීතිය නැමීමෙන් සහ සංශෝධනය කිරීමෙන් පවිත්‍ර භාවයට පත් නීතිය ඉදිරියේ සමාන බව පිළිබඳ මූලධර්මය එහි අත්‍යාවශ්‍ය සහ වෙනස් නොවන අදහස නග්න බවට පත් කරනු ඇත.

මම දැන් පෙත්සම්කරු සහ රත්නායක විසින් කියාපා ඇති පරිදි ලංසුව පිළි ගැනීමට යොමු වූ සිද්ධීන් පිළිබඳව සහ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට පක්ෂපාතීව අපගමනය වීමට යොමු වූ සිද්ධීන් පිළිබඳව නැවත යොමු වෙමි.

ඊ. <u>**ලංසුව පිළි ගැනීමට සහ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට පක්ෂපාතීව කියාපාන ලද අපගමනය වීමට පෙරමණුගත සිද්ධීන්**</u>

ලංසු තැබීමට පෙර, ජයසුන්දර විසින් 2002.4.20 දිනට පර්ක් කාර්ලායයේදී ලංසු තැබීමේ පූර්ව සාකච්ඡාවක් කැඳවන ලදී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොල හුවමාරුව යන ආයතනයන්හි නියෝජිතයින් සහ උනන්දුව දැක්වීමේ පාර්ශවයන්

එයට සහභාගි වූහ. තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාව සම්පූර්ණ කිරීමටත් පෙරාතුව මෙම රැස්වීම කැඳවා ඇති බව පැහැදිලිය. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙහි දිනයක් සඳහන් කර නොමැති නමුත්, එය 2002.6.6 දිනැති රැස්වීමකට සම්බන්ධිත බව සඳහන්ය. වාර්තාව අත්සන් නොකර, එයට අත්සන් තබා නොතිබියදී, කෙටි ලැයිස්තුගත කර ඇති පාර්ශවයන්හට පර්ක් විසින් සපයා ඇති මූල්‍ය යෝජනා පදනම් කර ගනිමින්, ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කර හැකි බව දන්වා ඇති බව එයින් පෙනී යයි. අමාත්‍ය මණ්ඩලය විසින් නියම කර ඇති මාර්ගෝපදේශයක් හෝ අමාත්‍ය මණ්ඩලය අනමත කල ටෙන්ඩර් මණ්ඩලයක් නොමැති වීම, ජයසුන්දර විසින් ඉහත සඳහන් නීතිය යටතේ රජයට උපදෙස් දීමට සහ සහාය වීමට පර්ක් වෙත පවරා දී ඇති බලයට ඉතාමත් දුරස්ථ වූ ඔහු කැමති ක්‍රියාමාර්ගයක් යොදා ගැනීමට අවස්ථාව සළසා දී ඇත. එය එසේ තිබියදී, පාර්ශවයන් ලංසු තැබීමට පූර්වයෙන් පැවැත්වුන සාකච්ඡාවකට පැමිණෙන විට, එම දිනය වන විට තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව නොතිබූ බැවින් යන ලිහිල් හේතුව මත, උනන්දුව දැක්වීමේ ප්‍රකාශ ඇගයුම් කරන පදනම පිළිබඳව කිසිවකුත් දැන සිටියේ නැත.

එම සාකච්ඡා සභාවේ සටහන් වාර්තා කර, සහභාගි වී සිටි සියලු පාර්ශවයන් අතරේ බෙදා හරිනු ලැබ ඇත. අනුගමනය කල ක්‍රියා කලාපයේ නිත්‍යභාවය කෙසේ වුවද, එම පාර්ශවයන්ට දන්වා ඇති දෙයෙහි යම් පවිත්‍රතාවයක් ඇති වූ බැවින්, පාර්ශවයන් ඔවුන්ගේ යෝජනා සකස් කර ඉදිරිපත් කිරීමේදී අවශ්‍යයෙන්ම එයින් මග පෙන්වනු ලැබුවා විය යුතුය. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට පක්ෂපාති වූ බවට පසුව කරන ලද නිශ්චිත කියාපෑම් සලකා බැලීම සඳහා කරුණු තුනක් මතු වී ඇත. ඒවා පහත පරිදි වේ.

**<u>අපගමනය (i)</u>**

වාර්තාවේ පළමුවන ඡේදයෙහි නිරූපිත ලෙස ප්‍රකාශ කරන ලද්දේ, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් විකිණීමට පසුව, ඉන්ධන සැපයුම් ආනයනය කර විකිණීමේ ඒකාධිකාරයක් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් නොපවත්වන බවය. 1.5 වන ඡේදයෙහි ප්‍රකාශ කරන ලද පරිදි, වර්තමාන 'ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත' ඉන්ධන සැපයුම් ආනයනය සහ විකිණීම සඳහා අනුමැතිය දීමට අමාත්‍යවරයාට ප්‍රතිපාදන සළසා ඇත.

එනයින්, ලංසු තබන්නන්ට ලබා දී ඇති පැහැදිලි පණිවුඩය වන්නේ, විකිණීමෙන් පසුව වෙනත් අයට බලපත්‍ර ප්‍රදානය කිරීමේදී ඒකාධිකාරය ක්‍රමාණුකූලව ඉවත් වන බවය.

මා විසින් ඉහතින් ආදර්ශනය කරනු ලැබ ඇත්තේ, අමාත්‍ය මණ්ඩලය ඒකාධිකාරය ආංශිකව ඉවත් කරමින් සහ වර්ෂයක් ඇතුලත ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් විකිණිය යුතුය යනුවෙන් එම ක්‍රියාවලියේ අනික් පැත්ත නියම කර ඇති බවය.

තවද 'ඉන්ධන සැපයුම් සේවා ලිහිල් කිරීම' යන ශීර්ෂය යටතේ ඉහත දක්වා ඇති සිද්ධීන්හි අනුපිළිවෙල අනුව පැහැදිලි වන්නේ, අමාත්‍ය මණ්ඩලයට අවශ්‍ය වන පරිදි ජයසුන්දර විසින් ප්‍රධානත්වය දරණ ලද පර්ක් විසින් සීමා ලිහිල් කිරීම සඳහා කටයුතු කර නොමැති බවත්, ඊට පටහැනිව එම ක්‍රියාවලිය සාර්ථක ලෙස අක්‍රීය කර පැත්තකට කර තැබූ බවත්ය. එබැවින් පර්ක් විසින් අමාත්‍ය මණ්ඩලයට සීමා ලිහිල් කල ආධිපත්‍යයක් නිර්දේශ කිරීමට පවා පියවර නොගත් බව සහ ඉදිරි යම් කාලයක අංශය තුල තරඟකාරිත්වයක් නොතිබෙන බව හොඳින්ම දැන සිටි ජයසුන්දර, ලංසු තබන්නන්ට ඒ පිළිබඳ සත්‍ය දර්ශනයක් ලබා නොදී, ඔවුන්හට සාවද්‍ය චිත්ත රූපයක් දක්වා ඇත. සත්‍ය වශයෙන්ම ඒකාධිකාරය සීමිත කාලයක් සඳහා තවදුරටත් පැවැත්වීමට තිබුණේ නම්, ලංසු තබන්නන්ට ඔවුන්ගේ ලංසු වැඩි දියුණු කිරීම සඳහා පදනමක් යොදා ගත හැකිව තිබුණි. එබැවින් ජයසුන්දරගේ ක්‍රියාව වඩාත් හොඳ මිලක් ලබා ගැනීම සඳහා වූ රජයේ යහපතට අහිතකර විය. ඔහු කොළඹ වරායේ ඇති ඒකාධිකාරය අවම වශයෙන් වර්ෂයක්

දක්වා හෝ නොකඩවා පැවතෙන බවට වූ අමාත්‍ය මණ්ඩලයේ නිශ්චිත තීරණය අවධානයට ගැනීමට අපොහොසත්ව ඇත.

ඒ පිළිබඳව ජයසුන්දරට එරෙහිව ඇති වඩාත් බරපතල චෝදනාව වූයේ, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි ලංසුව භාර ගත් පසුව ඔහු කොළඹ වරාය ඇතුලත මෙහෙයවන සහ ප්‍රවාහනය කරන සියලුම ඉන්ධන සැපයුම්, පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම භාවිතා කල යුතුය යනුවෙන් යෝජනා කැඳවීම් සමඟ නිකුත් කල, පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් ගිවිසුමේ (CUF) ප්‍රතිපාදන සැලසිය යුතු බවට රත්නායකගේ 2002.7.11 දිනැති ලිපියේ යෝජනාවකට ඔහු එකග වී ඇතිය යන්නය. ඒ අනුව, රත්නායක විසින් ඉල්ලා සිටි සහතික වීම 8.2 වගන්තියේ රජයේ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි එකඟතාවයක් වශයෙන් ඇතුලත් කරමින්, පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් ගිවිසුම (CUF) සංශෝධනය කරනු ලැබ ඇත. නල ජාලයේ සැලැස්මෙන් පෙන්නුම් කරනුයේ ඉන්ධන සැපයුම් ජැටිය (දකුණු ජැටිය) සහ ඩොල්ෆින් නැංගුරම් පොළ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ටැංකි වලට සම්බන්ධ කර තිබූ බවය. එබැවින් 8.2 වගන්තියේ අවශ්‍යතාවය මගින්, කොළඹ වරායේ ඉන්ධන සැපයීම සිදු කරන ඕනෑම පාර්ශවයක් විසින් අත්‍යවශ්‍යයෙන්ම ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ටැංකි භාවිතා කල යුතු බවට පත් කරනු ලැබ ඇත.

විවිධ ශ්‍රේණිවල ඉන්ධන, ඉන්ධන සැපයුම් ක්‍රියාවලියේදී යොදා ගැනෙන බැවින් අනෙකුත් තරඟකරුවන්ව අත්‍යවශ්‍යයෙන්ම කොළඹ වරාය තුල ඉන්ධන සැපයුම් සිදු කිරීමෙන් වැළැක්වෙන බවට වූ, එකතු කල 32 වන වගඋත්තරකරුගේ ඉදිරිපත් කිරීමේ හරයක් පවතී. එකතු කල 32 වන වගඋත්තරකරු 2002 අංක 63 දරණ ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත අනුව ලබා දී ඇති බලපත්‍රයක පදනම මත වෙරළෙන් ඔබ්බෙහි ඉන්ධන සැපයීමේ මෙහෙයුමක් ආරම්භ කරන විට, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි කළමනාකාරීත්වය යටතේ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් ඔහුට එරෙහිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් 8.2 වගන්තිය බල ගන්වා ඇත. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් මෙම මෙහෙයුම මැඩ පවත්වා නැවැත්වීමට අධිකරණයෙන් නිෂේධ සහන ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර, ඉන්පසුව අභියාචනාධිකරණයේ ඇස්කීසි අයදුම්පතක් ගොනු කර ඇත. අවසානයේදී, 2002 අංක 63 පනතට අසංගත වන බැවින් එකී 8.2 වගන්තිය වලංගු නොවන බව අභියාචනා අධිකරණය විසින් නිගමනය කරන ලදී. 18 සිට 21 දක්වා වන වගඋත්තරකරුවන් (ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) / ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ) වෙනුවෙන් ජනාධිපති නීතිඥ ඉදිරිපත් කර සිටියේ, 8.2 වගන්තිය ඇතුලත් කිරීමෙන් කිසිවක් සිදු නොවූ බව සහ අදාළ අධිකරණවල නඩු තීන්දු හමුවේ පෞද්ගලීකරණය කිරීමෙන් පසු ඒකාධිකාරයක් නොතිබූ බවය. මා හට මෙම ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් එකඟවීමට අපහසුය. මෙම නඩුවෙහි විවාදයට බඳුන් වී ඇති කරුණු වනුයේ 8.2 වගන්තිය ඇතුලුව විධායක ක්‍රියාවන්ය. සාවද්‍ය විධායක ක්‍රියාවක් තමන්ගේ වාසිය සඳහා යොදා ගෙන, එම සාවද්‍ය විධායක ක්‍රියාව බල ගැන්වීම සඳහා අධිකරණය දක්වා ගිය පාර්ශවයකට අධිකරණමය ක්‍රියාවක් මගින් සාවද්‍ය ක්‍රියාව නිවැරදි කල බවට වූ කරුණ තමන්ට ආධාරකයක් ලෙස යොදා ගත නොහැකිය.

ලංසු තැබීමට පූර්ව සාකච්ඡාවේදී ජයසුන්දර විසින් පැහැදිලි ලෙස දක්වා සිටියේ මේ සඳහා ඒකාධිකාරයක් නොවන බවත්, සහ අනෙකුත් බලපත්‍ර නිකුත් කරන බවත්ය. ඔහු විසින් ප්‍රකාශිත ස්ථාවරයට පටහැනිව ඔහු දෙආකාරයකින් කටයුතු කරනු ලැබ ඇත. පළමුව, ඔහු විසින් ඉන්ධන සැපයුම් සීමා ලිහිල් කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම පර්ක් විසින් නිර්දේශ කල යුතුය යන පර්ක් හි අධ්‍යක්ෂ ඇතුළු නිලධාරී කමිටුවේ නිර්දේශ මත වූ අමාත්‍ය මණ්ඩලයේ තීරණයට අනුව ක්‍රියා කිරීමෙන් වැළකී සිටියේය. එමගින් ඔහු, අමාත්‍ය මණ්ඩලය බලාපොරොත්තු වූ තරඟකාරී ආධිපත්‍යය දියාරු කර, තත්වාකාර ඒකාධිකාරී අවස්ථාවක් ඇති කරන ලදී. දෙවනුව, ඔහු ඉමහත් කැමැත්තෙන් සහ කිසිදු උපදේශයක් ලබා ගැනීමෙන් තොරව, පැහැදිලි ලෙසම ඒකාධිකාරයක් පිහිටුවීමට අදහස් කල ප්‍රතිපාදනයක් වූ 8.2 වගන්තිය, පූර්වයෙන් නිකුත් කල කෙටුම්පතින් බැහැරව පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් ගිවිසුම (CUF) ට නිසගයෙන් ඇතුලත් කිරීමට එකඟ වී ඇත. ඉහත දක්වා ඇති පර්ක් නීතිය යටතේ, ජයසුන්දරගේ

කාර්යභාරය වූයේ රජයට උපදෙස් දීම සහ සහාය වීම පමණක් වූ අතර, අමාත්‍ය මණ්ඩලයේ පූර්ව තීරණයට සම්පූර්ණයෙන් පටහැනි ප්‍රතිඥාවකට රජය යොමු කිරීම නොවීය.

ජයසුන්දර විසින් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 18 (ඩී) හි 8.2 වගන්තිය පසුව ඇතුලත් කිරීම පිළිගෙන, එසේ සිදු කල පදනම මත එය සාධාරණීකරණය කිරීමට අදහස් කර ඇත.

> *“සියලුම ඉන්ධන සැපයුම් මෙහෙයුම්කරුවන් අතර එක හා සමාන වූ ව්‍යාපාරික අවස්ථා (සමාන ලෙස කටයුතු කිරීමේ ක්ෂේත්‍ර) පවත්වා ගෙන යාමට“*

මෙම අපූරු සාධාරණීකරණය පිලිබඳව මාගේ නිරීක්ෂණය වන්නේ “සමාන වූ ව්‍යාපාරික අවස්ථා (සමාන ලෙස කටයුතු කිරීමේ ක්ෂේත්‍ර)“ ඇති කිරීමට වූ ඔහුගේ අවබෝධය සිදුව ඇත්තේ එක් ක්‍රීඩකයකු සිටියදී ඒ සඳහා අදාළ පරිදි පමණක් බවය. ලංසු තැබීමට පූර්ව සාකච්ඡාවේදී ඉදිරියෙන්ම තබා ඇති ක්‍රියා මාර්ගයේ ස්ථාවරයට වඩා සම්පූර්ණයෙන් පටහැනි වෙමින් ඒකාධිකාරය අඛණ්ඩව පවත්වන බවට ඔහු වක්‍රාකාරයෙන් සහතික වී ඇත.

8.2 වගන්තිය ඇතුලත් කිරීම මගින් පිළිගෙන ඇති ‘අපගමනය‘ පිළිබඳ කාරණයේදී ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි භූමිකාව සම්බන්ධයෙන් ජනාධිපති නීතිඥවරයාගේ සමස්ථයට අදාළ ඉදිරිපත් කිරීම වූයේ, එම ක්‍රියාව සම්පූර්ණයෙන් සද්භාවයෙන් යුතුව කරන ලද්දක් බවත්, එයට ප්‍රදානය පිරිනමන ලද්දේ එම ලංසු මිලෙන් 105 ක් ගෙවීම සඳහා එකඟතාවයක් ලබා දුන් එකම ලංසු තබන්නා ඔහු වූ නිසා බවත්ය. ජයසුන්දර අපවාදයට ලක් කර ඇති ගනුදෙනුව සඳහා සහ / හෝ ඔහු විසින් සිදු කර ඇති අපගමනයන් කිරීම සඳහා නිසි පරිදි බලය ලබා දී හෝ අනුමැතිය ලබා දී ඇතිදැයි යන්න ගැනුම්කරු වශයෙන් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි වගකීම නොවීය. එම ඉදිරිපත් කිරීමෙහි ප්‍රධාන චෝදනාව වූයේ ගනුදෙනුව විකිණීමක් වූ බැවින් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) එහි වාණිජ යහපත වැඩි දියුණු කර ගැනීම සඳහා 8.2 වගන්තිය ඇතුලත් කිරීම සඳහා ඉල්ලීමක් කල බවත්, සහ දෘශ්‍යමාන බලයක් ඇතිව සිටි ජයසුන්දර එයට එකඟ වූ බවත්, සහ එම කරුණ හේතුවෙන් එම ගනුදෙනුව අවලංගු කල නොහැකි වන බවත්ය. නීතිඥවරයා එමගින් විවාදයට ලක්ව ඇති විධායක ක්‍රියාවේ නීත්‍යානුකූලභාවය පිළිබඳ නිර්ව්‍යාජභාවය ඇති බවට වූ අයැදීම තහවුරු කිරීමට සහයෝග කරයි.

තර්කය වූයේ, සහයෝගය ලබා දෙන හස්තයක් තිබියදී වැඩි යමක් ඉල්ලා සිටීමේදී නීති විරෝධී කිසිවක් එහි නොමැති බවය. මා හට නීතිඥවරයාගේ එකම යෝජනාවක් වත් පිළිගත නොහැකිය.

මෙය හුදු විකිණීමක් පමණක්ම නොවන බවත්, එය රාජ්‍ය සංස්ථාවක් විසින් හිමිකම දරණ ලද අතිශයින් ලාභදායී ව්‍යාපාරයක කොටස් විකිණීමක් බවත් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හොඳින්ම දැන සිටියේය. ගනුදෙනුවේ වලංගුභාවය සඳහා විනිවිදභාවය සහ නීතිය අනුව ක්‍රියා කිරීම අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු වේ. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) නියෝජනය කරමින් රත්නායක විසින් සහභාගි වූ ලංසුවට පූර්වයෙන් පැවති සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලද පදනම වූයේ, විකිණීමෙන් පසුව ඒකාධිකාරයක් නොපවතින බවත් සහ අනෙකුත් ඉන්ධන සැපයුම් සිදු කරන්නන් වෙත බලපත්‍ර නිකුත් කරනු ලබන බවත්ය. මෙම පූර්ව ප්‍රකාශය අත්‍යවශ්‍යයෙන්ම ලංසු තබන්නන් ඉහළ මිලක් සඳහන් කිරීමෙන් වලක්වන්නකි. කෙසේ වුවද, අමාත්‍ය මණ්ඩලයේ අරමුණ වූයේ ඒකාධිකාරය ආරක්ෂා කර ගනිමින් ඉහළ මිලක් ලබා ගැනීම නොවීය. ඉහත සඳහන් කර ඇති පරිදි, එය තරඟකාරීත්වය වැඩි දියුණු කිරීමට, ඉන්ධන සැපයුම් මිල අඩු කිරීමට, පහසුකම් වැඩි දියුණු කිරීමට සහ එමගින් රජයට තම ඉපයීම් වැඩි කර ගැනීමත් සඳහාය. මෙම පූර්ව ප්‍රකාශය විවෘත ප්‍රකාශ කිරීමෙන් පසුව, ජයසුන්දර විසින් ලංසුව භාර ගත් විටදීම, ක්ෂණිකව, රත්නායක විසින් 8.2 වගන්තිය ඇතුලත් කරවා ගැනීමට ඔහුව නම්මවා ගත්තේය. 8.2 වගන්තිය ඇතුලත් කරවා ගැනීම සඳහා ප්‍රකටව පෙනෙන අදහස වූයේ, පසුව ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි ක්‍රියා කලාපය අනුව ප්‍රත්‍යක්ෂ වී ඇති පරිදි, 32 වන එකතු කල වගඋත්තරකරුට

එරෙහිව ක්‍රියා කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය යොදවා ගෙන තරඟකරුවන් පලවා හැරීමටත් සහ ඉන්පසුව කෙලින්ම පසුව කී පාර්ශවයන්ට එරෙහිව නඩු පැවරීමටත්ය. එබැවින්, නිර්ව්‍යාජභාවය පිළිබඳ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකිය.

ඊළඟට සැළකිල්ලට භාජනය කල යුතු අංගය වන්නේ, ප්‍රශ්නයට බඳුන්ව ඇති අපගමනයට අදාළ ජයසුන්දරගේ බලතල පිළිබඳවය. මෙම ප්‍රශ්ණගත කරුණ සම්බන්ධයෙන් මෙහිදී සළකා බැලෙන නමුත්, එහි තර්කනය අපවාදයට ලක්ව ඇති ගනුදෙනුවේ සියලු පාර්ශවයන් වෙනුවෙන් යෙදිය යුතුය.

රාජ්‍ය නිලධාරියකුට තම ව්‍යවස්ථාපිත බලතලවලට ඉහළින් කටයුතු කල හැකිද සහ බීම සඳහා කියන ද්‍යශ්‍යමාන බලතලයක් මත පදනම් කර ගත්, රජයට බැඳියාවක් ඇතිවන ගිවිසුමකට ඇතුලත් විය හැකිද යන ප්‍රශ්නය සම්පූර්ණ වශයෙන් සලකා බලා, ශත වර්ෂ භාගයකට අධික කාලයකට පෙර නිගමනය කර ඇත. කාලය ගතවීමත් සමඟම නීතියේ මෙම මූලික ප්‍රස්තුතය අමතක වී ඇති බව පෙනී යයි. නීතිපතිට - එරෙහිව - ඒ. ඩී. ද සිල්වා නඩුවෙහි 54 එන්එල්ආර් 529 රාජාධිකරණය විසින් ද්‍යශ්‍යමාන බලතල ඇතැයි යන පදනම මත, රේගුවේ ප්‍රධාන අයකැමි විසින් රජයට අයත් යම් භාණ්ඩ වර්ගයන් ව්‍යවස්ථාපිත බලතල හෝ නිත්‍ය බලතල නොමැතිව විකුණා ඇති කරුණ සම්බන්ධව සලකා බලා ඇත. රාජාධිකරණයේ පහත දැක්වෙන නියමය ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි නීතිඥවරයා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රස්තුතයට නිසි පරිදි පිළිතුරු සපයයි.

*"ඊළඟට මතුවන ප්‍රශ්නය වන්නේ, නඩුව පවරා ඇති කොන්ත්‍රාත්තුවට අදාළව රේගුවේ ප්‍රධාන අයකැමිට බැඳියාවන් ඇති කල හැකි ද්‍යශ්‍යමාන බලතල තිබුනේද යන්නය. සියලු "ද්‍යශ්‍යමාන" බලතල, නියෝජිතයාගේ බලතල ප්‍රමාණය පිළිබඳව ප්‍රධානියාගේ නියෝජනය සමඟ බැඳී පවතියි. නියෝජිතයා විසින් තම බලතල පිළිබඳව කරනු ලබන නියෝජනයන් කිසිවක් ප්‍රධානියා විසින් "එය දරනු ලැබේ " යයි සැළකිය නොහැකිය. විශේෂ බලයක් සහිත අවස්ථාවකදී හැර මොනයම් හෝ රාජ්‍ය නිලධාරියකුට රජයේ දේපලක් පිළිබඳව සත්‍ය වශයෙන්ම එවැනි හිමිකමක් නොමැතිව තිබියදී, රජය වෙනුවෙන් ඔහුට හෝ වෙනත් රාජ්‍ය නිලධාරියකුට එවැනි අයිතියක් පවතී යයි දක්වා සිටිය නොහැකිය. එබැවින් ස්වාමීත්වය අදහස් කරන්නේ, නඩුවට අදාළ වස්තු විෂයය වූ භාණ්ඩ විකිණීම සඳහා කොන්ත්‍රාත්තුවකට ඇතුලත් වීම, රජය විසින් කරන ලද්දක් පරිද්දෙන් දැක්වෙන පරිදි රේගුවේ ප්‍රධාන අයකැමි හෝ ප්‍රධාන ලේකම් කරන ලද ක්‍රියාව, රජය විසින් කරන ලද්දක් වශයෙන් සැළකිය නොහැකි බවය. (අවධාරණය කොට ඇත.)"*

නඩු තීන්දුවේ පසු අවස්ථාවකදී, එම ස්වාමීත්වය විසින් රාජ්‍ය නිලධාරියකු ව්‍යවස්ථාවක් අනුව කටයුතු කිරීමේ අවස්ථාවක් සම්බන්ධයෙන් සළකා බලා නිගමනය කර ඇත්තේ, එවැනි අවස්ථාවකදී, බලතල ව්‍යවස්ථාවේ සීමාවන් වලින් "තදින් ස්ථිර කර" සිදු කරනු ලබන බවයි. රාජ්‍ය නිලධාරියකු විසින් කරනු ලබන යම් "නියෝජනයක්" රජයට බැඳියාවක් ඇති කරනු ලබන්නේ ව්‍යවස්ථාවේ ඒ ආකාරයට නිශ්චිත ප්‍රතිපාදන පවතී නම් පමණක් වන අතර, අර්ථකථනයක් වශයෙන් එය කියවීම ව්‍යවස්ථාවක අනිසි දිගු කිරීමක් වනු ඇත.

*"රේගු අණ්ඩා පනත යටතේ විකිණීමකදී, ගැනුම්කරුට දුෂ්කරතා ඇති කරයි යනුවෙන් කිව හැකි වන්නේ, ප්‍රධාන අයකැමිට එවැනි විකිණීමක් සිදු කිරීමට බලතල තිබුනේද හෝ නැතිද යන වග සොයා ගැනීමේ භාරය ඔහුට පැවරිය හැකි නම් බවයි. මෙය නිසැකයෙන්ම සත්‍ය වේ. එහෙත් රේගු අණ්ඩා පනත පිළිබඳව සළකා බැලීමේදී, එම පනත එකී අවශ්‍යතාවය පිළි පැදීමෙන් නිදහස් කිරීමේ බලය ඇතිව සිටියේ යයි නිගමනය කිරීම වන අතර, එවිට පවා බලතල නොලත් ක්‍රියාවන් බවට පත්වී ශූන්‍ය බවට පත්ව හෝ ආණ්ඩා පනතේ ප්‍රතිපාදනයන් දීර්ඝ කරනු ඇත. එම අනර්ථයන් දෙකින් මෙය බලවත් වනු ඇත. සැළකිල්ලට ගෙන ඇති*

*නඩුවෙහි මෙය දැක්වෙයි. රජයට අයත් දේපල පිළිබඳව යටත් වැසියට සමහර විට සෘජු හෝ සමහර විට වක්‍ර ප්‍රතිලාභයන් අත් විය හැකි අතර, යම් පුද්ගලයෙකුට ඉන් දුෂ්කරතා සිදු වනු ඇති වුවද, යටත් වැසියාගේ යහපත තකා එයට නිසි ආරක්ෂාව සැළසීම අවශ්‍ය වේ.*"

එම ඡේදයේ අවසන් වාක්‍යය, මෙම නඩු තීන්දුවේ පසු අදියරේදී රජයේ නීතිය පිළිබඳ දෘෂ්ඨිකෝණයෙන් මෙම ප්‍රශ්නය පිළිබඳව විමසීමේදී අදාල වේ.

රෝලන්ස් - එරෙහිව - නීතිපති නඩුවෙහිදී ඒ. ඩී. ද සිල්වා නඩුවෙහි නඩු තීන්දුව (74 එන්එල්ආර් පිටුව 385) අනුගමනය කර ඇත. එම නඩුවෙහිදී, අධිකරණය විසින් සළකා බලා ඇත්තේ, මුදල් අමාත්‍යවරයා ලබා දී ඇති සහතික වීමක් මත රජයේ වගකීමක් බල ගැන්වීම සඳහා දෘශ්‍යමාන බලතල මූලධර්ම යොදා ගත හැකිද යන්නය. අධිකරණය පහත පරිදි නිගමනය කර ඇත. ( පිටුව 410).

"*නියෝජිතත්වය පිළිබඳ ක්ෂේත්‍රයේදී, රජයට වගකීමක් පැවරීමට අපේක්ෂා කරන කොන්ත්‍රාත් වලදී, නියෝජිතයාට දෘශ්‍යමාන බලතල පමණක් අවශ්‍ය වනු ඇත යන පොදු නීතියේ දහම අදාළ නොවන අතර, ඔහුගේ බලතල සත්‍ය විය යුතුය. මෙම තත්වය පිළිබඳව ඇමරිකානු නීතියේ පැහැදිලි බලතල සඳහන්ව ඇති නමුත්, ඉංග්‍රීසි නීතියේ ඒ පිළිබඳව බලතල විරල බවක් ඇත. කෙසේ වෙතත්, දැන් අපගේ නීතියේ මෙම තත්වය පිළිබඳව පැහැදිලි නීති ඇත.*"

*මෙම ප්‍රස්තුතය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය පූර්වයෙන් දන්වා ඇති උපදේශ ඒ. ඩී. ද සිල්වා නඩුවෙහි දක්වා ඇත.*

අධිකරණය විසින් තවදුරටත් නිරීක්ෂණය කරන ලද්දේ, විශාල මුදලක් අදාළ වන කොන්ත්‍රාත්තුවකදී / ගිවිසුමකදී, රජය බැඳියාවකට නතු කිරීමේ බලතල තමන්ගේ වගකීම මත කටයුතු කරන තනි සාමාජිකයකු වෙත නොව, සමස්ථයක් වශයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත රැඳී ඇති බවය. (පී 405) එනම්, අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබිය යුතු බව හෝ ව්‍යවස්ථාදායක සභාව (පාර්ලිමේන්තුව) ඉදිරියට යා යුතු බවය.

409 වන පිටුවෙහි ප්‍රයෝජනවත් නිරීක්ෂණයක්ද පහත පරිදි දක්වා ඇත.

"*............. රජයේ කොන්ත්‍රාත්තුවල අන්තර්ගතය සම්බන්ධයෙන් නීතිමය සීමාවන් නොමැති වුවද, රජය ගිවිසුම් වලට සාමාන්‍යයෙන් ඇතුලත් වන්නේ නියමිත ස්ථිර ප්‍රමිතීන් සහ කොන්දේසි පදනම් කර ගෙනය. ........*"

පසුව සඳහන් කර ඇති, මෙම අධිකරණයේ ලබා දී ඇති නඩු තීන්දු වල විකාශය වන පරිදි, මෙය රජයේ නීතිය දෘෂ්ඨිකෝණයටද අදාළ වේ.

ඉහත සඳහන් හේතු මත නිර්ව්‍යාජත්වය පදනම් කර ගත් පසුව ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි (18 සිට 20 දක්වා වගඋත්තරකරුවන්ගේ) නීතිඥවරයාගේ ඉදිරිපත් කිරීම් මා හට පිළිගත නොහැකිය. ජයසුන්දරගේ සහාය පල කරන හස්තය මගින්, මෙම වගඋත්තරකරුවන් විසින් අනෙක් තරඟකරුවන්ට ඉහළින් වාසියක් ලබා ගත් බව පැහැදිලි වේ. මෙම වගඋත්තරකරුවන් විසින් නීති විරෝධී, අත්තනෝමතික සහ පක්ෂග්‍රාහී විධායක බලය අභ්‍යාස කිරීමක් මගින් ලබා ගත් දෙය ආරක්ෂා කර ගැනීම සඳහා, ජයසුන්දරගේ දෘශ්‍යමාන බලතල පලිහක් නොවනු ඇත.

අපගමනය (ii)

කියන ලද ඊළඟ අපගමනය වනුයේ, පොදු වශයෙන් 'බ්ලූමැන්ඩල් තෙල් ගබඩාව' වශයෙන් හඳුන්වනු ලබන අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක ඉඩම පිළිබඳවය. මම ' ....... පර්ක් විසින් කරන ලද ක්‍රියාවන් ....' ශීර්ෂය යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉඩමේ සින්නක්කර අයිතිය දරණ බව සහ එය ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) ට පැවරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇතැයි යනුවෙන් යෝජනා සඳහා ඉල්ලීම්හි 4.4.1 ඡේදයෙහි ඇතුලත් වන වගන්තිය සාවද්‍ය බව ඉහත සටහන් කර ඇත. එවකට ජාතික ආරක්ෂාව පිළිබඳ අමාත්‍යවරයා විසින් 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 2930 වගන්තිය අනුව, 1986.3.24 දින කරන ලද නියෝගයේ නියම වශයෙන් සඳහන් කර ඇත්තේ, එම ඉඩම සත්‍ය වශයෙන්ම කොළඹ වරාය සීමාව ඇතුලත පිහිටා ඇති බවය. පෙත්සම්කරු විසින් පී 33 දරණ නියෝගය ඇතුලත් ගැසට් පත්‍රය ඉදිරිපත් කර ඇති අතර, එහි ඇතුලත් කරුණු සම්බන්ධයෙන් ආරවුල් කර නැත. පෙත්සම්කරුට මෙම නියෝගය සම්බන්ධයෙන් අත පෙවීමට හැකි වී නම්, පර්ක් හි නිලධාරීන්ට සාධාරණ උද්‍යෝගයක් සහිතව එසේ සිදු කල හැකිව තිබුණි. යෝජනාවන් ඉදිරිපත් කල සියලුම පාර්ශවයන්ගෙන් නිශ්චිතව ඉල්ලා තිබුණේ, යෝජනා කැඳවීමේ නිවේදනයේ නියෝජනයන් මත විශ්වාසය නොතබා තමන්ගේම උද්‍යෝගයෙන් ඒවා සපයා ගන්නා ලෙසටය. එසේ හෙයින්, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හට යෝජනා කැඳවීමේ නිවේදනයේ 4.4.1 ඡේදයේ සඳහන් සාවද්‍ය ප්‍රකාශය කෙරෙහි විශ්වාසය තැබිය නොහැකිය. එය එසේ තිබියදී, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) මෙම ඉඩම අයත් සමාගමක් නොවන බව සහ එයට මොනයම් හෝ නෛතික හිමිකමක් නොතිබුණු බව පොදුවේ පිළිගත් කරුණකි.

ලංසු තැබීමට පූර්වයෙන් පැවති සාකච්ඡා වාර්තාවෙහි 5 වන ඡේදයේ පහත පරිදි සඳහන් වේ.

> *"ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ සිට ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත වත්කම් පැවරීම සඳහා වූ කාල රාමුව*
>
> *අ. සියලුම චංචල දේපල - ලංසු තැබීම අවසාන වන දිනට කලින්*
>
> *ආ. ඉඩම් - අවසාන දින සිට වසරක් ඇතුලත - ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් ගෙවිය යුතු වන ගෙවීම් ඇතුළුව පැවරීමේ විධිවිධානයන්ට අදාළව, 2002 මැයි 7 වන දින වන විට පර්ක් විසින් වාර්තා කල යුතුය."*

පෙත්සම්කරු විසින්, මෙම කොටස ප්‍රකාශිත පරිදිම පෙත්සමේ 25 (සී) ඡේදයෙහි දක්වා ඇති අතර, ජයසුන්දර විසින් පිළිතුරු දිය යුතුව තිබුණේ 2002.5.7 දිනට පැවරීමේ විධිවිධාන සහ කල යුතු ගෙවීම් පිළිබඳව ලංසු තබන්නන්ට දැනුම් දීමට අදහස් කලේ මොනවාදැයි යන්නය. ඉහත සටහන් කර ඇති පරිදි, මෙම දින වන විට කොළඹ වරාය ඇතුලත අක්කර 8 ඉඩමක් පැවරීම පසෙක තිබියදී වුවද, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි මොනයම් හෝ කොටස් විකිණීමක් පිළිබඳව අමාත්‍ය මණ්ඩලයට දැනුම් දීමක් කර නොතිබිණි. මේ සම්බන්ධයෙන් කිසිවක් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් ජයසුන්දරට හෝ පර්ක් වෙත බලය පැවරීමක් කර නොතිබුණි. දින 7 ඇතුලත ඉඩම පිළිබඳ මෙම වැදගත් තොරතුරු ලබා දීමට ජයසුන්දර අදහස් කලේ කුමන පදනමක් මතදැයි යන පටලැවිලි සහගත ප්‍රශ්නය පැන නඟී. ජයසුන්දර විසින් දිවුරුම් ප්‍රකාශයේ 27 (බී) සහ (සී) හි පහත පරිදි ප්‍රකාශ කර ඇත.

> *"(ආ) ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ව්‍යාපාරික ඇගයීමේදී එකී ඉඩම සැලකිල්ලට ගත් බැවින්, මෙම ශීර්ෂ ගත ඉඩමේ හිමිකාරිත්වය පැවරීමේදී වටිනා සැළකීමක් යන්නෙන් නිදහස් වීමක් නොවිය.*

*(ඇ) ලංසු තැබීමට පූර්වයෙන් පැවති සාකච්ඡාවේදී එකී ශීර්ෂගත ඉඩමේ හිමිකාරිත්වය පැවරීම පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡා කරන ලද්දේ පැවරීම කරන ආකාරය අතර ක්‍රියාත්මක කල යුතු ආධාරක යනාදිය පිළිබඳව අවසන් වශයෙන් නිගමනය කිරීම සඳහාය.*"

ඔහු විසින් ඉහත (ආ) හි ප්‍රකාශ කර ඇති කරුණු පිළිබඳව, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ව්‍යාපාරික ඇගයීමේදී ඉඩමේ වටිනාකම සැළකිල්ලට ගෙන ඇතැයි ඔහු විසින් දැනුම් නොදුන් බව සටහන් කර ගත යුතුය. අනික් අතට බලන විට ලංසු තැබීමට පූර්වයෙන් පැවති සාකච්ඡාව 2002.4.30 දින පවත්වා ඇති අතර, ඔහු ව්‍යාපාරික ඇගයීම ඩීඑෆ්සීසී වෙතින් ඉල්ලා සිටියේ 2002.5.15 දිනදී පමණක් සහ ඇගයීම් වාර්තාවේ යොදා ඇත්තේ 2002.6.10 දිනය බැවින්, ඔහුට මෙම තොරතුරු ලබා දීමේ හැකියාවක් නොමැත.

රත්නායක විසින් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 71 වන ඡේදයෙහි ප්‍රකාශ කර ඇත්තේ, පර්ක් විසින් ලංසු තැබීමට පෙර පැහැදිලි කිරීමේ ලිපිය සියලුම ලංසු තබන්නන් වෙත නිකුත් කර ඇත්තේ 2002.5.10 දිනදී බවත්, එහි ව්‍යක්ත ලෙස ප්‍රකාශ කර තිබුණේ එම ඉඩම පැවරීම සම්බන්ධයෙන් අතිරේක ගෙවීමක් සිදු කිරීමට නොම වන බවත්ය. ඔහු විසින් මෙම ලිපිය ඉසෙඩ් 18 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. රත්නායක විසින් සියලුම ලංසු තබන්නන් වෙත දැනුම් දුන් බව පවසා ඇතත්, මෙම ඉසෙඩ් 18 ලිපිය ඔහුට ඔහුගේ නමට පමණක් යොමු කර තිබීම සැළකිය යුතු කරුණකි. එය එම සාකච්ඡාවට සහභාගි වූ සියලුම පාර්ශව නම් ඇතුලත් කර ලංසු තැබීමට පූර්ව සාකච්ඡාවේ සටහන් සන්නිවේදනය කල ආකෘතිය අනුව සිදු වූවක් නොවේ. පර්ක් හි ලිපි ශීර්ෂයක පිටපත් කල ඉසෙඩ් 18 ලිපිය අත්සන් කර ඇත්තේ එහි අධ්‍යක්ෂ ජනරාල් වරයා විසිනි. එහි හුදෙක් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ " ..... ලංසු තැබීමට පූර්ව සාකච්ඡාවේදී අපේක්ෂා කල අතිරේක පැහැදිලි කිරීම් මේ සමඟ අමුණා ඇත." යන්නය. අමුණා තිබූ කඩදාසිය පර්ක් හි ලිපි ශීර්ෂයක පවා නොවීය. එහි සාකච්ඡාවට සහභාගි වූ පුද්ගලයින්ගේ කිසිම නම් ලැයිස්තුවක් අන්තර්ගතව නොතිබුණි. ලිවීමකින් තොරව යතුරු ලියනය පමණක් කර තිබූ අත්සනක් පවා නොතිබූ ලිපියේ ශීර්ෂය පහත පරිදි විය.

"ලංසු තැබීමට පූර්ව සාකච්ඡාවේ වැඩිදුර පැහැදිලි කිරීම්"

මම එම ලිපියෙහි අන්තර්ගතය ඇතුලත් කර නඩු තීන්දුව දිර්ඝ කිරීමට අදහස් නොකරන අතර, මිලට සංවේදී වන වැදගත් තොරතුරු එහි ඇතුලත්ව තිබූ බව ප්‍රකාශ කිරීම පමණක් ප්‍රමාණවත්ය. ඉඩමට අදාළ 5 වන ඡේදයෙහි සැළකිය යුතු ලෙස පහත පරිදි සඳහන්ව ඇත.

*" ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් බ්ලූමැන්ඩල් පාරේ පිහිටි ශීර්ෂගත ඉඩමේ හිමිකම වසරක කාලයක් ඇතුලත පවරා දෙනු ඇත. මේ සම්බන්ධයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත අතිරේක ගෙවීමක් සිදු නොකෙරෙනු ඇත. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විකිණීමට පූර්වයෙන් බත්තල් ඇතුළු සියලුම චංචල දේපල වල හිමිකම පවරා දෙනු ඇත.*"

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආවරණ ලිපිය අත්සන් කර තිබුණද, කොළඹ වරාය ඇතුලත වූ අක්කර 8 ක ඉඩම සඳහා වෙනම ගෙවීමක් සිදු කිරීමට අවශ්‍ය නොවන බව නියෝජනය නොවන අන්දමින් ඔහු ක්‍රියා කර ඇති ආකාරය අනුව පැහැදිලිව පෙනී යන්නේ, එම ලිපිය යවනු ලැබ ඇත්තේ ජයසුන්දරගේ උපදෙස් මත වන බවය. ඉතා ලිහිල් ආකාරයෙන් කඩදාසි කැබැල්ලක අත්සනක් පවා නොමැතිව, අක්කර 8 ක රජයේ ඉඩමක හිමිකම, කිසිදු ගෙවීමක් ලබා නොගෙන පවරා දෙන බවට වූ විශ්මයට පත් කරවන නියෝජනයක් සිදු කිරීම සඳහා ජයසුන්දර විසින් අමාත්‍ය මණ්ඩලයෙන් හෝ වෙන යම් අයෙකුගෙන් විධි නියෝගයක් ලබා නොතිබුණි. ප්‍රදානයක් මගින් හෝ බද්දක් මගින් රජයේ ඉඩමක් නාමික මිලක් මත හෝ

නිර්මූල්‍ය ලෙස නීතිමය වශයෙන් උරුම කර පවරන විටකදී, එය විස්තර කරනු ලබන්නේ 'විශේෂ ප්‍රදානය හෝ කල් බද්ද' වශයෙනි. එවැනි විශේෂ ප්‍රදානයක් හෝ කල් බද්දක් ලබා දීමට රජයේ ඉඩම් ආඥා පනතේ 6 (1) වගන්තිය මගින් ජනාධිපතිවරයාට බලය පවරා ඇත්තේ "පුණ්‍යමය, අධ්‍යාපනික, පරාර්ථකාමී, ආගමික හෝ විද්‍යාත්මක අරමුණක්" සඳහාය. ජනාධිපතිට පැවරී ඇති එම බලය පවා වර්තමානයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට යටත් කල යුතු වේ. (පසුව සඳහන් කර ඇත.) එනයින් ජයසුන්දර විසින් මෙම නියෝජනය සිදු කිරීමෙන්, ජනාධිපතිට පවා නොමැති බලයක් තමා වෙත ආරෝපණය කර ගෙන ඇත. ඉඩම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හිමිව තිබුණේ යයි සාවද්‍ය ලෙස උපකල්පනය කලේ වුවද, එවැනි නියෝජනයක් කල යුතුව තිබුණේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන නීති නිලධාරියාද පෙනී සිටි ලංසු තැබීමට පූර්වයෙන් පැවති සාකච්ඡාවේදීය. ලංසු තැබීමට පෙර 2002.4.30 දින සාකච්ඡාවට පසුව සහ ඉසෙඩ් 18 හි දිනය වන 2002.5.10 ට පෙර ජයසුන්දර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් උපදෙස් ඉල්ලා නැති බව පැහැදිලි වේ.

පූර්වයෙන් 'ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) ඇගයීම' යන මාතෘකාව යටතේ සලකා බලා ඇති සමහර කරුණු පිළිබඳව මම දැන් නැවත කෙටියෙන් සලකා බලමි. ඇගයීමක් කරන ලෙසට ඉල්ලා සිටින ලද ප්‍රධාන තක්සේරුකරු විසින් 2002.5.7 දිනැතිව ජයසුන්දර වෙත ලිපියකින් ලිඛිතව දන්වා සිටියේ වත්කම් ඇගයීම නිම වීමට ආසන්න බවත්, ව්‍යාපාරික ඇගයීම සඳහා එය ආරම්භ කිරීමට ප්‍රථම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කල දිරි දීමනා ගෙවීම සනාථ කරන ලෙසත්ය. පූර්වයෙන් සිදු කල විශ්ලේෂණයේදී ජයසුන්දර විසින් දිරි දීමනා ගෙවීම පිළිබඳව බැඳීමකට යටත් නොවී, ප්‍රධාන තක්සේරුකරු විසින් ඇගයීමක් ලබා දීම සාර්ථක ලෙස වලක්වා ඇති බව සටහන් කර ඇත. ඒ අයුරින් ප්‍රධාන තක්සේරුකරු හිරකර තබා, ඔහු විසින් ඉඩම සඳහා වෙනම ගෙවීමක් නොමැති බව ප්‍රකාශ කර ඇති ඉසෙඩ් 18 ලිපිය ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) වෙත 2002.5.10 දිනැතිව යොමු කිරීමට සැළැස්වීය. ඉන්පසුව 2002.5.15 දින ඔහු ඩීඑෆ්සීසී බැංකුවෙන් ව්‍යාපාරික ඇගයීමක් ඉල්ලා සිටියේය. එනයින් පැහැදිලි වන්නේ, මෙය ඩීඑෆ්සීසී හි ව්‍යාපාරික ඇගයීම වෙනම වත්කම් ඇගයීමක් මඟහැරීමට සහ ප්‍රධාන තක්සේරුකරු විසින් ව්‍යාපාරික ඇගයීම සිදු කිරීම වැළැක්වීම සඳහා ජයසුන්දර විසින් යොදා ගත් උපක්‍රමයක් බවයි.

මම දැන් අදාළ ඉඩමේ දෘෂ්ටිකෝණයෙන් පමණක් සිද්ධීන්හි අනුපිළිවෙල පිළිබඳව සළකා බලමි. ජයසුන්දර සහ රත්නායක අතර 2002.7.12 දිනැති ලිපි හුවමාරුවෙන්, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට ප්‍රදානයක් කිරීමෙන් පසුව අමාත්‍ය මණ්ඩලය විසින් කරුණු සළකා බැලීමටත් පවා පෙර පර්ක් විසින් අදාළ ගිවිසුම් අත්සන් කිරීමට සූදානම් කිරීමේ යෙදී සිට ඇත. අමාත්‍ය මණ්ඩලයේ තීරණය සනාථ කිරීමට එක් දිනකට පෙර එනම් 2002.8.20 දින ගිවිසුම් ක්‍රියාත්මක කරන ලදී. ඒවා නම් -

i) පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් ගිවිසුම (පී19(ඒ))
ii) කොටස් විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුම (පී19(සී))
iii) ඉඩම පැවරීම සඳහා නොතාරිස් ගිවිසුම (පී27)

ගිවිසුම් සඳහා රජයේ සියලුම පාර්ශවයන්හි සාක්ෂිකරුවන් වශයෙන් ජයසුන්දර සහ පර්ක් හි අධ්‍යක්ෂ ජනරාල් අත්සන් කර ඇත. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහාභාණ්ඩාගාර ලේකම් විසින් අත්සන් කර ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විකුණුම් සමාගම ලෙස විස්තර කර ඇති අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් ගිවිසුමෙහි පාර්ශවයක් පමණකි. අමාත්‍ය මණ්ඩල තීරණය බලාපොරොත්තුවෙන් පර්ක් විසින් මෙම ගිවිසුම සකස් කර ඇති බැව් ජයසුන්දර විසින් පිළි ගෙන ඇත. දැන් සළකා බලනු ලබන දෘෂ්ටිකෝණය අනුව, සැලකිය යුතු කරුණ නම්, ඉඩම පැවරීම සඳහා අත්සන් කල නොතාරිස් ගිවිසුමය. පැහැදිලි ලෙසම මේ ආකාරයේ ගිවිසුමක් පිළිබඳව යෝජනා කැඳවීම් ඉල්ලීම් හෝ ලංසු කැඳවීමේ පූර්ව සාකච්ඡාවේදී සඳහන් වී නොතාබුණි. එය පැන නැඟ ඇත්තේ

පූර්වයෙන් සඳහන් කල ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට යවන ලද විශේෂිත සන්නිවේදනයෙන් (ඉසෙඩ් 17) බව පෙනී යයි. පසුව සඳහන් වූ අමාත්‍ය මණ්ඩලයට යැවූ යෝජනාවෙහි රජය ඉඩම් පැවරීමේ ගිවිසුමක පාර්ශවයක් වන බවට කිසිම සඳහනක් නොමැත.

ජයසුන්දර විසින් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ (ඡේද 27 (ජී) සහ (කේ) හි මෙම ගිවිසුම පිළිබඳව වගකීම පවරා ගනිමින්, ඔහුගේ ක්‍රියාව සාධාරණීකරණය කිරීම සඳහා හේතු හතරක් ගෙන හැර දක්වා ඇත. ඒවා නම්;

අ) ඉඩම ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) සතු වත්කම්හි කොටසක් වූ බවත්;

ආ) ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ව්‍යාපාරික වටිනාකම ගණනය කිරීමේදී ඉඩමේ වටිනාකමද ඒ සඳහා ගණන් ගත් බවත්;

ඇ) අමාත්‍ය මණ්ඩල සංදේශයේ එය අනුමත කර ඇති බව ව්‍යංගයෙන් සඳහන් වූ බැවින්, අමාත්‍ය මණ්ඩලයේ විශේෂිත අනුමැතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොතිබූ බවත්;

ඈ) අංක 538 (පී27) දරණ ගිවිසුමට ඇතුලත් වී ඇත්තේ 'එකී ශීර්ෂගත ඉඩමේ හිමිකම පැවරීමට කර තිබූ ප්‍රතිඥාව ක්‍රියාත්මක කිරීමට බවත්'ය.

ලේඛනගතව ඇති සිද්ධීන්හි අනුපිළිවෙල අනුව, මේ සම්බන්ධයෙන් ජයසුන්දර විසින් දක්වා ඇති හේතු පරීක්ෂා කිරීමේදී විදහා දැක්වෙන්නේ, එම හේතු ඔහුගේම භූමිකාව වටා කේන්ද්‍රගත වී ඇති බවය. ඉඩම "වත්කම් වල කොටසක් බවට වූ" ප්‍රකාශය නොපැහැදිලි ප්‍රකාශයකි. ඉඩම නිශ්චල දේපලක් වන අතර, එහි හිමිකාරිත්වය අත්පත් කර ගැනීම සඳහා නීතියෙන් පැහැදිලිව අර්ථකථනය කල විධි පවතී. ප්‍රශ්නය වන්නේ අදාළ කාලයේදී එම ඉඩම නීතිය අනුව ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි වත්කමක් වීද යන්නයි. පිළිගෙන ඇති පරිදි එය එසේ නොවීය. එය කොළඹ වරායේ කොටසක් විය. යෝජනා කැඳවීමේදී 4.4.1 ඡේදයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉඩමේ සින්නක්කර අයිතිය දරණ බවට ඇති සාවද්‍ය ප්‍රකාශය සහ ඉඩම ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත පැවරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම යන්න ජයසුන්දරගේ සහ පර්ක් හි මනඃකල්පිතයක් පමණකි. කෙසේ වුවද, යෝජනා කැඳවීමේදී ඇති ප්‍රකාශයේ සත්‍යතාවය පිළිබඳව ලංසු තබන්නන් 'නිසි ක්‍රියාශූරත්වයක්" යොමු කර නොතිබූ බැවින් සහ ඉහත විශ්ලේෂණයේදී හෙලි වන පරිදි, මෙය පිළිබඳව ලංසු තැබීමට පූර්ව සාකච්ඡාවේදී බැඳීමක් ඇති කර ගෙන නොතිබූ බැවින්, මෙම සාවද්‍ය ප්‍රකාශය මත පමණක් කිසිවක් ඉටු නොවනු ඇත. මෙම ඉඩම සඳහා අතිරේක ගෙවීමක් අවශ්‍ය නොවන බවට වූ සන්නිවේදනය එහි හැරවුම් ලක්ෂ්‍යය විය. මෙම සහතිකය ලබා දී ජයසුන්දර ප්‍රධාන තක්සේරුකරුගෙන් වෙනම වත්කම් සහ ව්‍යාපාරික ඇගයීමක් ලබා ගැනීම මගහැර, ඩීඑෆ්සීසී බැංකුවෙන් ව්‍යාපාරික ඇගයීමක් පමණක් ලබා ගැනීමට ක්‍රියා කළේය. බැංකුව විසින් පාර්ලිමේන්තු කමිටුව ඉදිරියේ ප්‍රකාශිත ලෙස, ඔවුන්ගෙන් ශුද්ධ වත්කම් ඇගයීමක් ඉල්ලා සිටියේ නම්, ඒ සඳහා ඔවුන් විසින් නිශ්චල දේපල ඇගයුම්කරුවකුගේ සේවය ලබා ගැනීම කල හැකිව තිබුණු බව පිළි ගෙන ඇත.

වාර්තාවෙන් පෙනී යන පරිදි, ඉඩම ඇගයීම සිදු කර ඇත්තේ ඉතාමත් නොසැළකිලිමත් ආකාරයකිනි. ඉඩම පිළිබඳ සඳහන් කරනු ලැබ ඇත්තේ 'උපකල්පනය කල වර්තමාන වටිනාකමක්' සහිතව 'අවශේෂ වටිනාකමක්' සහිත අංගයක් වශයෙන් පමණකි. මෙම අවම ප්‍රකාශය පදනම් කර කටයුතු කරමින් සහ ශුද්ධ වත්කම් ඇගයීමක් ලබා ගැනීම පරික්ෂාකාරීව මගහරිමින්, ජයසුන්දර විසින් කිසිදු අනුමැතියකින් තොරව සහ නීති විරෝධී ලෙස ඉඩම සඳහා අතිරේක ගෙවීමක් අවශ්‍ය නොවන බවට පූර්වයෙන් සහතික වීමක් ලබා දී, ඔහුගේ ක්‍රියාවන් පිළිබඳව ව්‍යාපාරික ඇගයීම ඉල්ලා සිටීමට පෙර ව්‍යාපාරික ඇගයීම සඳහා ඉඩම ගණන් ගෙන ඇති බවට වූ පදනම මත ජයසුන්දර දැන් ආවරණය ලබයි.

පැවරීම සඳහා වූ ගිවිසුමේ පි 27 විකුණුම්කරු වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විස්තර කර ඇතත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉඩම සඳහා හිමිකමක් නොමැති බව ගිවිසුමේ විධිවිධාන සහ කොන්දේසි වලින්ම පැහැදිලි වේ. එබැවින් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) වෙත කිසිදු ගෙවීමකින් තොරව ඉඩම පවරා දීම තහවුරු කිරීම සඳහා, බැඳියාවක් ඇති රජය ඊට ඇඳා ගෙන ඇත. ගිවිසුම ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට කෙතරම් පක්ෂපාතීවිද යත්, ඉඩම නොමිලයේ පැවරිය යුතු බවත්, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් 90 % ක් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) වෙත විකිණීම "සැලසුම් කර තිබූ" පදනම මත ඊට අදාළ සියලුම වියදම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දැරිය යුතුය යන වගන්තියක් එම ගිවිසුමෙහි ඇතුලත් කොට ඇත. ඉසෙඩ් 18 ලියවිල්ලෙන් සාක්ෂි දරණ පරිදි, මෙම 'සැලසුම් කිරීම' සිදු කරන ලද්දේ ජයසුන්දර විසින් කරන ලද අනුමැතියක් නොමැති සන්නිවේදනයේ වීම සැළකිය යුතු කරුණක් වන අතර, එමගින් කොළඹ වරායේ ප්‍රකාශිත සීමාව ඇතුලත පිහිටා ඇති අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක ඉඩම මොනයම් හෝ අය කිරීමකින් තොරව, වර්ෂ එකක් ඇතුලත ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) වෙත පැවරීම "තහවුරු කිරීමට" ශ්‍රී ලංකා රජයට නීතිමය නොවන වගකීමක් පැවරුණි. කබලෙන් ලිපට වැටුණා සේ, එමගින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හට (වර්තමානයේ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට අයත්) ගිවිසුම බල ගැන්වීමට 'විශේෂිත කාර්ය සාධන සඳහා නියෝග" ලබා ගැනීමටද හිමිකමක් ඇත.

රජයේ ඉඩම් අන්සතු කිරීම සහ බැහැර දීම, පියවරක් පාසා නීතියෙන් විධිමත් කර ඇති කරුණක් වී, එය අවසානයේ පාලනය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් වන අතර, මෙහි පිළි ගෙන ඇති පරිදි ජයසුන්දර සහ පර්ක් විසින් සකස් කරන ලද එවැනි සාහසික නෛතික ප්‍රබන්ධයක විෂය වස්තුවක් වීමේ හැකියාවක් නොමැත.

ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) / ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) ගිවිසුම පී 27 යටතේ වූ තම අයිතිවාසිකම් හඹා යාම සඳහා වූ අතර, රජයට ඉඩම පැවරීම "තහවුරු කිරීම" සඳහා ප්‍රදානය කල වසර එකක කාලය දීර්ඝ කරවා ගැනීමට බල කෙරුණි. ඒ අනුව මෙම ගිවිසුමට සංශෝධන 4 ක් ඇතුලත් විය. අවාසනයේදී එවකට ජනාධිපතිනිය මෙම ඉඩමට අදාළව ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත ඉඩම් ආඥා පනත යටතේ ජනරජයේ රාජ්‍ය මුද්‍රාව සහිතව ප්‍රදානයක් සිදු කරන ලදී. එම ප්‍රදානය පිළිබඳ ලියවිල්ලේ (පී 30) ප්‍රකාශ කර ඇත්තේ, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් ජනරජයට රු. 1.199,362.500/- ක සැළකිය යුතු වටිනාකමක් ගෙවීමෙන් පසුව එය සිදු කර ඇති බවයි. මෙම ප්‍රකාශය සාවද්‍ය බව පොදුවේ පිළිගෙන ඇති කරුණකි. සත්‍ය වශයෙන්ම ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් රජයට මුදල් ගෙවීමක් සිදු කර නොමැත. එම මුදල ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් මිලදී ගැනීම සඳහා ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) විසින් 2002.9.6 වන දින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවන ලද මුදල වේ. එබැවින් එම ප්‍රදානය සැළකීම පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය යන හේතුව මත පමණක්ම නීතියෙන් කුටිල වේ. රාජ්‍ය මුද්‍රාව යටතේ රාජ්‍ය ප්‍රධානියකු මගින් කරනු ලබන මොනයම් හෝ ප්‍රදානය පිළිබඳ ලියවිල්ලක සත්‍යයේ පවිත්‍රතාවය පැවතිය යුතුය. සාමාන්‍ය අවස්ථාවකදී, රජයට කරනු ලබන ගෙවීමක් පිළිබඳ ප්‍රකාශයක් කල නොහැකි වන්නේ, එය මහාභාණ්ඩාගාරය විසින්ද පරීක්ෂා කල යුතු බැවිනි. එහෙත් කණගාටුදායක ලෙස එම පරීක්ෂාව සිදුව නැත්තේ, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට වාසිදායක අයුරින් ඉඩම වෙනුවෙන් අතිරේක ගෙවීමක් අවශ්‍ය නොවනු ඇතියි ප්‍රබන්ධයක් නිර්මාණය කිරීමට වග කිවයුතු වූ ජයසුන්දර, දැන් මහාභාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් තනතුරු හොබවමින් සැපසේ සැහැවී සිටින බැවිනි.

ප්‍රදානය පිළිබඳ ලියවිල්ලේ (පී 30) වලංගුභාවය පරික්ෂා කර බැලිය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ ප්‍රතිපාදන අභිමුවේදීය.

1987.11.14 දින සහතික කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් ප්‍රතිපාදන සලසා ඇත්තේ පලාත් සභා පිහිටුවීම සඳහාය. සංශෝධනයෙන් හඳුන්වා දී ඇති 154ජී(1) ව්‍යවස්ථාවේ නව වන

උප ග්‍රන්ථයේ 1 වන ලැයිස්තුවේ සඳහන් කරුණු වලට අදාළව (පලාත් සභා ලැයිස්තුව) පලාත් සභාවලට ව්‍යවස්ථාදායක බලය පවරනු ලැබ ඇත. 154එෆ්(1) ව්‍යවස්ථාව අනුව අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත පලාත ඇතුලත විධායක බලය අභ්‍යාස කිරීමට 154සී ව්‍යවස්ථාව පලාත ඇතුලත 1 වන ලැයිස්තුවේ සඳහන් කරුණු වලට පැතිර යනසේ කටයුතු කිරීමට ආණ්ඩුකාරවරයාට බලය පවරයි. 154එෆ්(6) ව්‍යවස්ථාව අනුව, අමාත්‍ය මණ්ඩලය පලාත් සභාවට සාමූහිකව වග කිවයුතු සහ පිළිතුරු දිය යුතු වන්නේය. එනයින් පෙනී යන්නේ, 13 වන සංශෝධනයේ ප්‍රතිපාදන, පලාතක් ඇතුලත පලාත් සභා ලැයිස්තුවේ ඇතුලත් කාරණා සඳහා ව්‍යවස්ථාදායක සහ විධායක බලය ‘වෙස්මිනිස්ටර්‘ ආණ්ඩුක්‍රම ආකෘතියකට නැදෑකම් කියන පද්ධතියක් මත ලබා දී ඇති බවය. ඉඩම් විෂයයට සම්බන්ධ පලාත් සභා ලැයිස්තුවේ 18 වන අයිතමයේ පහත පරිදි සඳහන් වෙයි.

*‘ඉඩම් - ඉඩම් එනම් ඉඩම් මත අයිතිය, ඉඩම් භුක්තිය, ඉඩම් පැවරීම සහ අන්සතු කිරීම, ඉඩම් භාවිතය, ඉඩම් නිරවුල් කිරීම සහ ඉඩම් සංවර්ධනය කිරීම, උපග්‍රන්ථය 11 දක්වා ඇති ප්‍රමාණයට කිරීම සඳහා.*

*18 වන අයිතමයේ සඳහන් උපග්‍රන්ථය 11 හි පහත පරිදි ප්‍රකාශිතය.*

*“ඉඩම් සහ ඉඩම් නිරවුල් කිරීම“*

*රජයේ ඉඩම් ඉදිරියටත් ජනරජය සතු වනු ඇති අතර, 33(ඩී) ව්‍යවස්ථාව අනුව සහ අදාළ ලිඛිත නීති අනුව, නිශ්කාෂණය කල හැකිය. ඉහත ප්‍රකාශිත විෂයය පරිදි, පහත දැක්වෙන විශේෂ ප්‍රතිපාදනයට යටත් වූ පලාත් සභාවේ විෂයයක් විය යුතුය.*

*1. රජයේ ඉඩම් -*

*1.1 පලාතක් තුල රජයේ කාර්යයක් සඳහා අවශ්‍ය වන වෙන් කල හෝ සමගාමී විෂයයක රජයේ ඉඩම්, අදාළ කරුණ පාලනය වන නීති අනුව රජය මගින් භාවිතා කල හැකිය. එවැනි විෂයයක් පිළිබඳව, එකී ඉඩම් භාවිතා කිරීම සඳහා රජය විසින් අදාළ පලාත් සභාවෙන් අදහස් විමසිය යුතුය.*

*1.2 පලාත ඇතුලත පලාත් සභාවේ විෂයයක් සඳහා අවශ්‍ය වන රජයේ ඉඩම්, සෑම පලාත් සභාවකටම රජය විසින් ලබා දිය යුතුය. අදාළ කරුණ පාලනය වන නීති සහ ව්‍යවස්ථා අනුව, එවැනි රජයේ ඉඩම් පරිපාලනය,පාලනය සහ භාවිතා කිරීම පලාත් සභාව විසින් සිදු කල යුතුය.*

*1.3 මොනයම් හෝ පුරවැසියකුට හෝ මොනයම් හෝ සංවිධානයකට පලාත ඇතුලත රජයේ ඉඩම් අන්සතු කිරීම හෝ බැහැර දීම, අදාළ පලාත් සභාවේ උපදෙස් මත, කරුණ පාලනය වන නීති අනුව ජනාධිපති විසින් සිදු කල යුතුය.“*

රජයේ ඉඩම් ප්‍රදානයන් කිරීමට සහ බැහැර දීමට, රජයේ ඉඩම් ආඥා පනතේ 2 වන වගන්තිය සමඟ කියවෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(ඩී) ව්‍යවස්ථාව මගින් ජනාධිපතිට පවරා ඇති බලය, ඉහත දක්වා ඇති ‘උපග්‍රන්ථය 11‘ හි ප්‍රතිපාදන වලින් සීමා කර ඇති බව පෙනී යයි.

මට පෙනී යන පරිදි, පලාතක් ඇතුලත ඉඩම් වලට අදාළව ‘උපග්‍රන්ථය 11‘ මගින් අන්‍යොන්‍යව ක්‍රියා කරන නීතිමය ආධිපත්‍යයක් පිහිටුවයි. අන්සතු කිරීමේ සහ බැහැර දීමේ අවසාන බලය ජනාධිපති වෙත රැඳී තිබියදී, බලය අභ්‍යාස කිරීම ‘උපග්‍රන්ථය 11‘ හි කොන්දේසි තෘප්තිමත් කිරීමට යටත්ය.

1.3 ඡේදයෙහි දක්වා ඇති පූර්ව කොන්දේසියක් අනුව, රජයේ ඉඩම් අන්සතු කිරීම හෝ බැහැර දීම බල පවත්වන නීති අනුව අදාල පලාත් සභාවේ උපදෙස් මත පමණක් සිදු කල යුතුය. ආණ්ඩුකාරවරයා මගින් සන්නිවේදනය කරනු ලබන අමාත්‍ය මණ්ඩලයක් විසින් උපදෙස් ලබා දීම සිදු කල යුතුය. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයක් විසින් පලාත් සභාවට වග කිව යුතුය.

මෙම නඩුවේ කරුණු වලට අදාළව සැළකිල්ලට ගතු යුතු තවත් අංගයක් වන්නේ, 'උපග්‍රන්ථය 11' හි 1.1 ඡේදයෙහි වන ව්‍යංගත්වයයි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත අනුව සැකසූ පී 33 නියෝගය අනුව, ප්‍රශ්නයට බඳුන් වී ඇති ඉඩම පිහිටා ඇත්තේ කොළඹ වරාය තුල වන අතර, ඉහත 1.1 ඡේදය අනුව වරායවල් යනු වෙන් කල වස්තු විෂයයන් බැවින්, රජය විසින් ඉඩම් භාවිතා කල යුතු වන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ ඇතුලත් ප්‍රතිපාදන වලට අනුකූලවය. එබැවින්, පී 33 නියෝගය බල පවත්නා විට, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි වාසියට උද්දේසිත පරිදි ඉඩම අන්සතු කිරීම නීත්‍යානුකූල නොවේ.

ඉඩමට අදාළව කියාපා ඇති 'අපගමනය' පිළිබඳව නිගමනය සංක්ෂේප කරන්නේ නම්, මා දරණ මතය වූයේ එකී අපගමනය මගින් අන් අයට නීතිය යටතේ වූ ආරක්ෂාව අහිමි කරමින්, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට වාසිදායක වී ඇති බව පෙත්සම්කරු විසින් ස්ථාපිත කර ඇතිවා පමණක් නොව, කොළඹ වරායේ නිශ්චිත සීමා ඇතුලත පිහිටි අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක ඉඩම අන්සතු කිරීම පහත දැක්වෙන හේතු මත වලංගු නොවන බවය.

අ) රු. 1,199,362,500/- ක සැළකිය යුතු ගෙවීම මත ප්‍රදානය කර ඇති බවට වූ වැරදි සහගත ප්‍රකාශය.

ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 වන ලැයිස්තුවේ නව වන උපලේඛනයේ 11 උපග්‍රන්ථයේ 1.3 ඡේදයේ අවශ්‍යතා පරිදි, පලාත් සභාවේ උපදෙස් නොමැතිව ප්‍රදානය සිදු කර ඇති බැවින්.

ඇ) මෙම ඉඩම කොළඹ වරායේ නිශ්චිත සීමා ඇතුලත පිහිටා ඇති බැවින්, ශ්‍රී ලංකා වරාය අධිකාරි පනතෙහි විධිවිධාන අනුව ඉඩම භාවිතයට ගත හැකි වන්නේ රජයට පමණක් වන නිසාත්ය.

මම දැන් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට වාසිදායක වූයේ යයි කියන ලද තුන්වන අපගමනය පිළිබඳව සළකා බලමි.

**<u>අපගමනය (iii)</u>**

පෙත්සමෙහි 24 වන ඡේදයෙහි ප්‍රකාශ කර ඇත්තේ, ජයසුන්දර විසින් ලංසු තැබීමට පූර්වයෙන් පැවති සාකච්ඡාවේදී, රජය විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) ට එරෙහිව විසඳීමට ඇති නඩු කීම් භාර නොගන්නා බවට ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) සමඟ ඇතුලත්ව ඇති කොටස් විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුමේ (පී19(සී) 3.5 ඩී) වගන්තියේ ප්‍රකාශ කර ඇතත්, ඔක්ස්ෆර්ඩ් ජේ ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) සමාගම විසින් කර ඇති හිමිකම් පෑමට ආනුශංගිකව පැන නඟින ඕනෑම බැඳියාවක් සඳහා වගකීම රජයට පැවරෙන බවට ප්‍රතිපාදන සළසා ඇති බවයි.

මෙම කියා පෑම ජයසුන්දර විසින් ප්‍රතිශේධනය කර, ඔහුගේ දිවුරුම ප්‍රකාශයේ 27 වන ඡේදයේ ප්‍රකාශ කර ඇත්තේ, ඔක්ස්ෆර්ඩ් ජේ නඩුවෙහි හිමිකම් පා ඇති විශාල මුදල් ප්‍රමාණය පිළිබඳව හැර දැමීමක් කිරීමට

තීරණය කර තිබූ බවය. රත්නායක විසින්ද එම කියා පෑම ප්‍රතිශේධනය කරමින් ප්‍රකාශ කර ඇත්තේ, ජේ නඩුවට අදාළව හැර දැමීම කර ඇත්තේ 2002.5.24 දින කෙටි ලැයිස්තුගත කල ලංසු තබන්නන්ගේ රැස්වීමකදී බවය. (දිවුරුම් ප්‍රකාශයේ 85 ඡේදය බලන්න.) දිවුරුම් ප්‍රකාශයට අමුණා ඇති එම දිනයම දරණ ඉසෙඩ් 22 ලිපියෙන්ද මේ බව සනාථ වේ. පෙත්සම්කරු විසින්ම ඉදිරිපත් කර ඇති එම තත්වය පිළිබඳව වෙනත් කෙටි ලැයිස්තුගත කල ලංසු තබන්නෙකුට යවන ලද ලිපියකින්ද මේ බව සනාථ වේ. එබැවින් මා දරණ මතය වන්නේ, එවැනි අනුග්‍රහයක් ලබා දීම සඳහා වූ ජයසුන්දරගේ අධිබලය ප්‍රශ්නයට බඳුන් වී ඇතත්, එය සත්‍ය වශයෙන්ම සිදු කර ඇත්තේ පර්ක් කාර්යාලයේ පැවති කෙටි ලැයිස්තුගත ලංසු තබන්නන්ගේ රැස්වීමකදී බවය.

## එ. <u>ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි ලංසුව පිළිගැනීම</u>

තාක්ෂණික ඇගයීම් කමිටුවේ දිනයක් නොමැති වාර්තාව 2002.6.6 දින රැස්වීමට පසුව සකස් කර ඇති බවට අනුමාන කල හැකිය. කෙටි ලැයිස්තුගත ලංසු තබන්නන් 6 දෙනෙකුට "අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව" කොළඹ කොටස් වෙළඳපොල හුවමාරුවේදී ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් සඳහා මූල්‍ය ලංසු තැබීමට ඉඩ දෙන ලෙසට වාර්තාවෙන් නිර්දේශ කරයි. කොටස් 90 % ක ඇගයීම රුපියල් බිලියන 1.016 සිට රුපියල් 1.286 පරාසය ඇතුලත් වෙතැයි යන ඩීඑෆ්සීසී බැංකු ඇගයීම් වාර්තාව 2002.6.10 දිනැතිය. එය සළකා බැලීමේදී, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය කිරීම සඳහා නිර්දේශ කිරීමට පවා ජයසුන්දර සහ පර්ක් වෙත අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී නොතිබුණු අතර, එයින් අදහස් කලේ ඉල්ලීමක් නොමැතිව අමාත්‍ය මණ්ඩලයට උපදෙස් දීම වුවද එය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සඳහා නිසි අදියර එය විය. ඒ වෙනුවට ජයසුන්දර සමාන්තර ක්‍රියාවලි දෙකක් අනුගමනය කල බව පෙනී යයි.

පළමුව, එවකට විදුලි බල සහ බල ශක්ති අමාත්‍යවරයා වූ 2 වන වගඋත්තරකරු විසින් 2002.6.20 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කරන ලදී. එහි අන්තර්ගතයෙන් පැහැදිලි වන්නේ, පර්ක් විසින් සපයා ඇති තොරතුරු මත එය සකස් කර ඇති බවයි. එහි ලංසු තබන්නන් කෙටිලැයිස්තුගත කිරීම පිළිබඳව සහ ඩීඑෆ්සීසී බැංකුවේ ඇගයුම් පිළිබඳව නිශ්චිතව සඳහනක් ඇත. සැළකිය යුතු ලෙස එහි ප්‍රධාන තක්සේරුකරගෙන් ඇගයීමක් ඉල්ලුම් කර, එය හඹා නොගිය බවට සම්බන්ධිත සඳහනක් නොමැත. වඩාත් වැදගත් ලෙස එම සංදේශයේ ඉන්ධන සැපයුම් අංශය සීමා ලිහිල් කිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ තීරණය සම්බන්ධයෙන් මොනයම් හෝ සඳහනක් සිදු කර නොමැත. පර්ක් වෙත ප්‍රකට ලෙස සංදේශය සැකසීමේ වගකීම පැවරී තිබුන බැවින්, පූර්ව ප්‍රතිපත්ති තීරණය සඳහන් කිරීම සම්බන්ධිත අත හැරීමේ වගකීම පර්ක් වෙත පැවරේ. අධිකරණයේ කිසිදු විරෝධතාවයක් ගොනු කර නොමැති 2 වන වගඋත්තරකාර විසින් පරීක්ෂා කිරීමකින් තොරව පර්ක් විසින් ඉදිරිපත් කල කෙටුම්පතක් යොදා ගෙන ඇති බව ප්‍රත්‍යක්ෂය.

එය එසේ තිබියදී, පෙත්සම්කරු විසින් කියාපා ඇති පරිදි එම කරුණ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කලේ නම්, රජයට උපදෙස් දීම එකම කර්තව්‍යය වූ පර්ක් විසින්, මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සිය තීරණය ලබා දෙන තුරු ඒ පිළිබඳව තවදුරටත් කටයුතු කල නොහැකි විය යුතුව තිබුණි.

හිටපු ජනාධිපති විසින් 2002.8.7 දිනැති සංදේශයේ සඳහන් කර ඇති නිරීක්ෂණ (පී 14) වලින් හෙලිවන්නේ, 2 වන වගඋත්තරකරුගේ සංදේශය සංසරණය කර ඇත්තේ 2002.8.6 දිනදී පමණක් වන බවය. එබැවින්, අමාත්‍ය මණ්ඩලයේ එම කටයුත්ත පිළිබඳව කටයුතු කිරීමේ හදිසියක් නොතිබූ බව පෙනී යන අතර, සංදේශය පිළිබඳව තීරණය ගෙන ඇත්තේ 2002.8.12 දිනදී වන අතර, එය සනාථ කර ඇත්තේ 2002.8.21 දිනදීය.

එම තීරණයෙහි ප්‍රකාශිත පරිදි, එම කරුණ පිළිබඳව විදුලිබල සහ බල ශක්ති අමාත්‍යාංශය විසින් ක්‍රියා කල යුතු වේ.

පර්ක් විසින් ගෙන ඇති දෙවන ක්‍රියාමාර්ගය වූයේ, එහි යෝජනාව පිළිබඳව අමාත්‍ය මණ්ඩලය ඉදිරියේ කටයුතු කෙරෙමින් තිබෙන අතරතුරදී කොටස් විකිණීමේ කටයුතු අවසන් කිරීමේ නියැලුනු බවය. අමාත්‍ය මණ්ඩලය ඉදිරියේ කටයුතු කෙරෙමින් තිබෙන කරුණ හුදු විධිමත් කටයුත්තක් වශයෙන් ජයසුන්දර දුටුව බව පැහැදිලි වේ. 1996 අංක 1 දරණ පනතින් පර්ක් වෙත පැවරී ඇති බලතල වලට සම්පූර්ණයෙන් අතිරික්ත වශයෙන් කටයුතු කරමින්, ඔහු කෙටි ලැයිස්තුගත කල පාර්ශවයන්ගෙන් ලංසු කැඳවන ලදී. එනයින්, ඉහත සඳහන් කර ඇති සාවද්‍ය ක්‍රියාවලියෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට වාසිදායක වනසේ කරන ලද කෙටි ලැයිස්තුගත කිරීම අතීත සිද්ධියක් බවට පත්වෙයි. තවද, සැළකිලිමත් ලෙස ප්‍රධාන තක්සේරුකරු විසින් ඇගයීමක් කිරීම මගහරිමින්, සම්පූර්ණ වශයෙන් ජයසුන්දරගේ තීරණය මත ඩීඑෆ්සීසී බැංකුව විසින් කරන ලද ඇගයීමද අතීත සිද්ධියක් බවට පත්වී ඇත. ජයසුන්දර, ඔහු විසින්ම රුපියල් බිලියන 1.2 කට නියම කරන ලද අවම මිල අනුව ක්‍රියා කරමින්, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් 90 % කට ලංසු තැබීම සඳහා සුදුසුකම් ලැබීමට කොළඹ කොටස් වෙළඳපොල හුවමාරුවේ අවම මිලෙන් 10 % ක් ලංසු තැබීමේ බැඳුම්කරයක් / ඇපකරයක් ලබා දිය යුතු යැයි ලංසු තබන්නන්ගෙන් ඉල්ලා සිටියේය. ජයසුන්දර විසින් නියම කරනු ලැබූ ලංසු තැබීමේ බැඳුම්කරයේ අවසාන දිනය 2002.7.10 දිනය විය. එම දිනය වන විට 2 වන වගඋත්තරකරු වන අමාත්‍යවරයාගේ අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩල සාමාජිකයින් අතර පවා සංසරණය කොට නොතිබුණි. එහෙත් ජයසුන්දරගේ සහ පර්ක් හි පාර්ශවයෙන් කලබලකාරී ක්‍රියාකාරකම් සිදු වී ඇති අතර, 2002.7.10, 2002.7.13 සහ 2002.7.24 දින ඩේලි නිවුස් පුවත්පත් වල පල වූ එම සිද්ධීන් වල සමකාලීන විස්තරයක් පී 17 වශයෙන් සළකුණු කරමින් පෙත්සම්කරු විසින් ඉදිරිපත් කර අයැද සිටී.

මම දැන් ජයසුන්දර විසින් ප්‍රතිශේධනය නොකල පී 17 වාර්තා කර ඇති පරිදි වන සිද්ධීන් පිළිබඳව අවධානය යොමු කරමි. ජයසුන්දර විසින් 2008.7.8 දින ලංසු තබන්නන්ට දන්වා සිටියේ ඔවුන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වෘත්තීය සමිති සමඟ අවබෝධතා ගිවිසුමකට ඇතුලත් විය යුතු බවය. ලංසු තබන්නන් මෙම අවශ්‍යතාවයට විරෝධතාවය පල කර ඇති අතර, පුවත් පත් වල හෙලි කිරීම් හේතුවෙන්, ලංසු තබන්නන්ව 2002.7.10 දින ප.ව. 12.30 ට පර්ක් කාර්යාලයේදී පැවති රැස්වීමකට කැඳවා, එවැනි වෘත්තීය සමිති සමඟ ගිවිසුමකට ඇතුලත් වීමේ අවශ්‍යතාවයක් නොමැති බව දන්වා සිටින ලදී. ලංසු තබන්නන් පුවත් පත් වල පල කල පැමිණිල්ල වූයේ, ඔවුන්ට ලංසු තැබීමේ බැඳුම්කර ලබා දීමට තිබූ කාලය 10 වැනිදා ප.ව. 1.00 සිට ප.ව. 2.00 පමණක් වූ බැවින්, විදේශ සහකාරකයින් සමඟ වූ අයට සීමාසහිත කාල පරාසයක් තුල අවශ්‍ය උපදෙස් ලබා ගත නොහැකි වන බවය. ලංසු තැබීමේ බැඳුම්කරය ලබා දුන් එකම ලංසු තබන්නා වූයේ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) පමණකි.

ජයසුන්දර තමන් විසින්ම විකිණීම සඳහා කොටස් හුවමාරුවේදී ලංසු තැබීම 2002.7.12 දිනට නියම කර ලංසු තැබීමේ බැඳුම්කර ලබා දුන් එකම ලංසු තබන්නා ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) පමණක් වූ බැවින්, ලංසු තැබීමේ ක්‍රියාවලියේ තවදුරටත් කටයුතු කිරීම අනවශ්‍ය බව තීරණය කර, 2002.7.12 දිනැති ලිපියෙන් (පී 15 (ඒ)) ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි එස්. රත්නායකට " 2002 ජූලි 24 වන දින වන විට ගනුදෙනුව සමාප්ත කිරීමට ............... සහ ගිවිසුම් අත්සන් කිරීමට යෝජනා කර ඇත. " ලෙසින් දැනුම් දෙන ලදී. රත්නායක විසින් එම දිනයම වන 2002.7.12 (පී15) දිනැති ලිපියෙන් ජයසුන්දර අමතා ප්‍රකාශ කර සිටියේ, ජයසුන්දර දක්වා ඇති පරිදි ගනුදෙනුව සමාප්ත කිරීමට ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) කැමැත්තෙන් සිටින බවය.

එකම දිනැති ලිපි දෙක ලෙස බැලීමේදී යමෙකුට ඇතිවන සංකල්පනය වන්නේ රත්නායක සහ ජයසුන්දර මේසය අසල දෙපස අසුන් ගෙන ඒවා හුවමාරු කරගෙන ඇති බවය. එම ලිපි ෆැක්ස් මගින් හුවමාරු

කරගත් බව ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි නීතිඥයින් ඉදිරිපත් කර සිටින ලදී. ජයසුන්දරගේ ෆැක්ස් ලිපියේ වේලාව ප.ව. 4.45 ලෙස සටහන් වන අතර, රත්නායකගේ ෆැක්ස් ලිපියේ වේලාව ප.ව. 5.30 විය. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) විසින් ලියවිලි ඉදිරිපත් කර නොමැති අතර, මවිසින් එම වේලාවන් සටහන් කර ගෙන ඇත්තේ ඉදිරිපත් කිරීම් පදනම් කර ගනිමිනි. අනෙකුත් ලංසු තබන්නන්ගේ අපහසුතා කෙසේ වුවද, කාල නියමය රත්නායකගේ කටයුතු වලට හොඳින් ගැලපී ආයෝජන මණ්ඩලයේ 2002.7.11 දිනැති පි 27 ලේඛනයට අනුව (පසුව පෙත්සම්කරු විසින් ආයෝජන මණ්ඩලයෙන් ලබා ගෙන ඇති) ආයෝජන මණ්ඩලයෙන් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) වෙත දන්වා ඇත්තේ, මීට අදාළ බදු සහන ලබා දීම සඳහා අයදුම්පත අනුමත කර ඇති බවය. මම දැනටමත් 'ඊ' ශීර්ෂය යටතේ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) විසින් බදු සහන ලබා ගත් වැරදි සහගත සහ නීති විරෝධී ආකාරය පිළිබඳව සළකා බලා ඇත.

පි 16 ලිපිය මගින්, රත්නායක වහාම සහ පැකිලීමකින් තොරව ගනුදෙනුව සමාප්ත කිරීමට එකඟ වී, ඔහු විසින් ඉහත සඳහන් පරිදි පි 18 (ඒ) ලිපිය යවමින්, පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් ගිවිසුමේ 8.2 වගන්තිය සංශෝධනයක් වශයෙන් සහනය ඇතුලත් කරවා ගනිමින්, තරඟකරුවන් ඉවත් කිරීම සඳහා ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) අපේක්ෂා කල පදනම මත ඉහත 'ඊ අපගමනය' හි දක්වා ඇති පරිදි ජයසුන්දරගෙන් නොකඩවා වැඩිපුර සහන ලබා ගැනීමට කටයුතු කලේය.

පි 15 (ඒ) දරණ ලේඛනයෙන් පෙනී යන පරිදි, අමාත්‍ය මණ්ඩල සංදේශය සංසරණය කිරීමට ඉතාමත් කලින්, එනම් 2002 ජූලි 24 වන දින වන විට ගිවිසුම් අත්සන් කරන බව ජයසුන්දර විසින් ප්‍රකාශ කර ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය අපේක්ෂාවෙන් පර්ක් විසින් සියලුම ගිවිසුම් සූදානම් කොට තැබූ බව ඔහු විසින් පිළිගෙන ඇත. මෙම ගිවිසුම බරපතල ලෙස ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට වාසිදායක අයුරින් පක්ෂපාතීව සකස් කර ඇති බව සහ අමාත්‍ය මණ්ඩල සංදේශයේ පවා සඳහන් කර නොමැති වගකීම් ශ්‍රී ලංකා රජය වෙත පවරා ඇති බව, ඉහත 'ඊ' හි මවිසින් දක්වා ඇත. ජයසුන්දරගේ ඉවසිලි රහිත බව එයට මඟ සළසා ඇති බව පෙනී යන අතර, සත්‍ය වශයෙන්ම අමාත්‍ය මණ්ඩල සනාථ කිරීමට දින එකකට පෙර එනම් 2002.8.20 දින ගිවිසුම් අත්සන් කරනු ලැබ ඇත. උපහාසාත්මක කාරණය වන්නේ, මේ සම්බන්ධව විදුලි බල සහ බල ශක්ති අමාත්‍යවරයාට ක්‍රියා කිරීමට පැවරීම අමාත්‍ය මණ්ඩලයේ තීරණය වූවා මිස, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ජයසුන්දර සහ පර්ක් හට පැවරීම එහි තීරණය නොවීමය.

පූර්වයෙන් සඳහන් 'අ' සිට 'එ' දක්වා වූ කොටස්වල විශ්ලේෂණයන් පදනම් කර මාගේ සොයා ගැනීම් සාරාංශයක් කොට පහත පරිදි දක්වමි.

1. කොළඹ වරාය ඇතුලත ගබඩා කිරීමේ ටැංකි 12 කින් සහ ඩොල්ෆින් නැංගුරම්පොල සහ දකුණු ජැටිය එකිනෙකට සම්බන්ධ කල නල ජාලයක් සහිතව, හොඳින් සංවර්ධනය කල පහසුකම් සහිත, සමුද්‍ර ඉන්ධන සැපයීමේ ඒකාධිකාරය ඇතිව සිටි ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL), ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට (CPC) සම්පූර්ණයෙන්ම අයත්ව තිබූ සමාගමකි.

2. ඉන්ධන සැපයීම මූල්‍යාදායක ව්‍යාපාරයක් වූ අතර, 2000/2001 වර්ෂය සඳහා ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) රුපියල් මිලියන 318 ක ලාභයක් උපයාගෙන, රුපියල් මිලියන 163 ක් ආදායම් බදු වශයෙන් ගෙවා ඇත.

3. කොළඹ වරායේ අද්විතීය පිහිටීම හේතුවෙන්, ඉන්ධන සැපයුම් සේවා වැඩි දියුණු කර, පුළුල් කර රජයට අතිමහත් ආර්ථික ප්‍රතිලාභ ලැබෙන ලෙස කටයුතු කිරීමේ හැකියාව තිබුණි.

4. අමාත්‍යවරුන් කිහිප දෙනෙකු විසින් පල කරනු ලැබූ සැළකිල්ල කරණ කොට ගෙන, ඉන්ධන සැපයුම් කිරීම සීමා ලිහිල් කිරීම සඳහා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයට 200.5.24 දිනැතිව යෝජනා කල අතර, එම යෝජනාව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙහි (පර්ක්) අධ්‍යක්ෂවරයා ඇතුළු නිලධාරි කමිටුවකට යොමු කරන ලදී.

5. අමාත්‍ය මණ්ඩලය විසින් සමුද්‍ර දූෂණය වැනි සීමා ලිහිල් කිරීමේදී සැළකිල්ලට ගත යුතු සියලුම කරුණු අවධානයට ගනිමින්, සැළකිලිමත් උපාය ඥානයක් අනුමත කර, කොළඹ වරායෙන් පිට ඉන්ධන සැපයුම් සේවා සඳහා පෞද්ගලික අංශයේ මෙහෙයවන්නන්ට බලපත්‍ර 3 ක් ලබා දීමට ක්‍රියාවලියක් නිර්දේශ කරන ලෙසට, පර්ක් වෙත බලතල ලබා දෙන ලදී. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හට වර්ෂ එකක කාලයක් තවදුරටත් කොළඹ වරාය තුල ඒකාධිකාරයක් පවත්වා ගැනීමටත්, සම්පූර්ණයෙන් සීමා ලිහිල් කල අවස්ථාවකදී පෞද්ගලීකරණය කිරීමටත් වශයෙනි.

6. පී. බී. ජයසුන්දර සභාපතිත්වය හෙබ වූ පර්ක් විසින් බලපත්‍ර 3 ක් ලබා දීමේ ක්‍රියාවලිය සඳහා නිර්දේශයන් කිරීම පැහැර හැරිය අතර, කිසිදු අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් 90 % ක් විකිණීමේ ක්‍රියාවලියක් සිදු කර ගෙන ගොස් ඇත.

7. ජයසුන්දර විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා තුන් දෙනෙකු නම් කල අතර, එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම් මෙම තිදෙනා පත් කරනු ලැබීය. එහෙත් ජයසුන්දර අමාත්‍ය මණ්ඩලය අනුමත කල ටෙන්ඩර් මණ්ඩලයක් හෝ අමාත්‍ය මණ්ඩලය අනුමත කල සාකච්ඡා කිරීමේ කමිටුවක් පත් කරවා ගැනීමට අපොහොසත් විය. එමගින්, ඔහු මෙම කරුණ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම මඟහරවා, සියලුම කටයුතු පිළිබඳ තීරණය කිරීමේ බලතල තමන් වෙතම රඳවා ගත්තේය.

8. සියලුම අපවාදයට ලක්වූ තීරණයන් ගෙන ඇත්තේ සම්පූර්ණයෙන්ම ජයසුන්දර විසින් තම අභිමතය පරිදි බව ලේඛන වලින් පැහැදිලිව ස්ථාපිත වෙයි.

9. 1996 අංක 1 දරණ පර්ක් පනත මගින්, ජයසුන්දර සභාපති වූ කොමිසමට බලය පවරා තිබුණේ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය සඳහා රජයට උපදෙස් දීමට සහ සහාය වීමට සහ රජය අනුමැතිය දෙනු ලබන්නේ නම් යම් කරුණක් පිළිබඳව ක්‍රියා කිරීමට හෝ ගනුදෙනු කිරීමට පමණකි.

10. ජයසුන්දර විසින්, රජය මගින් අනුමැතිය ලබා දී ඇති පරිදි ඉන්ධන සැපයුම් වෙළඳාම සීමා ලිහිල් කිරීමට ක්‍රියා කිරීම පැහැර හැරිය අතර, රජයේ කිසිදු අනුමැතියකින් තොරව ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් විකිණීමේ ක්‍රියාවලියක් සිදු කර ගෙන ගොස්, එමගින් ඒකාධිකාරය සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මකව තිබියදී ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් මිලදී ගන ලබන්නාට ප්‍රතිලාභ ලැබෙන පරිදි කටයුතු කර ඇත.

11. ජයසුන්දර ප්‍රධාන තක්සේරුකරුගෙන් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ඇගයීමක් ලබා ගැනීම මඟහැර, ඒ වෙනුවට රජයේ අනුමැතියකින් තොරව, තමන් විසින්ම ඩීඑෆ්සීසී බැංකුවෙන් ඇගයීමක් ලබා ගෙන, එම ඇගයීම පදනම් කර ගෙන ලංකා

මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් විකිණීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කර ඇත.

12. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින්, ඉන්ධන සැපයුම් වෙළඳපොල මූලිකයෙක් වූ ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM), ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි සහයෝගිතාවය ඇතිව ඉදිරිපත් කල ලංසුව, ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM) විසින් ඔවුන්ගේ බද්ධ ලංසුවෙන් ඉවත් වන බව දන්වා තිබියදීත් කෙටි ලැයිස්තුගත කිරීමෙන් වරදක් සිදු කර ඇත.

13. කෙටිලැයිස්තුගත කිරීමට අවශ්‍ය වූ ලකුණු 70 ලබා ගැනීම සඳහා ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) විසින් ෆුවල් ඇන්ඩ් මැරයින් මාකටින් (FAMM) සමඟ සහයෝගිතාවයක් ඇති බවට ව්‍යාජ නියෝජනයක් සිදු කර ඇත. මෙම ව්‍යාජත්වය ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) විසින් විදේශ ආයෝජකයකු පිළිබඳ කිසිදු සඳහනක් නොකර, ආයෝජන සහන සඳහා ආයෝජන මණ්ඩලයට (BOI) සමගාමීව කරන ලද අයදුම්පත මගින් තහවුරු වේ.

14. ලංසු තැබීමේ සාකච්ඡාවට ඉදිරිපත් කල අවනියෝජනයන් පිළිගැනීමට පෙර පවා, කොටස් විකිණීමේදී තමන්ගේ වාසියට එය සාර්ථක වනු ඇතැයි ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හට විශ්වාසයක් තිබූ බැවින්, එය ලංසු තැබීමේ ක්‍රියාවලියට පෙර අයදුම්පත් වන ආයෝජනයක පදනම මතය යන ව්‍යාජ සංකල්පනාව මත ආයෝජන මණ්ඩලය (BOI) ට ඉල්ලුම් කල අතර, අයදුම්පතේ සඳහන් කර තිබූ සියලුම විස්තර ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පිළිබඳව විය. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) වෙත ලබා දුන් බදු සහනය සඳහා පවත්නා රෙගුලාසි අනුව අවස්ථාව ලබා දිය නොහැකි වූ නමුත්, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) එහි කාර්යයට ගැලපෙන සේ ඉතාමත් සුදුසු පරිදි සංශෝධනයක් සිදු කරවා ගෙන, බදු සහනය ලබා ගෙන ඇත. මෙහි ප්‍රතිඵලය වූයේ ලංකා ඛනිජ තෙල් සංස්ථාවට අයත්ව තිබියදී බදු ගෙවන සමාගමක් වූ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL), ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට විකුණූ පසුව බදු වලින් නිදහස් සමාගමක් බවට පත්වීමය.

15. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට වාසිදායක වනසේ ජයසුන්දර ලංසු තැබීමට පූර්ව සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලද කරුණු වලට එරෙහිව සැළකිය යුතු අපගමනයන් සමහරක් සිදු කර ඇත. විශේෂිත වශයෙන්, ලංසුව පිළි ගැනීමෙන් පසුව ජයසුන්දර විසින් පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් ගිවිසුමට (CUF) වගන්තියක් ඇතුළු කිරීමට එකඟ වී ඇති අතර, එහි පදනම මත පසුව අමාත්‍යවරයාගෙන් බලපත්‍ර ලබා ගත් වෙනත් පාර්ශවයන්ගෙන් ඉන්ධන සැපයීමේදී තරඟකාරීත්වය වැළැක්වීම සඳහා ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) විසින් හිමිකම දරණ ලද ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) උත්සාහ දරා ඇත. ජයසුන්දර විසින් එලෙස එකඟ වන ලද වගන්තිය නීති විරෝධී යයි අභියාචනාධිකරණය විසින් කපා හැර ඇත.

16. ජයසුන්දර විසින් කොළඹ වරාය ඇතුලත වූ අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක් වූ ඉඩම ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් මිලදී ගන්නාට කිසිදු ගෙවීමකින් තොරව පවරන බවට අනුමැතිය රහිත, නීති විරෝධී නියෝජනයක් සිදු කර ඇත. ඔහු මෙම නියෝජනය ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ව්‍යාපාරික ඇගයීමේදී ගණන් ගෙන ඇතැයි යන පදනම යටතේ සාධාරණීකරණය කිරීමට උත්සාහ ගෙන ඇතත්, සිද්ධීන්හි අනුපිළිවෙල අනුව ජයසුන්දර විසින් මෙම නියෝජනය සිදු කර ඇත්තේ

ඔහු විසින් ඩීඑෆ්සීසී බැංකුවෙන් ව්‍යාපාරික ඇගයීමක් ඉල්ලා සිටීමටත් පෙර බව ස්ථාපිත වේ.

17. ඉඩම පිළිබඳ අනුමැතිය රහිත, නීති විරෝධී නියෝජනය සම්බන්ධයෙන් ජයසුන්දර විසින් තවදුරටත් කටයුතු කරමින්, ශ්‍රී ලංකා රජයට කිසිදු ගෙවීමකින් තොරව, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත ඉඩම පැවරීමට බැඳියාවක් ඇති වන පරිදි නොතාරිස් ගිවිසුමකට ඇතුලත් වීමට කටයුතු කල අතර, පැවරුමට අදාළ වියදම් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් දැරිය යුතු විය.

18. වසර 2 ½ කට පසුව ජනාධිපති විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) ට එකී ඉඩම ප්‍රදානය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ ප්‍රතිපාදන වලට පටහැනි වන බැවින්, නීති විරෝධී වන අතර, කෙසේ වුවද ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් ගෙවීමක් කර නොතිබියදී එහි රුපියල් 1,197,362.500/- ක සැළකිය යුතු ගෙවීමක් කර ඇති බවට සාවද්‍ය ප්‍රකාශයක් ඇතුලත් කර ඇත.

19. ලංසු තබන්නන් හට නොමග යවන තොරතුරු ලබා දී, ජයසුන්දර විසින් ලංසු තැබීමේ ක්‍රියාවලිය කඩිනම් කර, විෂය භාර අමාත්‍යවරයා විසින් යෝජනාව අමාත්‍ය මණ්ඩලය අතර සංසරණය කර හෝ නොතිබියදී, රත්නායක සමඟ 2002.7.12 දින ලිපි හුවමාරු කර ගනිමින්, උද්දේසිත ලෙස ගනුදෙනුව අවසන් කරන ලදී.

ඉහත සඳහන් සොයා ගැනීම් පදනම් කර, මම නිගමනය කරන්නේ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) වෙත ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් විකිණීමේ සමස්ථ ක්‍රියාවලියම නෛතික බලයක් නොමැතිව සිදු කර ඇති බවය. 8 වන වගඋත්තරකරු සහ එවකට රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති වූ ජයසුන්දර, එම ක්‍රියාවලිය ආරම්භයේ සිටම බලපවත්නා නීතිය වූ 1996 අංක 1 දරණ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත යටතේ සහ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ තීරණයෙහි අන්තර්ගත කර ඇති පරිදි, නිල නියෝගය ලෙස එම කොමිසමට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී තම බලතල ඉක්මවා කටයුතු කර ඇත. ඔහු නීතියට පටහැනි ලෙස ක්‍රියා කරනු ලැබුවා පමනක් නොව, උද්දේසිත ලෙස රජයේ විධායක බලය තමන් වෙත ආරෝපණය කර ගෙන ඇත. ඔහුගේ ක්‍රියාව නීති විරෝධී වනවා පමණක් නොව, එය නෛතික බලතල ඉක්මවා කටයුතු කිරීමක් සහ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ට වාසි දායක වන සේ පක්ෂපාතීවීමක් වී ඇත.

ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි දෘෂ්ඨිකෝණයෙන් බලන විට, මම දරණ මතය වන්නේ, එම සමාගම නීති විරෝධී ක්‍රියාවලිය සහ නිශ්චිත අවස්ථාවන්වලදී සිදු කර ඇති අවනියෝජනයන් මගින් වාසි සහ ප්‍රතිලාභ ලබා ගෙන ඇති බවය.

නීතිය ඉදිරියේ සමානාත්මතාවය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික වී ඇති නීතිය යටතේ සමාන ආරක්ෂාව ලැබීම උල්ලංඝනය වී ඇතැයි යන කියාපෑම පිළිබඳව, ඉහත සඳහන් සොයා ගැනීම් වලට අදාළව මා විසින් සළකා බැලිය යුත්තේය.

මනාව ස්ථාපනය කර ඇති අපගේ ව්‍යවස්ථාමය නීති තුන මේ හා සම්බන්ධයෙන් සඳහන් කල යුතු වේ. ඒවා නම් -

i) මෙම අධිකරණයේ විශ්වලිංගම් - එදිරිව - ලියනගේ ( 1983 1 එස්එල්ආර් පිටුව 236) හි සහ ප්‍රේමචන්ද්‍ර - එදිරිව - ජයවික්‍රම නඩු තීන්දු වල සංගත ලෙස දක්වා ඇති පරිදි, සහ ඉන්පසුව ලබා දුන් තීන්දු ගණනාවක දක්වා ඇති පරිදි, අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

පදනම වී ඇත්තේ නීතියේ ආධිපත්‍යයයි. නීතියේ ආධිපත්‍යය අත්තනෝමතික බලයට එරෙහිව සාමාන්‍ය නීතියේ ඒකාන්ත ශ්‍රේෂ්ඨත්වය හෝ ප්‍රමුඛතර බව පූර්ව ග්‍රහණය කරයි. එය රජයේ පාර්ශවයෙන් පරමාධිකාරී හෝ පුළුල් අභිමතානුසාරී බලයේ අත්තනෝමතික බවක් පැවරීම බැහැර කරයි. (ඒ. වී. ඩයිසිගේ ව්‍යවස්ථාදියක නීතිය - පිටුව 202 බලන්න.). ඉංග්‍රීසි ව්‍යවස්ථාදායක නීතියට මුල් අවධියේ උපදේශ සහ ලිඛිතයන්ගෙන් දායකත්වය ලබා දුන් ප්‍රසිද්ධ බ්‍රිතාන්‍ය අගවිනිසුරු කෝක් සාමිවරයාගේ විචිත්‍රවත් භාෂාවෙන් ප්‍රකාශ කර ඇත්තේ, නීත්‍යානුකූලභාවයේ මූලධර්මය, නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කර, "අවිනිශ්චිත සහ වංක රජනේ අභිමතය" ට ප්‍රතිවිරුද්ධ ලෙස "ස්වර්ණමය සහ ඍජු දිව්‍ය යෂ්ටිය" මගින් රජයේ බලයන් අභ්‍යාස කරනු ලබන බවට තහවුරු කරනු ලබන බවය.

ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යෝජිත 19 වන සංශෝධනයේ ව්‍යවස්ථාදායක ස්වභාවයට අදාළව විනිසුරුවරුන් සත් දෙනෙකුගෙන් යුත් බෙදුණු විනිසුරු මඬුල්ලේ නිර්ණයේ ස්ථිරව දක්වා ඇති පරිදි ( 2002 3 එස්එල්ආර් පිටුව 85), අපගේ ව්‍යවස්ථාවේ 3 සහ 4 වන ව්‍යවස්ථාවල පැහැදිලි ලෙස දක්වා ඇති මූලධර්මය වන්නේ ව්‍යවස්ථාදායකයේ විවිධ අංගයන් විසින්, විධායකය සහ අධිකරණය මහජනයාට අභ්‍යාස කල යුතු බලයේ භාරකරුවන් වශයෙන් එම කාලයට අදාළව පත් කර ඇති බවය. <u>බුලන්කුලම සහ තවත් තවත් අය - එදිරිව - කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්</u> ට එරෙහිව නඩුවේ (2000 එස්එල්ආර් පී 243) මෙම අධිකරණය විසින් නිරීක්ෂණය කර ඇත්තේ, රජයේ සම්පත් "මහජනතාවගේ සම්පත්" වන බවත් සහ රජයේ අංගයන් "එම සම්පත් රැක ගැනීමට සහ ආරක්ෂා කිරීමට මහජනතාව විසින් පවරා දී ඇති භාරකරුවන්" වන බවත්ය. ( පිටුව 253) එයින් ශ්‍රී ලංකාවේ මහජනතාවගේ වඩාත් හොඳ යහපත තකා විධායකය විසින් නීතියට අනුකූලව සහ ගණන් දිය යුතු බවට, අදාළව ක්‍රියා කරන බවට විශ්වාසනීය බලාපොරොත්තුවක් ඇත. (පිටුව 258)

iii) <u>සෙනරත් - එදිරිව - චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග</u> (එස්සීඑෆ්ආර් 503/3005 – 2007.5.2 දින වාර්තා සටහන්) නඩුවෙහි නිගමනය කර ඇති පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 12(1) ව්‍යවස්ථාවෙන් සහතික වී ඇති "සමානාත්මතාවයට ඇති අයිතිය සඳහා ධනාත්මක අංගයක්" ඇත යනුවෙන් සහ මහජනතාවගේ බලයේ භාරකරුවන් වූ විධායකය, නීතිය සහ රජයේ සම්පත් ආරක්ෂා කිරීම සඳහා වූ පරිපාටි බලාතික්‍රමණ ලෙස අවතක්සේරු කරන ආකාරයෙන් ක්‍රියාකරන විට, එවැනි ක්‍රියාවන් අධිකරණය ඉදිරියේ අයැද සිටීම මහජන යහපත පිණිස වේ.

ඉහත සඳහන් හේතු කරණ කොට ගෙන, මා දරණ මතය වන්නේ, මහජන යහපත සඳහා මෙම නඩුව පැවරීම සම්බන්ධව පෙත්සම්කරුට ප්‍රමාණවත් නීත්‍යානුකූල තත්වයක් පවතින බවත්, සහ රාජ්‍ය සංස්ථාවක් වූ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සම්පූර්ණයෙන් අයත්ව තිබූ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කොටස් 90 % ක් විකිණීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 12(1) ව්‍යවස්ථාව යටතේ සහතික වී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇතැයි සනාථ කර ඇති බවත්ය. අපවාදයට ලක්ව ඇති ගනුදෙනුව සහ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ලිමිටඩ්ට ප්‍රතිලාභ ප්‍රදානය කිරීම මූලික වශයෙන් අදාළ කාලයේදී රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති වශයෙන් කටයුතු කල 8 වන වගඋත්තරකරු වූ පී. බී. ජයසුන්දර විසින් විධායක බලය අත්තනෝමතික ලෙස අභ්‍යාස කිරීමක් වූ බවය.

වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇති විත්තිවාචකය වූ කාලාවරෝධතා අයැදුම අත්‍යවශ්‍යයෙන්ම නිශ්ඵල විය යුතු වන්නේ, අපවාදයට ලක් වූ පැවරීම සාධාරණ සහ විනිවිදභාවය පෙනෙන ආකාරයෙන් නීතිය අනුව සිදු කර නොමැති බැවිනි. පෙත්සම්කරුට වැදගත් ආධාරක ලියවිලි ඔහුට අවතීර්ණ වීමට

නොහැකි ප්‍රභවයන්ගෙන් ලබා ගැනීමට සිදු විය. සැළකිය යුතු සොයා ගැනීම් වලට එළඹීමට හේතු වූ වැදගත් ලේඛන වන පී 36 සහ පී 37 ලබා ගැනීමට හැකිව ඇත්තේ ආයෝජන මණ්ඩලයට අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසුව වන නිසා බව මෙයින් පැහැදිලිව පෙනී යයි.

ඒ අනුව, මම නීත්‍යානුකූල තත්වය සහ කාලාවරෝධය පදනම් කර ගත් එම විරෝධතාවය අධිතීරණය කර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 12(1) ව්‍යවස්ථාවෙන් සහතික වී ඇති මූලික අයිතිවාසිකම් විධායක සහ පරිපාලනමය ක්‍රියාවන් නිසා උල්ලංඝනය වීමක් සිදුව ඇතැයි යන පෙත්සම්කරුගේ පෙත්සමේ ආයාචනයේ (බී) ඡේදයෙහි ඉල්ලා ඇති සහනය ලබා දෙමි.

සාමාන්‍යයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 12(1) ව්‍යවස්ථාවෙන් සහතික වී ඇති මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීමක් සිදුව ඇතැයි ප්‍රදානය කරනු ලබන ප්‍රකාශයක ප්‍රතිඵලය වන්නේ, එය එම සිද්ධියට පෙර පැවති තත්වයේ පිහිටුවීමය. කෙසේ වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 126(4) ව්‍යවස්ථාවෙන් මෙම අධිකරණයට පැවරී ඇති අධිකරණ බලය, සහන ලබා දීමට හෝ එය විසින් සාධාරණ සහ යුක්ති සහගත බවට නිගමනය කරනු ලබන නියමයන් කිරීමට බැවින්, අපවාදයට ලක්ව ඇති විධායක ක්‍රියාවන් විභේදනය කල හැකි දැයි සොයා ගැනීම අධිකරණයට විවෘතව පවතින කටයුත්තකි. පරීක්ෂා කිරීම සොයා ගැනීම් විභාග කොට බැලීමේදී මාගේ අදහස වන්නේ, ජනාධිපති විසින් කොළඹ වරායේ ප්‍රකාශිත සීමා ඇතුලත අක්කර 2 රූඩ් 2 පර්චස් 21.44 ක ඉඩම ප්‍රදානය කිරීම, ප්‍රතිඵලයක් වශයෙන් ගෙවිය යුතු වන බදු සඳහා සහන ලබා දුන් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) ට ආයෝජන මණ්ඩලය විසින් ආයෝජන සහන ප්‍රදානය කිරීම සහ ලංකා වරාය අධිකාරිය සමඟ පොදු භාවිතා කරන්නන්ගේ ගිවිසුමට ඇතුලත් වීම, කොටස් විකිණීමෙන් විභේදනය කල හැකි බවය. ඒ අනුව, මම පෙත්සමේ ආයාචනයේ (ජී), (එච්) සහ 9අයි) ඡේදයන්හි අයැද ඇති සහනයන් ලබා දෙන අතර, පී 31 න් ලබා දී ඇති ජනාධිපති ප්‍රදානය හිස් සහ ශූන්‍ය බවට ප්‍රකාශ කරමි. 18 වන, 19 වන, 20 වන සහ 21 වන වගඋත්තරකරුවන් අද දින සිට එක් මාසයක් ඇතුලත ඉඩමෙන් ඉවත් වී, එහි භුක්තිය ශ්‍රී ලංකා වරාය අධිකාරියට ආපසු භාර දිය යුතුය. 2002.8.20 දිනැති පොදු භාවිතා කරන්නන්ගේ ගිවිසුම (පී 19 (ඒ)) හිස් සහ ශූන්‍ය බවට ප්‍රකාශ කරන අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඉන්ධන සැපයුම් සේවා සිදු කිරීම සඳහා බලපත්‍ර ලබා ගත් පාර්ශවයන් සමඟ සමාන විධිවිධාන මත වරාය ඇතුලත පහසුකම් භාවිතා කිරීම සඳහා අලුත් ගිවිසුම් වලට ඇතුලත් විය හැකිය.

ආයෝජන මණ්ඩලය සහ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) අතර වූ සියලුම ගිවිසුම්, හිස් සහ ශූන්‍ය බවට ප්‍රකාශ කෙරෙන අතර, එකී ගිවිසුම් බලාත්මකව පැවතියේ නැතැයි සළකා සියලුම හිඟ බදු අය කර ගැනීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හට නියම කරනු ලැබේ.

ඉහත සඳහන් කර ඇති නියෝග අභිමුව, ඒ ස්වරූපයෙන්ම කොටස් විකිණීම පිළිබඳව නියෝගයක් කිරීම අවශ්‍ය යයි හෝ සාධාරණ සහ යුක්තිසහගත යයි මම නොසිතමි.

නඩු තීන්දුවේ සොයා ගැනීම් වලින් විදහා දක්වන්නේ, 8 වන වගඋත්තරකාර පී. බී. ජයසුන්දරගේ ක්‍රියාවන් අත්තනෝමතික සහ බලාතික්‍රමණය වූවා පමණක් නොව, අන්‍යොන්‍ය වශයෙන් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) ලිමිටඩ්ට වාසිදායක ලෙස පක්ෂපාතීවී ඇති බවය. ඔහු ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (JKH) හි රත්නායක සමඟ එකතු වී මහජන යහපතට පටහැනි ලෙස එකී සමාගමට නීති විරෝධී වාසි ලබා දීම සඳහා දුස්සන්ධානගතව ක්‍රියා කල බවට වූ පෙත්සම්කරුගේ කියා පෑම ස්ථාපිත වී ඇත. ඒ අනුව, 8 වන වගඋත්තරකරු විසින් වන්දි වශයෙන් රජයට රු. 500,000/- ක් ගෙවිය යුතු යැයි මම නියම කරමි.

18 වන වගඋත්තරකරුගේ සිට 21 වන වගඋත්තරකරු දක්වා වූ වගඋත්තරකරුවන් නඩු ගාස්තු වශයෙන් පෙත්සම්කරුට රු. 250,000/- ක් ගෙවිය යුතුය.

මෙම නඩුවේ පාර්ශවයන් නොවන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ඉහත සඳහන් පරිදි ක්‍රියා කිරීම සඳහා මෙම නඩු තීන්දුවේ පිටපතක් යවන ලෙසට රෙජිස්ට්‍රාර් හට නියම කරනු ලැබේ.

මෙම නඩුවෙහි සියලුම පාර්ශවයන් ඉහත සඳහන් සොයා ගැනීම පදනම් කර ගනිමින් ක්‍රියා කල යුතුය.

අයදුම්පතට අවසර දෙනු ලැබේ.

අත්සන
අගවිනිසුරු

<u>අමරතුංග, විනිසුරු</u>
**මම එකඟ වෙමි.**

අත්සන
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු

<u>බාලපටබැඳි, විනිසුරු</u>
**මම එකඟ වෙමි.**

අත්සන
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු

**සහතික කළ සත්‍ය පිටපතකි**

අත්සන

ඩබ්. ඒ. ප්‍රියානි එස්. පෙරේරා
රෙජිස්ට්‍රාර් 111
ප්‍රධාන ලිපිකරු - උසාවි ශාඛාව
ශ්‍රේෂ්ඨාධිකරණය